

# ප්‍රියා ප්‍රියදර්ශනියා

ශ්‍රී ලංකා ජනාධිපතිණිය
චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග
චරිතාපදානය

සුනිල් මද්දුමගේ

0
දු

14 DEC 2006

# දිරිය දියණිය

ශ්‍රී ලංකා ජනාධිපතිනි,
චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග
චරිතාපදානය

සුනිල් මද්දුමගේ

අප්පමත්තො අයං ගන්ධො
යා'යං තගර චන්දනී
යො ච සීලවතං ගන්ධො
වාති දෙවෙසු උත්තමො (ධම්මපදය)

---

තුවරලා සඳුන් ආදියෙහි යම් සුවඳක්
වේ නම් එය ඉතා සුළුය. සුළු තැනෙක
විහිදෙන්නෙකි. සිල්වතුන් ගේ සිල්
සුවඳ දෙව් ලොව්වල පවා විහිදේ.

---


| ACC. NO. | 2368 |
| --- | --- |
| CLASS NO. | 920 |
| DATE. | |



ප්‍රථම මුද්‍රණය - 1996

කර්තෘ ප්‍රකාශක - සුනිල් මද්දුමගේ

කංචුකය - ස්ටැනී ද සිල්වා

ISBN - 955 - 95541 - 5 - 8

---

මුද්‍රණය - සේසත මුද්‍රණාලය, බත්තරමුල්ල



ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

# පූජාව .....

සුවිසල් මාළිගාවක
සුරසැප විඳින ........
කපු පුළුන් ඇතිරූ
යහනක සමවදින
මිනිස්කම මුදාහැර
වරිගයම නොතකන
අතීතය වළලන
නොමැරෙන මිනිසුනේ .......!
ඔබට නොවැ .........

කැත්තට - උදැල්ලට
දහබිඳු වගුරුවන
බඩසයින් මිලිනව
හෙටක් ගැන සිතන
මිනිස්කම පුද කරන
යුග මෙහෙවරට කැපවුන
දේශයේ නාමයෙන්
ජීවිතය පුදකරන

සබඳ ......! නුඹ වෙත
මේ ගත සෙනෙහසින්
කරමි පූජා ...........

# පෙර කළ නිමැවුම්

## නාට්‍ය
- බඹසර
- රජසමයම
- තුරුම්පුව
- අමරපදං
- දිසාපාමොක්
- වක්ගුඩු
- අග්‍රපොරෝහිත
- බිංදුදෙක
- සිව්මංසල
- සිපිරිගෙය
- විශාලානුවර

## කාව්‍ය ග්‍රන්ථ
- පුබුදු පැදි (කාව්‍ය නිර්මාන දායකත්වය)
- පොසොන් සුවඳ (සංස්කාරක)
- කොවුල් ගීතය (සංස්කාරක)
- ශක්තියෙ පුෂ්පය
- නිම්නය (මුද්‍රණයේ)

## ශාස්ත්‍රීය ග්‍රන්ථ
- පෙරතතු (හින්දුස්ථාන සංගීතය)
- පෙර අපර දෙදිග සංගීතවේදීන්, අපරදිග සංගීත නිර්මාන, සංගීත භාණ්ඩ සහ ඉතිහාසය

## ළමා කථා (සම්මාන දිනූ ග්‍රන්ථ)
- චූටි පැටියා

## ඖෂධ පිළිබඳ ග්‍රන්ථ
- ඔසු කැඳ - ඔසු පැන්

## චිත්‍රපට තිර රචනය
- පුංචි හාමු

## බෞද්ධ නාට්‍ය
- නිවන් දොරට පහන් සිලක්
- නොසිඳෙන ආශා
- සුරලොව අණසක
- චාපා
- දසර වසන තුරු

## ටෙලි වෘතාන්ත
- පහන් කන්ද
- පුංචි පුංචි මල්

# පෙරවදන

සමාජ මෙහෙවර සඳහා කැපවූවන්ගේ ජීවිතවලින් අපට උගතහැකි පාඩම් බොහෝය. ඔවුන් විඳින අනේකවිධ දුක්ඛ දෝමනස්සයන් සමාජයෙහි හිතසුව පිණිස වීම ඊට හේතුවයි.

දහසක් අඩුලුහුඩු කම්වලින් සපිරි අපට ඒවා මගහරවාගනු පිණිස ගමන් මග එළිපෙහෙළි කරනු ලබන්නේ එවැන්නන්ගේ අත්දැකීම්ය.

චන්ද්‍රිකා බංඩාරණායක කුමාරතුංග ජනපතිතුමිය සැබවින්ම 'දිරිය දියණියකි'. ඇය ජනතා මෙහෙවර සඳහා ඇප කැප වූයේ බොහෝ දෑ කැපකරමිනි. බොහෝ සුඛ විහරණ පසෙකලමිනි. ඇගේ ජනපති පදවි ප්‍රාප්තිය එක් ක්‍රියාවක ප්‍රතිඵලයක් නොව කාලාන්තරයක් පුරා ගලා ආ ක්‍රියාදාමයක ප්‍රතිඵලයකි. එබැවින්ම ඇගේ ජීවන තොරතුරු සහ ගමන් මග අපට නොව මතු පරපුරටද එකසේ වැඩදායක වන බව මෙහිලා සඳහන් කල යුතුය.

'දිරිය දියණිය' ග්‍රන්ථය ජනපතිතුමියගේ තොරතුරු වලින් පමණක් නොව ඊට සම්බන්ධ වෙනත් වැදගත් කරුණුවලින්ද පෝෂිතය. දේශපාලන ඉතිහාසය හදාරන අයට මෙයින් දැන උගතහැකි දෑ බොහෝය. එහෙයින්ම මෙවැනි ග්‍රන්ථයක් එළි දැක්වීම පිළිබඳව සුනිල් මද්දුමගේ වෙත අපගේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මාධ්‍යයන් රැසක් හා සම්බන්ධ සුනිල් මද්දුමගේට මෙවැනි වැදගත් පතපොත පලකරන්නට දිරිය සහ සවිය පතමි.

බණ්ඩාර ඇහැලියගොඩ

291/4
ශ්‍රී සුදර්ශන මාවත
මාලබේ.
96.01.21

# දිරිය දියණිය ග්‍රන්ථය පිළිබඳව

චරිත කථාව වූ කලී නිරන්තරයෙන්ම විවිධ ග්‍රන්ථ අතර සුවිශේෂත්වයකට තුඩු දෙන්නකි. චරිත කථාවකින් ලැබෙන ආදර්ශය සමාජ ප්‍රගතියට හේතුවනවා මෙන්ම එකී චරිතාපදානයන් හැදෙන පරපුර අත තැබීම හැදූන පරපුරේ යුතුකම මෙන්ම වගකීම ද වනු ඇත.

බොහෝ දෙනා තම ජීවිතය ගොඩ නගා ගන්නේ උත්සාහයෙන් හා අධිෂ්ඨානයෙන් යුතුවය. එවැනි චරිත තුල ආදර්ශය පිරි ඇත.

ශ්‍රී ලංකා ජනාධිපතිනි ගරු චන්ද්‍රිකා බංඩාරණායක කුමාරතුංග මැතිනියද සිය ජීවිත කාලයම මහජනතාව සමඟ ජීවත් වෙමින් ඔවුන්ගේ දුක සැප සමව බෙදා හදා ගනිමින් රට දැයට අමිල මෙහෙවරක් සිදු කරන ශ්‍රේෂ්ඨ ජන නායිකාවකි.

මෙතුමියගේ ජීවිතයේ ඇති සුවිශේෂ වූ සිද්ධීන් ඉතා සුපරික්ෂාකාරිව තෝරා බේරා 'දිරිය දියණිය' නමින් ගතක් රචනා කිරිමට සුනිල් මද්දුමගේ මහතා ගත් වෙහෙස ස්වාධීන ලේඛකයකු සතු කාර්ය භාරයක් සේ මම අගයමි.

**නීතිඥ එස්. චන්ද්‍රා සිල්වා**

සභාපති,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නගර සභාව
1996 - 01 - 12.

# පිළිසඳර

අභියෝග, ඝට්ටන, හැලහැප්පීම් හා බාධක අභිබවා ලබාගත් අත්දැකීම් පාදකකොට නිරතුරුවම ලැබූ පන්නරයෙන් දුක් විඳින ජනතාවගේ කඳුළු පිසදමා ඔවුන් පැතූ ලෝකයට භීෂණයේ ඝන කළුවර මැදින් සැබෑ ලෝකයේ හුළු එළිය දල්වා ඔවුන්ගේ අතැඟිලි අල්ලා රැගෙන යන්නට දිරිය ලැබූ ලක්මවගේ ශ්‍රේෂ්ඨ විරෝදාර දියණියක් වූ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ අඩ සියවසකට ආසන්න ජීවන තොරතුරු ජනාධිපති පදවි ප්‍රාප්ත වීම දක්වා මෙම ගතෙහි අන්තර්ගතයට කොටු කළෙමි. ඒ නිසාම ඇයගේ ජීවන චිත ගොත සපිරි මෙම ගත 'දිරිය දියණිය' නම් ලැබුවාය.

මෙවැනි උදාර චරිත තුළ ආදර්ශය පිරි ඉතිරී ඇත. මිනිස්කම මොටවූන ජීවිතයේ සැබෑ යථාර්තය මෙවැනි චරිත තුළින් පිටාර ගලති. අනූව දශකය තුළ මහජනතාවගේ අසීමිත ආදරයට, ගෞරවයට හා විශ්වාසයට පාත්‍රවුණු එතුමිය ජනතා වරමින් ශ්‍රී ලංකාවේ දසවැනි පාර්ලිමේන්තුවේ 11 වැනි අග්‍රාමාත්‍ය ධූරය හා ලංකාවේ දෙවැනි කාන්තා අග්‍රාමාත්‍යවරිය ලෙසත් පළමුවන කාන්තා ජනාධිපතිනිය ලෙසත් අභිෂේක ලැබුවාය.

ඒ උදාර චරිතාපදානය හැදෙන පරපුර අත තැබීම, හැදුණු පරපුරේ කාර්ය භාර්යක් ලෙසින් ලේඛකයකු සතු යුග මෙහෙවරක් නිමා කරනු දැක්මෙන් මෙම ගත සැකසූයෙමි.

එතුමියගේ ජීවිතය පිළිබඳව පළවුණු පුවත් පත් - ලිපි - සඟරා හා දේශන ආදියට කොටු වී එතුලින් ලත් ආභාෂයෙන් ලබාගත් අත් දැකීම් සම්භාරය මෙම ගත නිබන්ධනයට අත්වැලක් විය.

කාන්තා වර්ගයටම අති නිර්මල පරමාදර්ශකයක් වූ එතුමියගේ ශ්‍රේෂ්ඨ චරිතාපදානය ලක් ධරණීතලයේම දුක් විඳින ජනතාවගේ හදවත් ගැබතුළ ජීවන ගීතයක් වනු ඇත.

**සුනිල් මද්දුමගේ**

977/2, ශිල්පකලා ශාලිකා රංග නිකේතනය
තලංගම-දකුණ, බත්තරමුල්ල.
1996 පෙබරවාරි 02.

# සිරස්තල


- පොදුජන පැතුමක පෙර නිමිති . . . . . . . . . . 9 - 15
- ළමාවිය හා පාසල් සමය . . . . . . . . . . . 16 - 19
- යුග දිවියට පා තැබීම . . . . . . . . . . . . . . . 20 - 22
- කඳුළින් ලැබූ පත්නරය . . . . . . . . . . . . . . 23 - 26
- වෘත්තිය සේවය . . . . . . . . . . . . . . . . . . 27 - 29
- දේශපාලන ගමන් මග . . . . . . . . . . . . . . . 30 - 34
- කෙටිකාලීන ජනතා සේවය . . . . . . . . . . . 35 - 37
- මැතිවරණය ජය ගැනීම . . . . . . . . . . . . . 38 - 44
- චන්ද්‍රිකා යුගයේ ආරම්භය . . . . . . . . . . . . 45 - 48
- මැතිවරණ ගමන් මග . . . . . . . . . . . . . . 49 - 56
- ශ්‍රී ලංකා පාර්ලිමේන්තු ඉතිහාසයේ කාන්තා ගමන් මග . . . . . . . . . 57 - 65
- පවුල් තුළින් ඔප් නැංවෙන දෙරටක පොදු සබඳතා 66 - 70
- අගමැති වරම් ලැබීම . . . . . . . . . . . . . . . 71 - 79
- සාමය, සමාදානය, සදාචාරය, සමෘද්ධිය වෙනුවෙන් කැපකළ ජන වරම . . . . . . . . . 80 - 82
- ශ්‍රී ලංකාවේ සිව්වන ජනාධිපති පදවිප්‍රාප්තවීමට වරම් ලද 'දිරිය දියණිය' . . . . . . 83 - 91
- යාපා පටුනට - සාමය උදාකරන්නට නායකත්වය දුන් 'සෙන්පතිනිය'. . . 92 - 99
- චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ ජීවිතයේ සිහිවටන . . . . . . . . . 100 - 103

# පොදු ජන පැතුමක පෙර නිමිති

ඉතිහාසය දෙස විමසිලිමත්ව ආපසු හැරී බලන්නෙකුට එදා-මෙදාතුර ශ්‍රී ලංකාවේ පාලන තන්ත්‍රයට ප්‍රවිෂ්ඨ වූ නායක නායිකාවන් අතර චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය දුර්ලභ ගණයේ වාසනාව දෝතින් ගත් සිංහල වංශ කතාවේ රනින් ලියැවෙන කාන්තාවක සේ ගිනිය හැක. ඉතිහාසය ඔපවත් වනුයේ අරුණෝදයට පෙර අවදි වූවන් ගෙනි. කවියා නිර්මාණශීලීත්වයේ පහන් වැඹක් වන්නා සේම, නායකයා ස්වකීය පෞරුෂත්වයෙන් හා උසස් ගුණ දහමින් පරිපූර්ණ වෙයි. හැම හදවතකම දුක් ගිනි පිස දැමීමට අධිෂ්ඨාන ශක්තිය තම චිත්තනය තුළ රෝපනය කරමින් විසඳුම් හා පිළියම් යෙදීම, ජනතා සුභ සිද්ධියටම තම ජීවිතය කැප කිරීම, ජනතා නායකත්වයේ සුවිශේෂ ලක්ෂණයකි.

අභියෝග, ඝට්ටන, හැලහැප්පීම්, බාධක තුළින් ජනතාවගේ අදහස් තෝරා බේරා ගනිමින්, නව තාක්ෂණය ද මිනිස් ජීවිතයට සරිලන ආකාරයෙන් යොදවා ගනිමින්, ස්වකීය ප්‍රතිභා මහිමයෙන් තම සහයන් මෙහෙයවා මහජන චින්තනය තම හදවතට සමීප කරගන්නට, පොදුජන බලාපොරොත්තුව සපුරාලන්නට චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියද ඉතිහාසය තුළට ප්‍රවිෂ්ඨ වීමේ පළමු පියවර තැබුවේ මහජනතාවගේ වරමිනි.

ලාංකේය දේශපාලනයේ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය පිළිබඳව හුදී ජනයාගේ මෙන්ම දෙස් - විදෙස් දේශපාලන විචාරකයින්ගේ සුවිශේෂ සාකච්ඡාවට ලක්වීම අරුමයක් නොවන්නේ බහ තෝරන වියේ සිට දේශපාලනය ඇයට තෝතැන්නක් වූ බැවිනි.

17 වසරක ඒකාකාරී පාලනයකට කොටුව, හෙම්බත්ව සිටි ජනතාව නව වෙනසක් බලාපොරොත්තු වූ වකවානුවක මානව දයාව ගරා වැටී අමිනිස්කම රජ කළ දේශයක් ඉන් මුදා ගැනීමේ පරම පවිත්‍ර චේතනාව මුදුන් පමුණුවා එකී කාර්ය භාර්යයේ වගකීම චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග නම් වූ ජන නායිකාවට ජනතාව විසින් බාර දී ඇත. බලය සිඳී පරාජයෙන් දුර්මුඛ වූ පක්ෂයකට නැවත ජීවය කවා, නිදිගත් ජනතාව උයි

ගන්වා දේශයේ මානව අයිතීන් සුරකින්නට ඇ ගත් වෙහෙස හා අප්‍රතිහත ධෛර්යය මිල කළ නොහැකි තරම් ය.

දැන් අපේ මව් බිමට තිරසාර නායකත්වයක් ඇත. ජනතා සිතුම් පැතුම් අතර ජනතා නායකත්වයක් පිළිබඳ වූ සිහිනය සැබෑවී ඇත. ආණ්ඩුවක් තිබුණද, පාලක පක්ෂයක් සිටියද, ප්‍රබල තිරසාර නායකත්වයක් නොමැති කමින් රටේ සදාචාර ගුණදහම් වැනැසී අමිනිස් ගති මෝදු වී අවනීතිය රජවුණ යුගයක නිමාව දැකීම ජනතාවගේ අපේක්ෂාව වූහ.

නිරන්තරයෙන් මහජනතාව සමග එකට ඇලී ගැලී එකට ජීවත් වෙමින් මිනිස් කම හඳුනා ගෙන ඔවුන්ගේ ඕනෑ එපාකම් පිළිබඳව මුහුකුරා ගිය හසල බුද්ධියකින් හෙබි නායකත්වයකට ඇය පත්වූයේ මව්පිය උරුමයෙන් ලද ආභාෂයට වඩා නිරන්තර කැපවීමෙන්, වැඩ කිරීමෙන්, ක්‍රියා ශීලීත්වයෙන් ලද ජීවිත අත්දැකීම් තුළිනි.

භාරත ජනතාවගේ පූජ්‍ය සම්මානයට පාත්‍ර වූ මහත්මා ගාන්ධිගේ චින්තනය, පෞරුෂය, සමෘද්ධිමත් දේශයක් පැතූ යුග මෙහෙවරක ශ්‍රී නේරුගේ චින්තනයට ඉදුරාම වෙනස් බව පළකර ඇත.

දූරදර්ශී නායකත්වයෙන් හා දේශපාලනයෙන් පන්නරය ලද ඉන්දිරා ගාන්ධි තම පියාණන්ගේ ප්‍රතාපයෙන් හා පෞරුෂයෙන් ද, සිය මෑණියන්ගේ ගුණගරුක භාවයෙන්ද ආභාෂය ලද්දේ බහ තෝරන වියේ සිටය.

චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියද මෙයට සමකළ හැකිය. ඇය දේශපාලනයට පිවිසියේ ජන්ම උරුමයෙන් බව අතිශයෝක්තියක් නොවූවත් තම දෙමව්පියන් ශ්‍රී ලංකාවේ අගමැති පුටුවට පත්වී සිටි නිසාවත් ඇය සමාජයේ ඉහළම හිණි පෙත්තට මහජනතාව ඔසොවා තැබූවා නොවේ. ඇගේ කැපවීම, මහජනතාවට සමීපවීම හා විචක්ෂණභාවයද, මුහුකුරා ගිය නායකත්ව ලක්ෂණද මහජනතාව තේරුම් ගත් හෙයිනි.

කටේ කිරි සුවඳ මැකී යනවාත් සමගම බහ තෝරන වියේ සිට ඇයට ජනතාව සමග සමීප වීමේ භාග්‍යය තම දෙමව්පියන්ගේ උණුසුමෙන් උරුම වූවෙකි. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම, ජනාවාස කොමිසම යන කොමිසන් තුළින් වැඩ කරන ජනතාව සමග එක්ව සේවය කළ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග

මැතිනිය ජනතාවගේ ඕනෑඑපාකම් මැනවින් තේරුම් ගන්නටත්, ඔවුන්ගේ දුක්ගැනවිලිවලට තිරතුරුවම සවන් දෙන්නටත්, එකී ප්‍රශ්නවලට පිළියම් හා විසඳුම් යොදන්නටත්, දුකේදීත් සැපේදීත් ඔවුන් හා එක්ව කටයුතු කරන්නටත්, කාරුණික වූ හදවතක් සිය ජන්ම ලාභයෙන්ම ඇය උරුම කරගෙන ඇත්තේ ජනතාවගේ පිනටය.

සිරිමා බණ්ඩාරනායක මැතිනිය වන තම මවගේ ප්‍රජා අයිතිය අහෝසි කළ වකවානුවේ ඊට එරෙහිව කෙරුණු උද්ඝෝෂණ ව්‍යාපාරයේ පුරෝගාමීව කටයුතු කළ ඇය මීට දශකයකට පෙර 80 දශකයේ මුලාරම්භයේදී පක්ෂ සංවිධාන කටයුතුවලට සිය කාලය මිඩංගු කර මව්බිමේ තිරසාර පොදු ජන නායකත්වයක් ගොඩ නහා සෞභාග්‍යමත් දේශයක් ගොඩ නැංවීම කෙරෙහි අවල භක්තියෙන් කළ ප්‍රාර්ථනය අද මල්පල ගැන්වී ඇත.

පීඩනයෙන් - අසාධාරණයෙන් හා දරිද්‍රතාවයෙන් දුක් විඳින ජනතාව මුදා ගැනීමට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඇප කැපවී සිටින බවත් 85% පමණ ලාංකීය පීඩිත ජනතාවගේ ජීවන මං පෙත නහා ලීමට අප පක්ෂය බොහෝ ප්‍රගතිශීලි කොටස් සමඟ සමගි සමාදානයකට එළඹ සිටීමට ඇති අපේක්ෂාවත් ඉදිරියේ දී ඉතා ඉක්මනින් මැතිවරණයකට මුහුණදී ජනතාව පීඩනයෙන් මුදා ගැනීමට බලාපොරොත්තු වන බවත්, ඇය මීට දශකයකට පෙරාතුව කළ අනාවරණය මල්පල ගැන්වී ඇත්තේ හුදෙක්ම සත්‍යය සියල්ලන්ගෙන්ම ජයගනී යන වදනට නව අරුතක් එක්කරමිනි.

ප්‍රගතිශීලි ආණ්ඩු කිපයක්ම, විප්ලවයකින් තොරව ලෝකයේ පිහිටුවා ඇති බවත්. ප්‍රජාතන්ත්‍රවාදී පිළිවෙතට මුල්තැන දෙමින්, ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කරමින්, ආත්ම පරිත්‍යාගයකින්, කැපවීමකින් කටයුතු කරමින්, ජනතාවගේ දුක් ගින්දර නිවා ඔවුන්ගේ දෑස්වල රුරා හැලෙන දුක් කඳුළු පිස දැමීමට බලලෝභීව ක්‍රියා නොකරන කෙනෙකු බණ්ඩාරනායක අගමැතිතුමාගේ දරුවන් අතර සිටින බව ශ්‍රී ලංකාවට පමණක් නොව මුළු මහත් ලෝකයටම සනාථ කිරීමට ඇය තුළ ඇති බලාපොරොත්තුව පිළිබඳ අනාවරණය කරන්නට ඇය ප්‍රකාශ කළ හැම වාග් මාලාවකම අන්තර්ගතයේ නිදන්ගතව තිබිණි.

බංකොලොත් දේශපාලන හා ආර්ථික සැලසුම්වලින් ජනතාවගේ ප්‍රශ්න විසඳිය නොහැකි බවත්, ආර්ථික උද්ධමනයෙන් පීඩිතව අසරණවූ ජනතාව ජීවත්වීම සඳහා ගෙන යන අරගලය දිනෙන් දින උග්‍රවන බවත් ඉදිරිය ජය ගැනීමට ජනතාවගේ දුක දත් තිරසර නායකත්වයක් අවශ්‍ය බවත්, ඒ සඳහා වැඩදායී විකල්ප තුළින් ජනතාවගේ ප්‍රශ්නවලට විසඳුම් සෙවීමට අප දැනටමත් ක්‍රියාත්මකව සිටින බව පවසමින් ජනතාවගේ විශ්වාසය දිනාගෙන ජනතාව අවදිකිරීමට ඇය පොහොසත් වූයේ ඇයගේ විරෝදාර නායකත්වය තුළිනි.

ජනතාව වෙනුවෙන් කැපවුණු පාලන යුගයක ජනතාව පාගා ඔවුන්ගේ ජන ජීවිතය සූරා කන, ඔවුන්ගේ දේපළ අනිසි ආකාරයෙන් පරිහරණය කරන අසාධාරණ නීති - රීති, ප්‍රශ්න නොවන බවත්, අවශ්‍ය විටකදී ජනතාවගේ සුබ සිද්ධිය තකා ඒවා ප්‍රතික්ෂේප කර සංශෝධනය කරන්න වුවත් කටයුතු කළහැකි බව 1981-11-01 ඉරිදා පුවත් සංග්‍රහයකට ඇය පවසා ඇත. මෙයින් සනාථ වන්නේද ජනතා සේවයට ඇයගේ සම්ප්‍රාප්තිය අද ඊයේක නොවූ බවය.

ජේ. ආර්. ජයවර්ධන මහතා හා කොබ්බෑකඩුව මහතා අතර වූ ජනාධිපති සටනේදී තම පක්ෂය වෙනුවෙන් විජය කුමාරතුංග මහතා සමග එක්ව පුරෝගාමී කාර්ය භාර්යක් ඉටුකරන ලද්දේද චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය විසිනි.

අති නිර්මල පාරිශුද්ධ චේතනාවන් තම හදවතට තුරුළු කරගනිමින් පීඩිත ජනතාවගේ හද ගැබ තුළ ජීවමානව වෙසෙන මැය ජාත්‍යන්තර දේශපාලන දැනුමෙන් ද පරිපූර්ණ වූවාය. ඇගේ නිර්මාණාත්මක, කැපී පෙනෙන නෙත් - සිත් අලවන අවිහිංසාවාදී වැඩ රටාව අදීනභාවය හා තන්වැසි නුවණ ඇය පසු පස ගමන් කරන හෙවණැල්ලක් බඳුය.

පසුගිය රාජ්‍ය පාලන තන්ත්‍රයේ සිදු වූ හැල හැප්පීම්, උතුරු - නැගෙනහිර අරගලය හේතුකොට විදේශීය ප්‍රතිපත්තිය අවුල් වී අසල්වැසි රටවල් සමග නොයෙක් විට නොහොඳ නෝක්කඩු ඇති වූ බවද නොරහසකි. චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ චින්තනය අගය කරමින් දෙරට අතර ඉතා සුහද සබඳතා පවත්වා ගැනීමට හැකි බව තමාගේ ඒකායන

විශ්වාසය බව ඉන්දීය අගමැති නරසිංහ රාඕ මහතා විසින් පවසා ඇත.

ජනතා හිතසුව පිණිසම ජනතා වරමින් බිහි වූ ජනතා රජයක ඇවැසි තිරසර නායකත්වයක් චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග යුගයෙන් පරිපූර්ණ විය. එවැනි යුගයක් හා සබැඳි දේශපාලන පෞරුෂය අර්ථවත් සමාජ පෙරළියකට මං පෙත් සාදනු නිසැක වන්නාසේම එය යුගයේ අවශ්‍යතාවයකි.

පුද්ගලයකුට මෙන්ම සමාජයකටද, පොදුවේ රටකටද ගරුත්වයක් හා කීර්ති නාමයක් තිබීම සමාජ සාරධර්මයකි. අපේ දේශයේ කීර්තිනාමය හා ඉදිරි ගමන නව පාලනයේ පෞරුෂය මත රඳා පවතින්නකි.

ජන සංනිවේදන මාධ්‍යයන් ලොව පුරා ප්‍රබලව ඇති යුගයක දේශීය නායකත්වයක් නොව විශ්ව නායකත්වයක් ගැන සිතන තරම් දුරට මිනිස් චින්තනය තාක්ෂණික යුගය කරා පිය මං කර ඇත. මුළු ලොවම එකට අත්වැල් බැඳගත් යුගයකට සම්ප්‍රාප්තිය කෙමෙන් කෙමෙන් වර්ධනය වී අද පවතින යුගයට පත් වන්නට පෙරුම් පිරුවේ අද ඊයෙක නොව මිනිසා විශ්වය ගැන සිතන්නට පෙරුම් පිරූ දා සිටය. අද එම සිහිනය සැබෑවී ඇත.

සමකාලීන ලෝක නායකත්වයක් කෙරෙහි 1982 දී ඇමරිකා එක්සත් ජනපදයෙහි හිටපු රාජ්‍ය ලේකම් ක්ලිෆඩ් මහතා විසින් රූස්වෙල්ට්, ට්‍රූමන්, ඩිගෝල්, අයිසන් හවර්, කෙනඩි, ජොන්සන් ආදී ලෝක නායකයින් ගැන මහ ඉහළින් සඳහන් කර ඇතත්, සුවිශේෂ නායකත්ව ලක්ෂණ පහළ කල මාවෝ, කැස්ත්‍රෝ, ක්ලින්ටන්, ටිටෝ, ගොර්බචොෆ්, ආදීන්ගේ නම්ද ඉතිහාසයට එක්වීම අරුමයක් නොවේ. චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ජන නායිකාවගේ යුගයද ඉතිහාසයට එක්වීමට ඇති ඉඩකඩ අසීමිතය.

නායකත්වය නිරතුරුවම යුගයේ අවශ්‍යතාවයන්ට අනුකූලව, මහජන චින්තනයට පසුබිම්ව, ඔවුන්ගේ ඕනෑ එපාකම් අනුව සමාජ අවශ්‍යතාවයන්ට සැසඳෙන අයුරින් බිහිවන්නක් විනා හුදෙක් පුද්ගල චර්යාවක් නොවන්නේය. ඉතිහාසය දෙස ආපසු හැරී බැලීමෙන් එය සැබවින්ම පැහැදිලිය. යුගයේ අවශ්‍යතාවයන්ට අනුව යුග මෙහෙවරක නියැලීමෙන් නායකත්වය තුළින් මෙතෙක්

ආ දිගු ගමනක් තුළ නොයෙක් වෙනස්කම් විපර්‍යාස ඝට්ටන හා හැලහැප්පීම් ඇතිවී තිබීම, විවිධත්වයට පත්වීම සනාතන ධර්මතාවයකි.

දීර්ඝ කාලයක් තුළ මුහුණ පෑ සියලු කරදර කම්කටොලු අභියෝගවලට දැඩි ආත්ම ශක්තියකින්, අධිෂ්ඨානයකින් මුහුණ දීමට සෘජු ආත්ම ශක්තිය තිබූ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ජන නායිකාව තමා හමුවට එන ඕනෑම බලවේගයකට, ඕනෑම ප්‍රශ්නයකට නොබියව මුහුණ දුන්නාය. පැන නැඟුණු ප්‍රශ්නයන්ට ක්ෂණික විසඳුම් හා පිළියම් යෙදීම පොදුජන නායකත්වයේ ලක්ෂණයකි. සිය අනුගාමිකයන්ගේ හොඳ හිත දිනා ගැනීමටද, ඕනෑඑපාකම්, දුකට - සැපට එකසේ පිහිටවීම අතින්ද එතුමියට සමීපවීමට තරම් තවත් දේශපාලනඥයෙකු ජන නායකයෙකු නැති තරම්ය.

සෘජු දේශපාලන උරුමයන් හා සම්බන්ධයක් පැවතුන අත්තනගල්ල - කටාන - මහර - මීත්තේරිය වැනි ප්‍රදේශවල මෙන්ම ලංකාවේ සෑම ප්‍රදේශයකම දස දහස් ගණන් පෞද්ගලික හිතවතුන් - හිතවතියන් සිටීම මෙතුමිය ලැබූ පූර්ව වාසනාවකි.

උස් - පහත් - ජාති - ආගම් - කුල බේද නොසලකා හැම ජන කොටසක්ම මෙතුමිය වටා රොක් විය. ඔවුන්ගේ සිත් දිනා ගත්තේ නිරන්තරයෙන්ම ජන්ම ලාභයෙන් මෙතුමිය උරුම කරගත් සෘජු උතුම් ගති ගුණ නිසා යැයි පැවසීම අතිශයෝක්තියක් නොවේ.

තමා හමුවීමට නිරන්තරයෙන්ම විවිධ ප්‍රදේශවලින් අනුගාමිකයන් පැමිණීම සිරිතකි. තමා නිවසේ නොමැති විටෙක පැමිණෙන අමුත්තන්ට තමා පැමිණි කාරණය සටහන් කර තැබීමට වෙනම පොතක් චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ නිවසේ තබා ඇත. තමන් පැමිණි කාරණය එම පොතේ සටහන් තබා එයට පිළියම් හා විසඳුම් ලබා ගන්නට හුරුව සිටි කොටසක් ද සිටියෝය.

තමන්ගේ ජීවිතය විනාශ කිරීමට පවා තර්ජන - ගර්ජන එල්ලවද්දී ඒවා කිසිවක් නොතකමින් ඉදිරියටම ගිය ඇය ප්‍රතිවාදීන්ගේ අභියෝග ඉදිරියේ නොසැලී, නොපැකිල ජනතා රැලි නියෝජනය කරමින් 94 මහා මැතිවරණයේ ජය තහවුරු

කිරීමට පෙළඹීම ඇගේ පෞරුෂය හා දේශපාලන දිවිය පැහැදිලි කරන ජන නායකත්වයට උරුම කරුම කියූ ප්‍රදීපස්ථම්බයක් විය.

තමා වෙත පැවරෙන කවර කාර්යයක් හෝ අවසානය දක්වා ඉටුකරලීමේ උදාර චේතනාවන් හා පෞරුෂත්වයක් ඇයගේ ජීවිතය පුරා සුවඳවත්ව, විකසිතව ඇත. එය අප ලබන ජීවිත යථාර්තය වන්නේය.

පුවත් පත් කලාව - සංගීතය - නැටුම් කලාව පිළිබඳවත් පරිනත බුද්ධියකින් හෙබි මෙතුමිය ඒ වෙනුවෙන් කුශලතා පූර්ණ ශක්තිය තම ජීවියේ අතීත සිදුවීම් තුළින් එළිදක්වා ඇත.

පක්ෂ 11 කින් පොදු සංවිධානයකට එළඹ 17 වසරක් රජකළ බලගතු ආණ්ඩුවක් පෙරලා මහජනතාවට අවැසි මහජන රජයක් මහජනතාවගේ වරමින් පිහිටුවීමට රටේ සියළුම ජනතාව සමඟ එක්ව කඳවුරු බැඳගත් ඇය බුද්ධිමතුන්, උගතුන්, ජනමාධ්‍යවේදීන්, කලාකරුවන්, ගුරුවරුන්, ලිපිකරුවන්, රජයේ සේවකයින්, ගොවීන්, කම්කරුවන් වශයෙන් එදා බණ්ඩාරනායක යුගයේ හඳුන්වනු ලැබූ සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරු යන පංච මහාබලවේගයම අයුක්තියට - අසාධාරණයට එරෙහිව යුක්තිය - සාධාරණත්වය යළි ශ්‍රී ලංකාව තුළ ප්‍රතිෂ්ඨාපනය කිරීමට, එකම ධජයක් යටතට ඒකරාශී කරන්නට ඇයගේ යුග මෙහෙවර ශ්‍රී ලංකා ඉතිහාසයේ රනින් ලියවෙන්නාසේම පොදු ජන හදවත් ගැබතුළ සදාතනිකවම තැන්පත්ව ඇත.

# ළමා විය හා පාසල් සමය

1945 ජූනි 29 වැනිදා කොළඹදී උපත ලැබූ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ පියා වූයේ දිවංගත සොලමන් වෙස්ට් රිජ්වේ ඩයස් බණ්ඩාරනායක ශ්‍රීමතාණන්ය. මෙතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නිර්මාතෘ වරයාණෝය. 1956 සිට 1959 වසර තෙක් ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍ය ධූරය හෙබ වූ මෙතුමා 1959 සැප්: 25 වැනිදා ඝාතකයෙකුගේ වෙඩි පහරට ලක්ව දිවංගත විය. ඇයට මෑණියන් වූයේ ලෝකයේ ප්‍රථම අගමැතිනිය වීමේ වරම් ලත් සිරිමා ආර්. ඩී. බණ්ඩාරනායක මැතිනියයි. මෙතුමිය 1960 සිට 1965 දක්වාද, 1970 සිට 1977 දක්වා ද, ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍යවරිය වශයෙන් කටයුතු කළාය. ඇයගේ මිත්තනිය වූයේ අධිරාජ්‍ය යුගයේ ලංකාවේ කාන්තා ඡන්ද බලය ලබා ගැනීමට කළ අරගලයේ පුරෝගාමී කාන්තාව වූ ඩේසි ඇසිලින් බණ්ඩාරනායක මැතිනියයි. බණ්ඩාරනායක පවුලේ වැඩිමලා වූයේ සුනේත්‍රා බණ්ඩාරනායකය. චන්ද්‍රිකා බණ්ඩාරනායක මද්දුම දෝණිය වශයෙන් කුඩා අවදියේ පටන් ඥාති හිතවතුන්ගේ ආදරයට හා ගෞරවයට පාත්‍ර වූවාය. අනුර බණ්ඩාරනායක මහතා පවුලේ බාලම සහෝදරයා විය. කටේ කිරි සුවඳ මැකී යනවාත් සමගම සිය පියා වූ දිවංගත එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මැතිඳුන්ගේ හා සිය මව වූ සිරිමා ආර්. ඩී. බණ්ඩාරනායක මැතිනියගේ උකුලේ නැලවෙමින් දේශපාලනයේ "අ" යනු "ආ" යනු කියැවූයේ තම දෙමව්පියන්ගෙන් ලද උරුමයට හිමිකම් කියමිනි.

කොළඹ ශාන්ත බ්‍රිජට් කන්‍යාරාමයෙන් අකුරු කරවූ ඇය ප්‍රාථමික හා ද්විතීය අධ්‍යාපනය ලබමින් අ.පො.ස. සාමාන්‍ය පෙළ හා උසස් පෙළ සමත් වූයේද එම විදුහලෙනි. අගනුවර විනය ගරුක පාසල් අතරින් සුවිශාල මෙහෙයක් ඉටුකරන ශාන්ත බ්‍රිජට් කන්‍යාරාමයේ එවක කැපී පෙනුන ශිෂ්‍යාවක් වූ ඇය ගුරුවරුන්ගේ සිත දිනා ගෙන ඔවුන්ට කීකරුව දක්ෂ ශිෂ්‍යාවක වශයෙන් කටයුතු කර ඇත. විදුහලේ පැවති සාහිත්‍ය සංගම්

නියෝජනය කරමින් දක්ෂ කථිකත්වයකින් හෙබි ඇය කලාවට ඇල්මක් හා ලැදියාවක් දක්වන්නට වූයේ අද ඊයෙක නොව පාසල් සමයේ විදු පියස තුළිනි.

නීති උපාධිය හැදෑරූ චන්ද්‍රිකා බණ්ඩාරනායක ප්‍රංශයේ පැරිස් නුවර සෝබෝන් විශ්ව විද්‍යාලයේ දේශපාලන විද්‍යා උපාධියද හිමිකර ගත්තාය. දේශපාලන විද්‍යාව, ආර්ථික විද්‍යාව හා කෘෂිකර්මය ඇය හැදෑරූ විෂයයන් අතර ප්‍රමුඛස්ථානයක් ගත්තාය. ආචාර්ය උපාධිය තෙක් ඉගෙනුම ලැබූ අතර සිංහල - ඉංග්‍රීසි සමග ප්‍රංශ භාෂාව චතුර ලෙස කතා කරන්නටත්, ලියන්නටත්, ඉතා දක්ෂ ලෙස ප්‍රගුණ කර ඇත. රුසියානු, ජර්මන්, හා හින්දි භාෂාවන් පිළිබඳ දැනුමක්ද ඇය ලබා ඇත.

ලෝකයේ ප්‍රථම අග්‍රාමාත්‍යවරිය වීමේ භාග්‍යය උදා කර ගත් සිරිමා බණ්ඩාරනායක මැතිනියගේ ළය මඬලෙන් කිරි උරා බී හැදුන වැඩුන චන්ද්‍රිකා ළඳැරිය අද ජාතියේ අනාගත ඉරණම විසඳීමේ භාරදූර කාර්ය සිය දෑනට ගෙන සිටින්නියකි. සිය පියාගේ ඔඩොක්කුවට වී දේශපාලනයේ උණුසුමට සම වැදුණ චන්ද්‍රිකා දියණිය දේශපාලන ක්ෂේත්‍රයට සම්ප්‍රාප්ත වූයේ දෙමව්පියන්ගෙන් ලද ආභාෂය නිසාවෙනි. සිය පියාණන් හා මවගේ අතැඟිලි අල්ලා ආ කටුකවූත්, අමිහිරි වූත් අත්දැකීම් සම්භාරයකින් අනූන වූ දේශපාලන මං පෙතක කුමාර සැප සම්පත් කෙළ පිඬක් සේ ඉවත හැර හුදෙක්ම දුක් විඳින පීඩිත ජනතාවගේ හිත සුව පිණිස ආ ගමනක මං සලකුණු ඇය අගනාම ජීවිත අත්දැකීම් ලෙස පාදක කොට අතීත මතක සටහන් සිහියෙන් අවදි කරගෙන ඇති බවට කුඩා කල සිට ඇයගේ ජීවන රටාව දෙස විමසිලිමත් වන්නෙකුට විනිවිද දැකිය හැක.

චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය ජාතික නායකත්වයට බොහෝ සුදුසුකම් ලබා සිටින්නියකි. ඇය අඩ සියවසකට සමීප කාලයක් තුළ සිය ජීවිත අත්දැකීම් තුළින් ලත් ආභාෂයෙන්ද අධ්‍යාපන හා පර්යේෂණ ක්ෂේත්‍රයන් තුළ ලැබූ පරිනත දැනුම සහ ඇගේ ඍජු ප්‍රතිපත්ති තුළින්ද, ප්‍රභාව හා ප්‍රතිභාව කැටපත් කර දක්වන බව නොරහසකි. විදේශ විශ්ව විද්‍යාල ගණනාවකින් ඇය ලබා ගත් උපාධි හා ගෞරව සම්මානයන් මෙවැනි ගතකින් පිඩු කොට දැක්වීම කළ නොහැක්කකි.

පැරිසියේ සෝබෝන් විශ්ව විද්‍යාලයෙන් ඇය ලැබූ සංවර්ධන ආර්ථිකය පිළිබඳ උපාධියද ඇගේ පරිණත විෂයය දැනුමට ගෞරවයක් වශයෙන් එංගලන්තයේ බ්‍රැඩ්ෆෝඩ් විශ්ව විද්‍යාලයෙන් හා නව දිල්ලියේ ජවහර්ලාල් නේරු විශ්ව විද්‍යාලයේ ආරාධිත කථිකාචාර්යවරියක් ලෙස සේවය ලබා ගැනීමද යන කරුණු දෙක මැයගේ අධ්‍යාපනික ප්‍රගතිය මැනවින් පිළිබිඹු කරයි.

තාගෝර් ශත සංවත්සර උළෙලකදී තාගෝර් නාට්‍යයක රඟ පෑ චන්ද්‍රිකා බණ්ඩාරනායක පාසැල් කාලය තුළ නිතැතින්ම, නැටුමට - ගැයුමට වැයුමට ඇල්මක් දක්වා තිබීමත්, කලා විෂයයන් ප්‍රගුණ කිරීමත්, ඇය ලද චරම සිය ජීවන මං පෙත සරසා ලන අත්වැලක් වන්නේය.

සිය පියාණන් හා මව සමග රටවල් ගණනාවකම දූත මෙහෙවරක යෙදුණු චන්ද්‍රිකා බණ්ඩාරනායක එතුළින් සිය ජීවිතයට අත්දැකීම් සම්භාරයක් තුරුළු කර ගන්නට ඇවැසි දැනුම ලබා ගත්තාය. චන්ද්‍රිකා බණ්ඩාරනායක සිය පාසැල් ජීවිතයේ ඉතා උද්යෝගිමත් ශිෂ්‍යාවකි. හැම . තත්පරයක්ම අපතේ නොහැර අධ්‍යාපන කටයුතුවල නිරත වූ ඇය චතුර කථිකත්වයකට සම වැදූනේ තම විදුහල් මවගෙනි.

ඇයගේ එඩිතරකම, කාර්යශූර භාවය, ඇති කර ගන්නට තොටැන්නක් වූයේ තමන් සිප් සතර හැදෑරූ සෙන් බ්‍රිජට් කන්‍යාරාමයෙනි. ඇය ලද එඩිතරකම්, මිනිස්කම අභිමුඛයේදී මෘදු මොළොක් බවට පත්වන අවස්ථා බොහෝය. මෘදු මොළොක් බව හා ප්‍රසන්න නිහතමානී කාරුණික බව ඇයගේ සිතහට තුළ නිරන්තරයෙන්ම විද්‍යාමානව ඇත.

ගුරුවරුන්ට දැක්වූ සෙනෙහස, ලැදියාව, ලෙන්ගතුකම ඇයගේ හදවත තුළ පිටාර ගැලූයේ ඇය සිප් සතර හැදෑරූ අවදියේ සිටය. පාසැල් යෙහෙළියන් හා සෙසු ශිෂ්‍යාවන් අතර අගමැති දියණියක් ලෙසින් හැසිරෙන්නට කිසි දිනක සිහිනයකින්වත් උත්සාහ නොගත්තාය. හැම දෙනෙකු සමග ස්වාධීනව නිදහස්ව ඇසුරු කරන්නට ඇය කුඩා කල සිටම හුරු පුරුදු වූවාය. ගුරු සිත රිදෙන අබමල් රෝනක තරම් වරදක් කරන්නට ඇය කිසි දිනෙක නොපෙළඹුනාය.

සනාථාරාමයක අධ්‍යාපනය ලැබුවත්, තමා තුළ බුදුදහම් කෙරේ පවතින ආදරය - ගෞරවය කිසි දිනෙක අමතක නොවුණි. එවන් ගතිගුණවලින් හෙබි ඇය නිරතුරුවම සිංහල සිරිතට විරිතට මුල් තැනක් දී කටයුතු කරන්නට පෙළඹුනාය. ළමා සාරියට වැඩි මනාපයක් දැක් වූ ඇය සිය දෙමව්පියන් සමඟ සහභාගි වන ආගමික උත්සවවලට නිරන්තරයෙන්ම ළමා සාරිය පරිහරණය කළාය. ඉඩ ලද හැම මොහොතකම පන්සල ඇසුරු කළ ඇය හැම පොහෝ දිනෙකම පන්සල වෙත යාම සිරිතක් කොට ගත්තේ කුඩා දැරියක්ව සිටි අවදියේ සිටය.

උතුම් මිනිස් ගති ගුණ සිය හදවතට කුරුළු කර ගන්නට ඇවැසි පරිසරය හා අධ්‍යාපනය ලද ඇය සිය දෙමව්පියන්ගෙන් ලද උරුමය ජන්ම දායාදය කොට ගනිමින්, තිරසර නායකත්වයකට ප්‍රවිෂ්ට වීමට පෙරුම්පිරුවේ අද ඊයෙක සිට නොවේ. අඩසිය වසකට ළංවූ කාලයක සිට ලද අත්දැකීම් පාදක කොට ගනිමින් නිසි අධ්‍යාපනයෙන්ද පන්නරය ලබමින්, 1993 වසරේ බස්නාහිර පළාතේ මහ ඇමතිනිය වශයෙන්ද - 1994 මහ මැතිවරණයෙන් ශ්‍රී ලංකාවේ දසවැනි පාර්ලිමේන්තුවේ 11 වන අග්‍රාමාත්‍යතුමිය වශයෙන්ද එම වසරේම ශ්‍රී ලංකාවේ ජනාධිපතිනිය ලෙස පදවි ප්‍රාප්තවීමේ භාග්‍යය හිමි කරගත්තේ ඇයට සේවය කර ගැනිමට නොව පීඩිත පංතියේ ජනතාව නඟන දුක් අඳෝනාවේ කඳුළු පිස දැමීමටය.

# යුග දිවියට පා තැබීම

යොවුන් වියේ සොඳුරු මාවත පියමං කරමින් සිටි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුල කුමරියගේ විවාහ මංගල්‍යය 1978 පෙබරවාරි 20 වැනි දින චාම් උත්සවයකින් සිදුවිය. ඇයගේ ස්වාමි පුරුෂයා වූයේ ප්‍රකට සිනමා නළුවෙකු මෙන්ම දේශපාලන නායකයෙකුව සිටි විජය කුමාරතුංග මහතාය.

භද්‍ර යෞවනයේ සුවඳ හමන පුෂ්පයක් මෙන් විකසිත වූ චන්ද්‍රිකා එදා සුකුමාල සුන්දර චාම් ගතිගුණවලින් පිරි සිරි දෙව් දුවක් වූවාය. රූපශ්‍රීයෙන් අග තැන් වූ ඇය තම වැඩිහිටියනගේ නිරන්තර ආදරයට හා ගෞරවයට පාත්‍රව සිටියාය. නොසැලෙන අචල සෑුු නිහතමානී ගති පැවතුම්වලින් හෙබි චන්ද්‍රිකා හෙළ සිරිත් විරිත් අගය කළාය. විවාහ දිවියට ඇතුළත් වන විට ඇයට වයස අවුරුදු 33 ක් පමණ විය.

හෙළ යුවතියකට සමීප, කුල කුමරියකට ගැලපෙන ඇඳුම් - පැළඳුම් ඇය පරිහරණය කළාය. වැව - දාගැබ පන්සලට ප්‍රිය කළාය. එහි නිරාමිස සුවය ඇලුම් කළාය. වාසනා මහිමයෙන් අගතැන්පත් වූ එකම කාන්තාව වශයෙන් ඇය දැන් අභිෂේක ලබා සිටින්නීය. අරුණෝදයට පෙර සීතල මිහිදුම් සළු වැසී යන කඳු යායක් මෙන්, ඇගේ ජීවිතය තුළ පරම පවිත්‍ර සුන්දරත්වයේ මිහිදුම් සළුවෙන් ජීවිතය නමැති කඳු වළල්ල වසා ගෙන සිටියේ නව ලොවක නැවුම් බලාපොරොත්තු තුරුලු කර ගෙනය.

ජීවිතයේ ලද අත්දැකීම් සම්භාරයක ආභාෂයෙන් හැඩ වී ඇය යථාර්ථයේ පහන් වැඟ වෙත පියමං කළේ තම අධිෂ්ඨාන සහගත පැතුම් කැකුළු මෝදු වෙමින් තිබියදීය. ඇයගේ චින්තනයට සරිලන ප්‍රාර්ථනා දැක දැන හඳුනා ගත්, එම පිළිවෙත්හි පිහිටි විජය කුමාරතුංගයන් ගෙල, සෙනෙහසේ මල්දම පැළඳ වූයේ ඇයගේම සිතැඟියාව අනුවය.

ජීවිත යථාර්ථය පිළිබඳ ගැඹුරු අත්දැකීම් මත එය විනිවිද දකින මිනිස් චින්තනය සතු පරිණත බුද්ධියකින් අනූන චන්ද්‍රිකාගේ විවාහ ජීවිතය හා ඇයගේ තීරණයන්ට කිසිවකු අදහස් උදහස්

යොමු කිරීමට මැලි වූයේ, ගනු ලබන හැම තීරණයක්ම කල්පනාකාරීව බුද්ධිමත්ව කෙරෙන විසඳුම් නිසාය.

විජය කුමාරතුංග කලාකරුවා ජනප්‍රියත්වයේ හිණි පෙත්තට නැගි සිනමා ශිල්පියෙකි. මිනිස් හදවතේ පැහැබර යථාර්ථය තේරුම් ගත් මානව හිතවාදියෙකි. පීඩිත ජනතාවගේ දුක් කඳුළු පිස දැමීමට ඔහු තුළ තිබූ අධිෂ්ඨානය හා පරම පවිත්‍ර චේතනාවේ දෝංකාරය දුක් විඳින ජනතාවගේ හදවත් තුළ රැව් පිළිරැව් දෙන්නට තරම් ඔහු ජනතාව වෙත සමීප විය.

බල ලෝභයෙන්, නිල ලෝභයෙන්, සංකර සිරිත් විරිත්වලට ඇබ්බැහි වී ජාතික සිරිත් විරිත් මෙන්ම, නිදහසේ නිවහල්ව ජීවත් වීමට අසීරු වූ යුගයක, නිමක් නැති බෙදුම්වාදී අරගලයකට මැදිව අහිංසක ජනතාවගේ ජීවිත පවා බිලිගත් අධම යුගයක් නිමා කරන්නට, යුධ බියෙන් මුළු මහත් ජනතාවම භීතියෙන් ඇලලී ගිය යුගයක සමාජ අසාධාරණයට එරෙහි වූ විරෝදාකල්පවලින් සන්නද්ධව සිටි මුළු මහත් ජනතාවට විමුක්තියේ සුභාරංචිය පතුරුවන්නට, දිවිහිමියෙන් කැපවීමකින් කටයුතු කළ විරෝදාර එඩිතර ගතිගුණවලින් පරිපූර්ණ වූ විජය කුමාරතුංග කලාකරුවා මහජනතාව සක් සුදක් සේ හඳුනා ගෙන සිටි දුර්ලභ ගණයේ ලංකා පුත්‍රයෙකි. පිළිසරණක් විය යුතු විටෙක පිළිසරණක් වීමටත්, දුකටත් සැපටත් සමසේ කටයුතු කරන්නටත්, ස්වාධීන අදහස් ගරු කරන්නටත්, මුදලට - බලයට අසාධාරණයට මිනිස්කම පාවා නොදුන්, යුගයේ බිහි වුණ, නිහතමානී අවංක ප්‍රතිපත්ති තම හදවත තුළ ජන්ම දායාද කොට ගත් විජය කුමාරතුංග යුග පුරුෂයා චන්ද්‍රිකාවන් වැනි ගුණයෙන් නැණයෙන් විචක්ෂණයෙන් අගතැන් වූ මහේෂිකාවකගේ අත ගැනීම පෙර ආත්ම ගණනාවක සිට කළ ප්‍රාර්ථනයක ප්‍රතිඵලයක් ලෙස දැකිය හැක.

දස අතම සුගන්ධයෙන් පුෂ්පවත් වූ, මිනිස් සිත් සතන් ප්‍රබෝධමත් කළ, පූජ්‍ය සම්මානයට පාත්‍ර වූ, මුළු මිනිස් සංහතිය තුළම අචල භක්තියෙන් ගුණ සුවඳ විහිදූ, විජය කුමාරතුංග කලාකරුවා දැයේ පහන් ටැඹක් විය. දහබිඳු වගුරවා ස්ව උත්සාහයෙන් ඉපැයූ වත්කම් සියල්ලම දේශපාලනයට කැප කළ විජය කුමාරතුංග මහතා උතුර - දකුණ සමගි කර, රටේ සෞභාග්‍යය විනාශ මුඛය කරා ගෙන යන යුද්ධය අවසන්

කරන්නට, වගකිව යුතු රාජ්‍ය පාලකයන් සිටියදී යාපනය බලා ගිය ඔහු තම ජීවිතය නොතකා සිදු කළ උදාර මෙහෙය මේ කප පවතින තුරු, කෘතවේදීන්ගේ හදවත්හි සදා අමරණීය වනු ඇත. එවන් උදාර ගතිගුණවලින් හෙබි සත් පුරුෂයකු වන විජය කුමාරතුංග නම් මානව හිතවාදියා සමග චන්ද්‍රිකා බණ්ඩාරනායක මෙනෙවිය විවාහ වීමෙන් ඕ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග නම් වූවාය.

සාර්ථක විවාහ ජීවිතයක් ගත කළ මේ දෙපලට දරුවන් දෙදෙනෙකි. වැඩිමහල් දියණිය යසෝදරා මේ වන විට 15 වැනි වියේ පසු වන්නීය. දෙවැන්නා විමුක්ති පුතුය. ඔහු මේ වන විට 13 වැනි වියේ සිටියි.

# කඳුළින් ලැබූ පන්නරය

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නිර්මාතෘවරයාණන් වූ සොලමන් වෙස්ට් රිජ්වේ ඩයස් බණ්ඩාරනායක නම් වූ බණ්ඩාරනායක ශ්‍රීමතාණන් වර්ෂ 1956 ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍යවරයා බවට පත්විය.

ශ්‍රී ලංකාවේ මැතිවරණ ඉතිහාසයේ උණුසුම් පෙරළිකාර මැතිවරණයක් ලෙස 1956 මැතිවරණය සැලකිය හැක. 1947 ආසන 42 ක් හා 1952 ආසන 54 ක් ලබා ගත් එක්සත් ජාතික පක්ෂය 1956 මැතිවරණයේදී ආසන 08 දක්වා පහත වැටෙමින් හතරවැනි ස්ථානයට පත් විය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, විප්ලවකාරී සම සමාජ පක්ෂය, එක්ව ගොඩ නගා ගත් මහජන එක්සත් පෙරමුණ මෙම මැතිවරණයේදී ආසන 51 ක් ලබා ගැනීමට සමත් වී ඇත.

මහජන එක්සත් පෙරමුණේ නායකත්වය එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා හෙබ වූ අතර, විප්ලවකාරී සම සමාජ පක්ෂයේ නායකත්වය පිලිප් ගුණවර්ධන මහතාත්, භාෂා පෙරමුණේ නායකත්වය ආචාර්ය දහනායක මහතාත් දරණ ලදී. මේ අනුව ඒස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මැතිතුමා 56 පෙරළියේ නියමුවා ශයෙන් ලංකා දේශපාලන ඉතිහාසය නව මගකට යොමු කළ ජන නායකයෙකි.

ගමේ උගතුන්ට පාර්ලිමේන්තුවට පිවිස රටේ පාලන න්ත්‍රයට දායක වන්නට මං පෙත් විවර කළ ඒ ශ්‍රේෂ්ඨ වීරෝදාර ා නායකයා බණ්ඩාරනායක ශ්‍රීමතාණන්ය.

දුක් විඳින ජනතාව වෙනුවෙන් ඇප කැපවී සේවය කළ තුමා 1959 සැප්: 25 වැනිදා උදෑසන 8 පසුවී විනාඩි 05 ට ාසිකයෙකුගේ වෙඩි පහරට ලක්ව ශ්‍රී ලංකා මාතාවගෙන් සන් වරට සමුගත්තේය.

සිය පියාණන් මෙසේ ලක්මාතාවගෙන් සමුගෙන අවසන් ම හෙළන විට චන්ද්‍රිකා 14 හැවිරිදි පාසල් සිසුවියකි.

මවගේ තුරුලේ නැළවුණු පුංචි චන්ද්‍රිකා අනෙකුත් දරුවන්මෙන් අවදියේ හඬන්නට ඇත්තේ කිරටය. කිරෙන් අත්හැරී ඇයට

විරාමයක් වත් නවතින්නට ඉස්පාසුවක් නොවිය. එකල පොදු ජනතාවගේ හිත මිතුරෙකු වූ බණ්ඩාරනායක අග්‍රාමාත්‍යතුමන්ගේ ජීවිතය සහාසිකයෙකුගේ වෙඩි උණ්ඩයකින් අවසන්ව සදහටම දෙනෙත් පියාගත් මොහොතේ පුංචි චන්ද්‍රිකා දියණිය යළිත් හඬා වැටුණාය. ස්වාමි භක්තියෙන් සිය දයාබර සැමියාණන් සොහොනෙහි මිහිදන්වන විට සිරිමා බණ්ඩාරනායක මැතිනිය හා පුංචි චන්ද්‍රිකා, සුනේත්‍රා අක්කා, අනුර මල්ලී ඇතුළු මුළු මහත් ශ්‍රී ලංකාවාසී ජනතාව සමග හඬා වැටුණාය. ශ්‍රී ලංකා ධරණී තලය කම්පා විය. උස් පහත් භේදයෙන් තොරව සෑම ජනකොටසක්ම බණ්ඩාරණායක අග්‍රාමාත්‍ය තුමන්ගේ වියෝවෙන් දුක් සුසුම් හෙලූහ.

කුමාර සැප සම්පත් විඳින්නට තිබූ අවකාශය මහජනතාව වෙනුවෙන් ඉවත හැර දිවා රෑ නොබලා, නිදි වර්ජිතව රටදැය වෙනුවෙන් සිය ජීවිතය කැපකළ සිය පියාණන් අමානුෂික ලෙස කුරිරු අන්දමින් වෙඩි තබා මරා දැමීම ගැන ඝාතනයට එරෙහිව පළමු සටන ඇගේ හදවතට සම වැදුණු මොහොත එය වන්නට ඇත.

ස්වාමි භක්තියෙන් වෙලී සිටි සිරිමා මැතිනියගේ කඳුළු වැල් තමාගෙන් වියෝ වුණ සැමියාගේ දෙන මතට රූරා හැලෙද්දී එය ඇය දුටුවාය. සිය පියාණන් කුරිරු අන්දමින් මරා දැමූ පසු දියණියකගේ දෙනතින් හැලෙන කඳුළු බිඳු අතරින් මතුවූ ගින්දර අත් දැකුමෙන් ඇය දුටුවාය.

ඒ වියෝ ගින්දර ඇයගේ ජීවිත කාලය තුලම රැව් පිළිරැව් දෙන්නට ඇත. සිය පියා තැන්පත් කර ඇති සමාධිය ඇයගේ නෙත ගැටෙන හැම මොහොතකම, පිය සෙනෙහස ළබැඳියාව සිහිපත් වෙනු ඇත. ඒ හැම මොහොතකම ඝාතනයට එරෙහිව නගන සටනේ දෝංකාරය හදවත තුළ තෙරපෙන්නට ඇත. ඒ ඛේදවාචකයේ කුරිරු බව දිනෙන් දින ඇගේ හදවත තුල දළු ලා වැඩෙන්නට ඇත. දින - සති - මාස ගණනකින් මෙය සිතින් බැහැර කරන්නට නොහැකි වන්නට ඇත. අවුරුදු ගණනාවක් තුළම සිය පියාගේ සමාධිය නෙත ගැටෙන හැම මොහොතකම එය සිහිපත් වන්නට ඇත.

සිය පියාගේ වියෝ වීමෙන් ඉමක් කොනක් නැතිව ගලා හැලුන කඳුළු ඇගේ දෙනෙතින් ඊට පසුවද සමුගන්නට අවකාශයක් නොවිය.

ජනතාව අසීමිත ආදරයකින් වෙලා ගත් තම ආදරණීය ස්වාමිපුරුෂයා වූ විජය කුමාරතුංග අහිංසක කලාකරුවා 1988 පෙබ: 16දා නාඳුනන තුවක්කු කරුවකුගේ වෙඩි පහරින් ලක්මව තුරුලෙන් සදහටම වියෝවුණු මොහොතේ යළිත් ඇය හැඬුවාය. එදා තම මැණියත් සිය පියාණන්ගේ වියෝවෙන් කම්පාවී හෙළන ලද කඳුළු ගංගාව බණ්ඩාරනායක දේහය මත පතිත වූවා සේ චන්ද්‍රිකාවගේ දෙනෙතින් හැලුනු කඳුළු විජය කුමාරතුංගයන්ගේ දෙන මත පතිතවූ අයුරු යසෝදරා දියණිය දුටුවේ එදා චන්ද්‍රිකාවන්ගේ දෙනෙතට ග්‍රහණය වූ අයුරින්මය.

ඝාතනය පිළිකුල් කළ ඇය ආයාසයෙන් දරාගත් දුක් වේදනාවන් යටපත් කර ගත්තේ ඝාතනයට එරෙහිව තීරණාත්මක සටනක යෙදිය යුතුයැයි දෙවැනි වරටත් කළ තීන්දුව, ඇය හෙලූ කඳුළු බිඳු හා මුසු වන්නට ඇත.

තම ස්වාමියා මරා දැමූ ඒ කෲර දේශපාලනයට ඇ නවත් වරක් ද්වේශ කරන්නට ඇත. නැවත වරක් ඝාතනයට එරෙහිව සටන් කරන්නට පන්නරය ලැබුවාසේ ජනතා මෙහෙවරට අවැසි දේශපාලන පන්නරය ද ඇය ලැබුවාය.

සිය පියාගේ ප්‍රතිපත්තිමය දේශපාලන චින්තනයේ ආභාෂය ලද ඇ තම ස්වාමියාගේ මානව හිතවාදී ආකල්පවල ආභාෂය ද ලබමින් ජනතා නායකත්වයට ඇවැසි පන්නරය ලැබුවාය. පොදු ජනතාවගේ දුක දත් මානව දයාවෙන් පරිපූර්ණ පුෂ්පයක් ඇගේ හදවත තුළ පිපී සුවඳ හමන්නට වූවාය. 1956 දේශපාලන ඉතිහාසයේ පෙරළියක් කර මහජනතාවගේ හිත සුව පිණිස පියවර ගනිමින් සිටියදී බණ්ඩාරනායක අග්‍රාමාත්‍ය තුමා ඝාතනය කළ අයුරින්ම විජය කුමාරතුංග මහතා ඝාතනය කළේ වාමාංශික දේශපාලනයේ නායකත්වය ගෙන පොදු ජන අරගලය දියත් කරන්නට මාන බලමින් සිටි මොහොතකය.

විජය කුමාරතුංග මහතා දියත් කළ පොදු ජන අරගලය නැවතුන තැනින්, යළි චන්ද්‍රිකා බණ්ඩාරණායක කුමාරතුංග මැතිනිය පටන් ගත්තේ දුක් විඳින ජනතාවගේ හදවත් තුළ අපේක්ෂා ගංගත්වයේ ඝන කළුවර මැද සිය දෑස් විවර කරගෙන පමණක් සිටි, නිමක් නැති යුද්ධයක පීඩාවෙන් හා භීතියෙන් ඇලලුනු යුගයක ජනතාව අතරට හුළු එළිය රැගෙන

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

එමින් යුග මෙහෙවරක පහන් ටැඹ වෙන පිය තගන්නට ඇය අපේක්ෂා කළාය.

පියා අහිමි වීමෙන්, සිය ස්වාමියා අහිමිවීමෙන් ඝාතනය නැති කරන්නට සිය අදිෂ්ඨානය හදවතේ සනිටුහන් කරගත් මේ අභීත වීර කාන්තාව දරුවන් අහිමි වූ දෙමව්පියන්ගේ අඳෝනාව අසා සූරිය කන්ද තරණය කළාය. "මිනිස්කම අගයන රටක් වේවා"යි ඇය සූරිය කන්ද මුදුනේ සිට ප්‍රාර්ථනා කළාය. යළිත් මෙවැනි ඛේදවාචකයන් නොවන්නටත්, සත්‍යයේ කඩතුරාව විවරකර අසාධාරණයට එරෙහිව කටයුතු කරන වගටත් ඇය ප්‍රතිඥා දුන්නාය.

එදා සූරිය කන්ද පා මුලින් හඬා ගිය ජන රැල්ල සතර දික් භාගයෙන්ම ඈ වටා රොක් වූවාය. සියලු දුක් බාධක ජයගනිමින්, කඳුළින් පන්නරය ලැබූ චන්ද්‍රිකා නම් ඇය ශ්‍රී ලංකා ඉතිහාසයේ ජනතා නායකත්වයට හැම අතකින්ම සුදුසුකම් ලැබුයේ පොදු ජනතාවගේ පිනටය.

මිනිස් ඉතිහාසයේ තුල කාන්තාව පිළිබඳව අපූර්වතම සටහන් තබන්නේත්, ඔවුන්ගේ නම් ඉතිහාසය තුළ සටහන් වන්නේත්, ඉන්ද්‍රඛීලයක් මෙන් නොසැලෙන අභීත වීරෝදාර කාන්තාවන් ගෙනි. චන්ද්‍රිකාවන්ද එවැනි කාන්තාවකි. පොදු ජන යුගයක් කරා රටක් මෙහෙයවන්නට ජන වරම් ලැබූ නායිකාවකි.

අභියෝග ඉදිරියේ පසුබට වන, ප්‍රහාරය ඉදිරියේ පසු බසින, අසාධාරණය ඉදිරියේ දණින් වැටෙන කාන්තාවන් සුවහසක් සිටින සමාජයක අභියෝග හමුවේ නොසැලෙන, ප්‍රහාරයන්ට මුහුණ දෙන, අසාධාරණයට එරෙහිව කටයුතු කරන කාන්තාවෝ පහළ වීම දුර්ලභය. මෙවැනි කාන්තාවෝ කාන්තා පරපුරටම පරමාදර්ශයකි.

# වෘත්තීය සේවය

වෘත්තීය වශයෙන් ජනතා සේවයට මෙතුමිය ප්‍රවිෂ්ඨ වූයේත්, මුල්වරට ජනතාවට සමීප වූයේත් 1972 වසරේදීය. 1970 බලයට පත් වූ සමගි පෙරමුණු ආණ්ඩුවේ කෘෂිකර්ම හා ඉඩම් ඇමති හෙක්ටර් කොබ්බෑකඩුව මහතා යටතේ ක්‍රියාත්මක වූ ඉඩම් ප්‍රතිසංස්කරණ වැඩ පිළිවෙල අනුව ගමින් ගමට ගොස් ඉඩම් ප්‍රශ්න නිරාකරණය කිරීමට, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමේ අධ්‍යක්ෂිකාව හැටියට මෙතුමිය උදාර සේවාවක් ඉටු කර ඇත. ඉඩම් ප්‍රශ්න විසඳීමට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම මගින් එකල හෙක්ටර් කොබ්බෑකඩුව අමාත්‍යතුමන්ට අත්වැලක් වූ මෙතුමිය තමන්ට පැවරෙන වගකීම සෘජුව - අවංකව - නිහතමානිව - අපක්ෂපාතිව ඉටු කිරීමට හා තමන්ට පැවරෙන වගකීම එයාකාරයෙන්ම තේරුම් ගැනීමට හැකි බුද්ධි බල මහිමයක් ඇ ජන්මයෙන්ම ලද බව ජනතා සේවයට ප්‍රවිෂ්ඨ වූ මුල් වකවානුව තුළින්ම දැක ගැනීමට හැකි වී තිබීම සක්සුදක් සේ පැහැදිලිය.

ඉඩම් කොමිෂන් සභාව යටතට පවරා ගත් ඉඩම්වල සමුපකාර ජනාවාස පිහිටුවීමෙනුත් සමුපකාර ගොවිපළ ක්‍රමය රටට හඳුන්වා දීමෙනුත් එතුමිය අතින් සිදු වූ සේවය සුළුපටු නොවේ. වර්ෂ 1972 සිට 1976 දක්වා එතුමිය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමේ අධ්‍යක්ෂිකා තනතුර හෙබවූවාය.

වර්ෂ 1976 සිට එවක රජයේ පාලනය අවසන් වන තුරුම නාවාස කොමිෂන් සභාවේ සභාපතිනිය ලෙස චන්ද්‍රිකා ණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය කටයුතු කර ඇත. ඇය මේ කොමිෂම තුළ සමුපකාර ජනාවාස පිහිටු වීමේ ක්‍රමය රට තුළ ාප්ත කිරීමට අපමණ වෙහෙස ගෙන කටයුතු කළාය. මේ කාලය ළ: ඇය කළ උදාර මෙහෙය රටේ ජනතාව අගය කළ අතර ඇය බඳව ජනතාවගේ දෑස් විවර වන්නට වූවාහ. සමුපකාරය තාවට සමීප වූයේත් කෘෂිකර්මාන්තය රට තුළ නව මහක ණුවර ගත්තේත් සමුපකාරය අත්‍යවශ්‍යම සේවාවක් බවට ර්තනය වූයේත් මේ වකවානුව තුළය.

වගා කටයුතු වෙනුවෙන් නගරයේ ජනතාව වන්නිකරයට යාම සීඝ්‍රයෙන් ඉහළ යමින් රජරට හේන් ගොවිතැනට නව යුගයක් උදාවිය. වර්තමානයේද එකී ගොවි පවුල්වල උරුමයන් දැකිය හැක. 1976 සිට 1977 දක්වා ජනාවාස කොමිෂමේ සභාපතිනිය වශයෙන් චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය සිදුකළ සේවය අවංකව හා ඍජුව ඉටු කිරීමෙන් අද පත්ව ඇති ජනතා නායකත්වයට ඇය පන්නරය ලැබුවාය. 1976 සිට 1979 දක්වා මෙකී කාලය තුළ ඇය ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ (F.A.O) උපදේශකවරිය හැටියට කටයුතු කරමින් උදාර ජනතා සේවයක නියැලි කටයුතු කළාය.

අධ්‍යාපනය හා කෘෂිකර්මය යන විෂයයන් කෙරෙහි හසල බුද්ධියකින් පරිනත චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය ප්‍රංශයේ පැරිස් නුවර උසස් අධ්‍යාපනය හදාරා මෙරටට පැමිණි වකවානුවේ සිට මේ දක්වා දේශපාලන ක්ෂේත්‍රයේ මෙන්ම සංකීර්ණ ගැටළුවලට මුහුණ දෙමින්, විවිධ සමාජ ක්ෂේත්‍රයන්හි නියැලෙමින් ජනතා නායකත්වය පිළිබඳ ලබා ඇත්තේ හසල දැනුම් සම්භාරයකි.

සිය සැමියාණන් වූ විජය කුමාරතුංග මහතාගේ වියෝවෙන් පසු දැඩි මානසික චිත්ත පීඩාවට පත් වූ ඇය 1988 වසරේම යසෝදරා දුව සහ විමුක්ති පුතු සමග තාවකාලික පදිංචිය සඳහා ලන්ඩනයට ගියාය. සිය ආදරණීය දරු දෙදෙනාට රැකවරණය හා අධ්‍යාපනය නිසි අයුරින් ලබා දීම මෙම ගමනේ දැඩි අධිෂ්ඨානය මෙන්ම වගකීම වූයේය. මේ ගමනේදී සිය දරුවන් තනිකරන්නට ඈ උත්සාහ නොගත්තාය. දරුවන් සමග මුල් කාලපරිච්ඡේදය තුළ ඇය ලංඩනයේ ගත කරන ගමන්ම ලංඩන් විශ්ව විද්‍යාලය හා ඊට අනුබද්ධ පොදු රාජ්‍ය මණ්ඩලීය අධ්‍යාපන ආයතනයේ පර්යේෂණ සහකාරියක වශයෙන් වසර දෙකක පමණ කාලයක් සේවය කළාය. මේ කාලය තුළ තමා ලත් අත්දැකීම් හා දැනුම් සම්භාරය පාදක කොට පර්යේෂණ කෘති කිපයක්ම නිබන්ධනය කළාය. ශ්‍රී ලංකාවේ දේශපාලන වධහිංසා, ඉඩම් හා කෘෂිකර්ම ප්‍රතිසංස්කරණය විෂයයන් තුළින් තමා ලද සුවිශේෂ වූ ගැඹුරු අත්දැකීම් ඇය කළ නිබන්ධනයන් තුළ අන්තර්ගතව ඇත.

පාසල් කාලය තුළින්ම පත්හිඳ සූරතම හුරු කර ගත් ඇය සිංහල භාෂාව පිළිබඳව ලත් ප්‍රවීනත්වය නිසාම විවිධ පර්යේෂණ

කෘති කිපයක්ම නිමා කරන්නට ශක්තිය ලැබුවාය. ශ්‍රී ලංකාවේ සමූපකාර ව්‍යාපාරය, ශ්‍රී ලංකාවේ ඉඩම් හා කෘෂිකාර්මික ප්‍රතිසංස්කරණය, 1984 සිට ශ්‍රී ලංකාවේ ආහාර ප්‍රතිපත්ති හා ව්‍යූහය (වයිඩර් ආයතනයේ ප්‍රකාශනයකි) නම් නිබන්ධන ඇය නිරත වූ පර්යේෂණයන්හි ප්‍රතිඵල ලෙස නම් කළ හැක.

# දේශපාලන ගමන් මග

වසර දාහතක්ම නොසැලී පැවති එක්සත් ජාතික පක්ෂ රජය බිඳ දමා මුහුණ දුන් ප්‍රථම මැතිවරණයෙන්ම ජනතා නායකත්වයට පිවිසි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය විරාමයක් නොමැතිව පහසුවෙන් මැතිවරණ ගමන් මඟට ප්‍රවිෂ්ට වූ ශ්‍රී ලංකා කාන්තා ඉතිහාසයේ එඩිතර නායිකාවකි.

1994 පාර්ලිමේන්තු මහ මැතිවරණයට ඇ ඉදිරිපත් වූ මුල් වතාවේදීම හාර ලක්ෂයකට අධික මනාප ඡන්ද සංඛ්‍යාවක් ලබා ගත්තාය. එයද විජයග්‍රාහී වාර්තාවකි. බණ්ඩාරනායක මැතිතුමා සහ සිරිමාවෝ මැතිනිය යන තම පියා සහ මව අගමැති පදවියෙන් පිදුම් ලත් රටක දියණියද මහජන වරමින් ඒ පදවියටම පත් වූවාය. එයද ශ්‍රී ලංකා මැතිවරණ ඉතිහාසයේ හා ලෝක නායකත්වයේ සුවිශේෂ වූ සිද්ධියකි.

දේශපාලන හෝඩියේ 'අ' යනු 'ආ' යනු කියන්නට ඇ වරම් ලැබුයේ සිය පියාගේ තුරුලේ පිය සෙනෙහස ලබමිනි. ඒ හා මවගේ ඇකයෙහි දෙතොල ගෑ කිරි බිඳුවේ උණුසුම වූයේද ජනතා සේවයට කැපවීමේ පරම පවිත්‍ර චේතනාවමය. එබැවින් චන්ද්‍රිකාවන්ගේ රුධිරය තුළ ජනතා සේවයක පරම හැඟීම් නිදන්ගතව ඇත. කුඩා අවදියේම ඇයගේ ළමා ලෝකයටම ප්‍රවිශ්ඨ වූ ආරාධිතයා වූයේද දේශපාලන පසුබිමය. දේශපාලනය යන්නමින් හෝ මුසු නොවුණා යැයි සැකයක් නොවනුයේ මව් - පිය - වැඩිහිටි - ඥාතීන් සහ අනුගාමිකයන්ගේ දේශපාලන කතාබහ වැඩකටයුතු අතර රාමුව තුළට ඇය සම්පවීමය.

එස් ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මැතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පිහිටුවා ප්‍රථම වරට හාපුරා කියා මැතිවරණයකට පිවිසියේ 1952 වසරේය. 1952 මැයි මාසයේ දින හතරක් පුරා පැවති මැතිවරණයෙන් එක්සත් ජාතික පක්ෂය ආසන 54ක් ලබාගත් අතර ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට හා ලංකා සමසමාජ පක්ෂයට ලබා ගත හැකි වූයේ ආසන 09 ක් පමණි. මෙයින් පසුබට නොවූ බණ්ඩාරනායක මහතාට 1956 මහ මැතිවරණයෙන් ආසන

51ක් ලබා ගැනිමට හැකිවිය. එක්සත් ජාතික පක්ෂයට හිමි වූයේ ආසන 8කි. 56 මෙම ජයග්‍රහණයෙන් බණ්ඩාරනායක මැතිතුමා ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍ය ධූරයට පත්විය. 1956 සිට 1959 තෙක් කිර්තිමත් රාජ්‍ය නායකයකුව සිටි බණ්ඩාරනායක මහතා ඝාතනය කරනු ලැබීමෙන් අනතුරුව එතුමා ගෙනගිය ජනතා අරගලය සිරිමා බණ්ඩාරනායක මැතිනියට දියත් කිරිමට සිදුවිය.

එදා බණ්ඩාරනායක මැතිතුමා නැවත් වූ ජන අරගලය එතැනින් සිරිමා බණ්ඩාරනායක මැතිනිය යලි දියත් කළ අයුරින්ම, සිය ස්වාමි පුරුෂයා වූ විජය කුමාරතුංග මහතාගේ ඝාතනයෙන් පසු එතුමාගෙන් පැවතුන ජන අරගලය යලි ඒ අයුරින්ම චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියද දියත් කලාය.

බණ්ඩාරනායක මැතිතුමාගේ සහ සිරිමා බණ්ඩාරනායක මැතිනියගේත්, විජය කුමාරතුංග මහතාගේත් දේශපාලන ජීවිතය නැමති තක්සලාවෙන් අධ්‍යයනය ලද ඇයට වන්මන් සමාජ ගැටලු දෙස අවධානය යොමුව, නව ජනතා සිතුම් පැතුම් පුබුදුවාලන මාවතකට යොමුවිම සඳහා මෙවැනි පසුබිමක් තුලින් ශක්තිය ලබා ඇත.

1974 වයරේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ කාන්තා සංවිධානයේ විධායක සහා කාරක සභිකයකු වශයෙන් කටයුතු කරමින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වටා කාන්තා ශක්තිය මතු කරන්නට ඇ දැඩි වෙහෙසක් ගත්තාය. නොයෙක් ප්‍රශ්න තුලින් අවුල් වී ගිය ශ්‍රී ලංකා නිදහස් පක්ෂය යලි ස්ථාපනය කිරිමේ කාර්යයට ඇ නිරතුරුවම උර දුන්නාය. 1980 වසරේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ සමස්ථ ලංකා කාරක සභික හා විධායක කාරක සභාවේ සමාජිකාවක වශයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රගතියට ඇයගෙන් සිදුවුනු උදාර මෙහෙය අදත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තුළ රතින් සටහන්ව ඇත.

1978 සිය විවාහයෙන් පසු විජය කුමාරතුංගයන් සමඟ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රගතිය වෙනුවෙන් කටයුතු කළ ඇය සිය සැමියා සමඟ දේශපාලන රණ බිමෙහි දිවා රෑ වෙහෙසමින් කටයුතු කළ නිර්භිත සෙබලියක් වූවාය. එම සේවය ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තුළ මෙන්ම ජනතාවගේ හදවත් තුළ තවමත් අනුස්මරණීය වෙමින් ඇත.

1977 වසරේ ආරම්භ කළ 'දිනකර' සිංහල දිනපතා පුවත්පතේ ආරම්භක පාලක මණ්ඩල සභාපතිනි වශයෙන්ද එහි කළමනාකාර අධ්‍යක්ෂක වරිය වශයෙන් ද ඇය කටයුතු කළාය. 'දිනකර' පත්‍රයේ මුළු බර කරට ගෙන කටයුතු කළ ඇයට පුවත් පත් කලාව පිළිබඳ නද ඇල්මක් හා මනා වැටහීමක් තිබිණි. එහිලා ඇ මහත් වෙහෙසක්ද, කැපවීමක්ද, කළාය.

විදේශ දේශපාලනඥයන් මෙන්ම විචාරකයන්ගේ ලිපි 'දිනකර' පුවත්පතේ පළකර එමගින් ජාත්‍යන්තර දේශපාලනය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම යුගයේ අවශ්‍යතාවයක් බව ඇයගේ ආකල්පය වූවාය.

'දිනකර' පුවත්පතේ ලිපි හා වාර්තා සැකසුම හා ඒවා ඉදිරිපත් කර ඇති ආකාරය දෙස මැනැවින් සුපරික්ෂාකාරිව බලන්නකුට මුද්‍රණ ශිල්පය මැනැවින් දත් ශිල්පිනියක් මෙන්ම පුවත්පත් කලාව පිළිබඳව පරිනත බුද්ධියකින් කටයුතු කර ඇති බව පිනිවිද දැකිය හැකිය. එය ඇය ලද සහජ දක්ෂතාවයකි.

'දිනකර' පුවත් පතට එරෙහිව පැන නැගුණු බාධක ඉවත්කර ඉදිරි ගමන රැක ගැනීමට ඇය සේවය කළාය. පැන නගින හැම ප්‍රශ්නයක්ම නිරාකරනය කර ගැනීමට ඇ සතු ස්ථානෝචිත ප්‍රඥාව චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ කාර්යශූරත්වය පෙන්නුම් කරන කැඩපතක් බඳුවිය.

ජන සංනිවේදන කටයුතු මෙන්ම පුවත් පත් කලාවටද, මුද්‍රණ ශිල්පයටද ඇ තුළ පැලපදියම්ව තිබූ පරිණතභාවය සුළු පටු නොවේ. හොඳ ප්‍රවෘත්ති ඉවක් ඇට තිබූ බව සමහර ලේඛකයන් විසින් පළ කර තිබූ පුවත්පත් ලිපිවලින් අනාවරණය වී ඇත.

තවත් කෙනෙකුට පැවරූ රාජකාරියකට ඇඟිලි ගැහීමකට අකමැත්තක් දක්වන ඇය වගකීමකින් හා කැපවීමකින් කටයුතු කළ හැකි පුද්ගලයන් තෝරා බේරා ගැනීමටද ඇත්තේ පැසුණු බුද්ධියකි.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ එදා ඇති වූ සුළු ප්‍රශ්නයක් හේතු කොට විජය කුමාරතුංග මහතා 1984 දි ශ්‍රී ලංකා මහජන පක්ෂය නමින් පක්ෂයක් බිහි කළ අතර එහි උපසභාපතිනිය ලෙස චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය කටයුතු කළාය.

තම ස්වාමියා විසින් දුක් විඳින ජනතාව කෙරෙහි දැක් වූ අපිරිමිත කරුණාව දයාව චන්ද්‍රිකාවන් තුළද පිටාර ගලන්නට වූවාය. ඔහු තුළ පැවති චින්තනය හා තම චින්තනය දෙකක් නොව එකක් බඳු විය. එබැවින් විජය කුමාරතුංග මහතාගේ පුරෝගාමීත්වයෙන් ශ්‍රී ලංකා මහජන පක්ෂය බිහි කරන්නට ඇය නිරතුරුව ඇප කැප වී සහාය දුන් අතර පසුව 1986 වසරේදී එහි උපසභාපතිනිය වීමේ උදාර වගකිව යුතු කාර්ය සාධනයටද ඇය උර දුන්නාය.

1984 ජනවාරි මස 21 වැනිදා විජය කුමාරතුංග මහතාගේ පුරෝගාමීත්වයෙන් ශ්‍රී ලංකා මහජන පක්ෂය පිහිටුවනු ලැබීමෙන් එහි ප්‍රධාන ලේකම්වරයා වූයේද ඔහුය.

දිවංගත ටී. බී. ඉලංගරත්න මැතිතුමා ශ්‍රී ලංකා මහජන පක්ෂයේ නායකයා විය. ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසය තුළ මහත් විප්ලවයක් සිදු කළ ශ්‍රී ලංකා මහජන පක්ෂය දුක් විඳින ජනතාවගේ සෞභාග්‍යය සොයා යාමට පාද එසවූවා පමණෙකි. සිය සැමියාගේ ඝාතනයෙන් පසු ඇය හොඳටම කළකිරුණාය. තමාගේ ජීවිතයටද ඒ අනතුරේ ඡායාව දක්නට ලැබීම නිසා ඇයට විදේශ ගත වන්නට සිදු වූවාය.

1991 වසරේ නැවත ශ්‍රී ලංකාවට පැමිණි චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය බහුජන නිදහස් පෙරමුණ පිහිටුවා එහි නායකත්වයට පත් වූවාය. මහජන අරගලය දියත් කරන්නට ඇය හෙළු දහඩිය නිමක් නැත. තමන් වටා සිට හිතවත් කම් පෑ සමහර නරුමයන්ගේ කඩාකප්පල්කාරි ක්‍රියා, ඇයගේ ජීවිතයට මඩ ගැසීම්, තොර තෝංචියක් නැතිව නැවත පෙරමෙන් ගලා එන්නට වූහ. එවැනි සියලුම අභියෝගයන් ජය ගන්නට ඇයට හැකි වූවාය.

1992 වසරේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට නැවත එක්වූ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය ඒ තුළ පැවති දුර්වලකම් වලට එරෙහිව නැගී සිට පක්ෂය ගොඩ නඟන්නට දැඩි වෙහෙස හා අප්‍රති හත ධෛර්යයෙන් යුතුව අධිෂ්ඨාන සහගත බලාපොරොත්තු සපලකර ගන්නට වෙහෙසුනාය.

1993 බස්නාහිර පළාත් සභා මැතිවරණයට ගම්පහ දිස්ත්‍රික්කයෙන් තරඟ කළ ඇය තුන්ලක්ෂයකට ආසන්න මනාප සංඛ්‍යාවක් ලබා එම පළාත් සභාවේ මහ ඇමතිනිය වූවාය.

මැතිවරණ ක්ෂේත්‍රයට මනාප ඡන්ද ක්‍රමය හඳුන්වා දීමෙන් අනතුරුව අපේක්ෂකයකු ලබාගත් වැඩිම මනාප සංඛ්‍යාව ලැබීමේ වාර්තාවටද ඇය හිමිකම් ලැබුවාය ඇය මැතිවරණයකට මුහුණ පෑ පළමු පියවරද මෙය විය. එහිදී දේශපාලන ක්ෂේත්‍රයේ වාර්තා ගණනක් තබමින් මැතිවරණ ඉතිහාසයේ කැපී පෙනුනාය.

93 වසරේ බස්නාහිර පළාත් සභාවේ මහ ඇමතිනිය වීම සමගම නීතිය, සාමය, මුදල්, අධ්‍යාපන, රැකිරක්ෂා සහ සැලසුම් භාර ඇමති තනතුරු මෙහෙයද ඉටු කළාය.

එක්සත් ජාතික පක්ෂය පරදවා ලක්ෂ 3 ට ආසන්න වැඩිම මනාප ලබමින් බස්නාහිර පළාත් සභාවේ පොදු ජන එක්සත් පෙරමුණු පාලනය පිහිටුවනු ලැබීය. ක්‍රියාශීලී නායකත්වය පැහැදිලි කරමින් දකුණු පළාත් සභා මැතිවරණයද ජය ගන්නට ඇය සමත් වූවාය. දිනකට රැස්වීම් ගණනාවකට සහභාගි වෙමින් පොදු පෙරමුණේ ප්‍රතිපත්ති ජනතාවට පැහැදිලි කර ජනතා විශ්වාසය දිනාගන්නටද ඇය සමත් වූවාය.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නියෝජ්‍ය නායිකාව ලෙසින් 1994 මහා මැතිවරණය මෙහෙය වූ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය පොදු ජන එක්සත් පෙරමුණේද උප සභාපතිනිය ලෙසද කටයුතු කළාය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂ නායිකා සිරිමා බණ්ඩාරනායක මැතිනියගේ මාර්ගෝපදේශකත්වය හා අනුශාසනා ලබමින් එතුමියගේ ආශිර්වාදයද සමග තම පියාණන්ගේ සමාධිය අසල දේශපාලන සටනේ මංගල පියවර තබා මහජන වරම ලබා ගත්තාය. එයින් අග්‍රාමාත්‍ය ධූර අපේක්ෂිකාව ලෙස කටයුතු කරන්නටද වත්මන් ජනාධිපති පදවි ප්‍රාප්ත වීමටද ශක්තිය හා ධෛර්යය ලබා ගත්තාය.

# කෙටි කාලීන ජනතා සේවය

බස්නාහිර පළාතේ මහ ඇමතිනිය ලෙස වසරකුත් මාස තුනක පමණ කෙටි කාලයක් තුළ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය අවංකව, සැජුව, නිති ගරුකව මහජන සුබ සෙත සඳහාම ගෙන ගිය පාලනය දේශපාලන ප්‍රතිවාදීන්ගේ නොමඳ පැසසුමට හේතු විය. ප්‍රති විරුද්ධ පක්ෂ, තරුණ මන්ත්‍රීවරුන් කිප දෙනෙකුම කොන්දේසි විරහිතව පොදු ජන පෙරමුණට එක් විය. දේශපාලන පලිගැනීම්, බලපෑම් හා හිංසාව නදින්ම පිළිකුල් කරන එතුමිය මෙරටේ අඳුරු අගාධයකට ඇද වැටී තිබුණ ප්‍රජාතන්ත්‍රවාදය යළි ස්ථාපිත කරන්නට තමා ගත යුතු හැම පියවරක්ම ගන්නා බව ජනතාවට අවධාරණය කළාය. පොදුවේ සැම ජන කොටසකටම නිදහසේ ජීවත් විය යුතු යුගයක් නැවත උදා කිරීම තමාගේ පරමාර්ථය බව ජනතාවට ප්‍රකාශ කළාය. ජනතාවගේ ඒ විශ්වාසය නිසාම පොදු ජන නායකත්වයට පත් වීමේ ජන බලය ප්‍රබල අවියක් විය.

විෂයයන් කිපයක්ම මහ ඇමතිනිය යටතේ තිබුණද අධ්‍යාපන විෂය කෙරෙහි ඇ දැඩි සැලකිල්ලක් දැක්වූවාය. ප්‍රජාතන්ත්‍රවාදය ලක්මව් තුරුලින් ගිලිහී යන වකවානුවක පැවති භීෂණය යළි ඇස නොගැටෙන්නට ඇයගේ එකම ප්‍රාර්ථනය වූවාය. ප්‍රජාතන්ත්‍රවාදය යළි ස්ථාපිත කිරීමට අඩුම වශයෙන් බස්නාහිර පළාත තුළින්වත් අඩිතාලම දැමිය යුතුය යන අදිටනින් අවශ්‍ය පියවර ගත්තාය.

දේශපාලනඥයන් ඉදිරියේ බලුකුක්කන් සේ දණින් නොවැටී කොන්ද කෙලින් තබාගෙන සෘජුව වැඩ කරන ලෙස ගුරුවරුන්ට ඇය අවවාද කළාය.

ගිනි අවි හා බෝම්බ අතට ගෙන භීෂණය මගින් අකාලයේ ජීවිත නැති කර ගත්තේ ලොකු පාසල්වල දරුවන් නොව පහසුකම් නොමැති දුෂ්කරතා වලට ගොදුරු වූ පාසල්වල දරුවන් බව බස්නාහිර පළාතේ ගුරු රැස්වීම්, සම්මන්ත්‍රණ ආදියේදී ගුරු පරපුර දැනුවත් කරමින් අධ්‍යාපන විෂයන්ට අමතරව පාසල් දරුවනට

හොඳ නරක පෙන්වාදී ඔවුන්ගේ ගුණ ගරුක භාවය පෝෂණය කළ යුතුය යන හැඟීමෙන් චන්ද්‍රිකා මැතිනිය වෙහෙසුන අවස්ථා බොහෝය.

ජාතියක් ගොඩ නඟන, ගෞරවයට ලක්වූ ගුරු මහත්ම - මහත්මීන් පරම යුතුකමක් සේ දරුවන්ගේ හික්මීම, ආගමට - දහමට නැඹුරුව, ගුරු දෙගුරු සැලකීම වැනි සාරධර්මයන් දරුවන් තුළ රෝපණය කිරීමට වෙහෙසිය යුතු බවද එය ගුරුවරුන ගේ වගකීම ලෙසද චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය පෙන්වා දුන් අවස්ථා එමටය.

පාසල්වල ලොකු කුඩා පරතරය නැති කිරීමට ක්‍රියා කළ අතර, දිළිඳු පවුල් වල සිසු දරුවන් වැඩි වශයෙන් අධ්‍යාපනය ලබන කුඩා පාසල් වලට වැඩි වැඩියෙන් අඩුපාඩු සොයා බලා අවශ්‍ය සම්පත් බෙදා දීමට ඇගේ කෙටි සේවා කාලය ප්‍රයෝජනයට ගත්තාය.

අතරමඟ අධ්‍යාපනය අඩාල කරගත්, නිකරුණේ කාලය ගත කරන, ශිෂණයට ගොදුරු වූ රටේ තරුණ සම්පත ගැන සොයා බලා ඔවුන්ට නැවත අධ්‍යාපනය ලබා දීමටත් වෘත්තිය පුහුණු මධ්‍යස්ථාන ඇතිකර ඔවුන්ගේ ජීවිත යථා තත්වයට පත් කර ඔවුන්ගේ සේවය රටට ලබා ගත යුතු බව ඇයගේ දැඩි අධිෂ්ඨානය විය.

බස්නාහිර පළාතේ පමණක් නොව මුළු මහත් ශ්‍රී ලංකාවේම ගුරු ක්‍රියා දාමය තුළ හීන බවක් දුටු මහ ඇමතිණිය ගුරු අඩු පාඩු සොයා බලා වැටුප් වර්ධනය පිණිස ආණ්ඩුවට යෝජනා කළේ එමගින් ගුරුවරුන් දිරිමත් කොට, ඉටුවිය යුතු කාර්යභාරය ඔවුන්ගෙන් සලසා තරුණ පරපුර යළි ප්‍රජාතන්ත්‍රවාදී පසුබිමකට අවතීර්ණ කරවීම සඳහාය.

අ.පො.ස උසස් පෙළ අධ්‍යාපනයට සුදුසුකම් ලත් එහෙත් දිළිඳුකම නිසා උසස් පෙළ අධ්‍යාපනය ලබන්නට වරම් නැතිව කුමන හෝ රැකියාවක් සොයා ගන්නට වෙහෙස දරණ තරුණ තරුණියන්ට අතදීම සඳහා බස්නාහිර පළාත තුළ අඩු ආදායම් ලබන පවුල්වල දරුවන් වෙනුවෙන් ක්‍රියාත්මක කෙරුන වැඩපිළිවෙල බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍යතුමියගේ උපදෙස් මත ආරම්භ වූවෙකි.

එය ගුරුවරුන්ගේ, සිසුන්ගේ පමණක් නොව අධ්‍යාපන විශේෂඥයන්ගේද මුළු මහත් ජනතාවගේද පැසසුමට ලක් වී ඇත. දිළිඳු සිසු සිසුවියන් 600 දෙනෙකු වෙනුවෙන් සරසවි අධ්‍යාපනය ලබන තෙක් මසකට රු. 300/- ගණනේ ආධාර මුදලක් ලබා දීමට ඇය කටයුතු කර ඇති අතර එය බස්නාහිර පළාතේ පමණක් නොව රට පුරා ව්‍යාප්ත කළයුතු බව අමාත්‍යවරියගේ අදහස වී තිබිණි.

ප්‍රධාන අමාත්‍යතුමියගේ උපදෙස් මත එතුමියගේ සේවා කාලය තුළ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක වූ ප්‍රධාන වැඩ සටහන් අතර ගුරුමාරු ක්‍රමය ක්‍රමවත් කිරීම සඳහා ගුරු මාරු මංඩල ක්‍රමය විධිමත් කිරීම, මන්දපෝෂණය දුරුකිරීම සඳහා දිළිඳු සිසුන් අධ්‍යාපනය ලබන 3 වන ශ්‍රේණියේ දුෂ්කරතාවයනට මැදි වූ පාසල්වලට පෝෂණ ගුණයෙන් යුත් ආහාර වේලක් සැපයීම හා පාසල් අධ්‍යාපන සංවර්ධන සැලසුම යටතේ පහසුකම් නොමැති පාසල්වල අවශ්‍යතාවයනට ප්‍රමුඛස්ථානය දීම හා එම පාසල්වල සම්පත් දියුණු කරලීම තුළින් අධ්‍යාපනයේ සම අවස්ථා අර්ථවත් කිරීම යන කටයුතු අධ්‍යාපන ක්ෂේත්‍රයේ වරප්‍රසාද සමයේ පරිහරණය කිරීමට ගත් වෑයමක ප්‍රථම අඩිතාලම විය.

බස්නාහිර පළාතේ මහ ඇමතිනිය වශයෙන් දියත් කළ සංවර්ධන වැඩ පිළිවෙල හා අධ්‍යාපන වැඩ පිළිවෙල රට පුරා ව්‍යාප්ත කර පොදු ජනතාවගේ ප්‍රශ්න විසඳීමට දැන් ජනාධිපතිතුමිය වශයෙන් සියලුම ඉඩකඩ හා ජන වරම ලැබී ඇත.

රටේ දුක් විඳින, පෑගෙන අසහනයට පත් වන ජන කොටස් වෙනුවෙන් රැකියා විරහිත තරුණ පරපුර වෙනුවෙන්ද ඔවුන්ගේ ප්‍රශ්න විධිමත් අරමුණක් කරා යොමු කර විසඳීමට කරනු ලබන වැඩ පිළිවෙල ප්‍රතිපත්ති ප්‍රකාශන මගින් ප්‍රකාශනයට පත් කළ අයුරින්ම ක්‍රියාත්මක කිරීමට සිය ඇමති මණ්ඩලය මෙහෙයවා කටයුතු කිරීමට ශක්තියත්, ධෛර්යයත් ඇත්තා සේම අඩ සිය වසකට ආසන්න කාලයක් ඈ ලැබූ අත්දැකීම් තුළ ලබා ඇති පරිණත බුද්ධිය ඉවහල් වන්නේය.

ගෙවී ගිය කාලය තුළින් වැළලී ගිය ප්‍රජාතන්ත්‍රවාදය යළි ස්ථාපිත කර යුක්තිගරුක, නීති ගරුක, සාමය, සමගිය අත්වැල් බැඳ ගත් සමාජයක් බිහි කිරීම මෙතුමියගේ අරමුණ බව පැහැදිලිය.

# මැතිවරණය ජයගැනීම

එක්සත් ජාතික පක්ෂ රජය පුරා අවුරුදු 17 ක් තුළ ගෙන ගිය පාලන බලය බිඳ දැමීම පිණිස පොදු ජන එක්සත් පෙරමුණ ගෙන ගියේ විශාල සටනෙකි. චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය රට වටේ යමින් ගම් - නියම් ගම් තරණය කරමින් පොදු පෙරමුණේ ප්‍රතිපත්ති මහජනතාව වෙත තබමින් ජනතාව දැනුවත් කරද්දි දහස් ගණන් ජනතාව ඇය වටා රොක් වූවාහ. ඇය කෙරෙහි පූර්ණ විශ්වාසය පළ කළාහ. එදා එලෙස ඇරඹුණු ජනරැල්ල නව රජයක නායකත්වයකට හේතු විය.

"පසුගිය වකවානුව ශාප ලත් දේශයක් හැටියට මුළු ලෝකයේම හංවඩු ගැහිල - එදා තිබුණ අතීත ශ්‍රී විභූතිය අපි නැවත ඇති කරන්න ඕනේ. 17 වසරක අධම පාලන යුගය නිමා කරලා දණින් වැටී දුක් වින්ද යුගය සදහටම නැති කරන්න තමුන්නාසේලාගේ සහාය මට ඕනෑ. ඒ තමුන්නාන්සේලාගේ යුතුකමක්. අපිට හැමදාම ගුටි කන්න බෑ.... කරුණාකරලා අපිට ගහන්න එපා. අපිට ගැහුවොත් මේ ගමන අපිටත් තීරණයක් ගන්න වෙනවා. හැබැයි.... අපිට ගහපු අයට පාර ඉඩ මදිවෙයි දුවන්න. ජනතාව හැමදාමත් ගුටිකන්න ලැහැස්ති නෑ ...."

මේ ප්‍රතාපවත් හඬ මහජන සවනත වැටෙත්ම ජනතාව එක දිගටම ප්‍රීති ඝෝෂා කරන්නට පටන් ගත්හ. ප්‍රීති ඝෝෂා තුනී වී යද්දී ඒ වීරෝදාර ප්‍රතාපවත් හඬ යළිත් ඉස්මතු විය.

"හැබැයි මේක අහල තමුන්නාන්සේලා කලබල වෙන්න එපා. මං දන්නව තමුන්නාන්සේලාගේ දුක. මං දන්නව තමුන්නාන්සේලාගේ වේදනාව. තමුන්නාන්සේලා මිනිසුන්ට කරදර කරන්න එපා. අපි බෞද්ධ දර්ශනයට අනුව අවිහිංසාවාදී වෙමු. ඒකයි මිනිස්කම. මිනිස්කම අබිබවා ගියොත් ඒ අය හිත් පිත් නැති තිරිසනුන් ගණයට වැටෙනවා. අපිට ඒ තත්වයට වැටෙන්න බෑ. අපි මිනිස්කම හඳුනාගත්ත මනුෂ්‍යයෝ...."

"මිනිසාගේ පරම යුතුකම මිනිසාට සේවය කිරීම" යනු බණ්ඩාරනායක මැතිතුමා ප්‍රකාශ කළා වගේ අපි "මිනිසුන්ගේ

යහපතට ක්‍රියා කරමු' .... ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරලා කාටත් සාමයෙන් ඉන්න පුළුවන් යුක්තිගරුක, නීති ගරුක සමාජයක් ගොඩ නගමු .... හැබැයි අපිට ගැහුවොත් පමණක් ඒකත් බලාගමු' යයි ජනතාව ඇලුම් කළ, ජනතාවගේ හදවතට කතා කළ හැකි, නිරසාර ජන නායකත්වයට උරුම වදනින් ජනතා සිත් සතන් තුළට ඇය සම වැදුණාය.

මවකගේ ඇකයේ හඬන දරුවකු නැළවීමට මවගේ මුවින් ගලා යන සෙනෙහෙ බර කාරුණික වදනින් හඬන දරුවා සැනසුනාක් මෙන් ඇය ජනතාවට කරන කාරුණික ඉල්ලීම් දෙස ජනතාව අවනත වූහ. දේශය ගලවා ගන්නට ආ මුර දේවතාවියක් ලෙස ඇයගේ රුව මහජනතාව ඉදිරියේ මැවී පෙණුනාය.

පාර්ලිමේන්තු මැතිවරණය සඳහා නාම යෝජනා පත්‍ර බාර දීමෙන් අනතුරුව රට පුරා දේශපාලන රැස්වීම් පැවැත්වීමට ඒ ඒ දේශපාලන පක්ෂ කටයුතු කළහ. එක්සත් ජාතික පක්ෂ ප්‍රධාන රැලි ඩී. බී. විජේතුංග ජනාධිපති හා අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා ඇතුළු එම පක්ෂයේ මැති ඇමතිවරුන් නියෝජනය කළහ. චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ ප්‍රධානත්වයෙන් පොදු ජන එක්සත් පෙරමුණේ රැස්වීම් පැවැත්විණි. සිරිමා බණ්ඩාරනායක මැතිනිය එහි අවසන් රැලි නියෝජනය කළාය. දිනේෂ් ගුණවර්ධන මහතාගේ නායකත්වයෙන් ම.එ.පෙ. මහජන රැ ලි පැවැත්විණි. ශ්‍රී ලංකා ප්‍රගතිශීලි පෙරමුණේ රැස්වීම් එහි නායක ආරිය බුලේගොඩ මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

94 මැතිවරණය තුළින්ද දොරට වැඩිය ජනරැල්ල මුළු රටේම එකම හඬකින් පොදු පෙරමුණ වටා රොක් වී තිබුණු අයුරුත්, එක්සත් ජාතික පක්ෂයේ බලය ටිකෙන් ටික හීන වන අයුරුත්, දේශපාලන නිරීක්ෂකයන්ට පැහැදිලිවම දක්නට ලැබුණි. වසර 17 ට පසු පාලන තන්ත්‍රයේ වෙනසක් දකින්නට පොදු ජනතාව පොදු පෙරමුණු රැලිවලදී මහත් උද්යෝගයකින් කටයුතු කරනු පැහැදිලිවම පෙනී ගිය දෙයකි.

එක්සත් ජාතික පක්ෂ මැතිවරණ ව්‍යාපාරය පුරා ප්‍රචාරක තේමාව වූයේ උතුරු නැගෙනහිර ප්‍රශ්නය මුල් කොට ගෙනය. ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයේ නායක ඇම්. එච්. ඇම්. අෂ්රොෆ් මහතාත් පොදු පෙරමුණු නායිකා චන්ද්‍රිකා මැතිනිය අතරත් ඇති

රහස් ගිවිසුමක් නිසා වර්තමානයේ රට දෙකඩ විමට ස්ථිර වශයෙන්ම ඉඩ ඇති බැවින් එය වලකාලීමට ඩී.බී.විජේතුංග ජනාධිපතිතුමාට නැවත බලය ලබා දෙන ලෙස ඔවුහු ඉල්ලා සිටියහ.

මහජන එක්සත් පෙරමුණේ ද තේමාව වූයේ චන්ද්‍රිකා - අෂ්රොෆ් රහස් ගිවිසුමක් ගැනය. එක්සත් ජාතික පක්ෂයත් මහජන එක්සත් පෙරමුණත් රහස් ගිවිසුමක් ගැන කතා කළාද, එ.ජා.ප. පාලනයට එරෙහිව කටයුතු කරන බව ම. එ. පෙරමුණේ දේශනවලින් ප්‍රකාශ විණි.

එහෙත් පොදුජන එක්සත් පෙරමුණේ මැතිවරණ තේමාව වූයේ සැකෙන් බියෙන් තොර, යුක්ති ගරුක, සධාරණව ජීවත් විය හැකි උතුම් මිනිස් සමාජයක් බිහිකරමු යන්නය. භීෂණය අවනීතිය රජකළ අධම යුගයක් නිමාකර දුක් විඳින ජනතාවට හිත සුව පිණිස ජනතා නායකත්වයෙන් පරිපූර්ණ නිරසාර රජයක් බිහිකරන්නට ඇවැසි ජනතා වරම ලබා දෙන ලෙස බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය ජනතාවගෙන් ඉල්ලීමක් කළාය.

පොදුජන එක්සත් පෙරමුණ විසින් රටපුරා ගෙන ගිය මැතිවරණ සටනේ අඛන්ඩ සෘජු හරය එය විය. ඇගේ එම ඉල්ලීමට ජනතාව කන් දුන්හ. ඇය වෙත ඔවුන් සිය විශ්වාසය පළ කළහ. ඇගේ මෙම නිහතමානී ආයාචනය අලුත් වෙනසක් බලාපොරොත්තුව සිටි ජනතාවට නව ජීවියක අරුත එක්කළ පවන් රොදක් විය.

පොදු ජන එක්සත් පෙරමුණට එරෙහි වූ සියලුම දේශපාලන පක්ෂ චන්ද්‍රිකා මැතිනියගේ පෞද්ගලික ජීවිතය වටා මඩ ගැසීම දිගටම කර ගෙන ගියහ. එසේ වුවද විරුද්ධවාදීන්ගේ මඩ ප්‍රහාර සහ අවලාද නොතකා ඍජුව, අවංකව, නිර්භීතව ජනතාව හමුවට ගිය හැම රැලියකදීම මහජන සන්නිපාතයක් පෙළ ගැසීම විශේෂ සිද්ධියක් විය.

පොදු පෙරමුණු රැස්වීම්වලට පැමිණෙන පිරිස වළකාලන්නට විරුද්ධවාදීහු බස් සේවා අඩපණ කළහ. විදුලිය සිඳිම් වරින් වර ඇති කළහ. එහෙත් ඒ සියලු බාධක මැඩගෙන ජනතාව පා ගමනින් සැතපුම් ගණන් දුර ගෙවා ලොරි, ට්‍රැක්ටර්, පා පැදි උපයෝගී කර ගනිමින් චන්ද්‍රිකා මැතිනියගේ මහජන රැලිවලට උර දුන්හ.

මහ මැතිවරණ සමයේ රට පුරා සිව් දිගම ජනතාව ඇමතූ චන්ද්‍රිකා මැතිනිය නැගෙනහිර පළාතේ කළ සංචාරය ඉතා වැදගත් එකකි. මේ ගමනේදී මුස්ලිම් කාන්තාවන් විසින් ඉමහත් හරසරින් ඇය පිළිගනු ලැබුවේ භක්ත්‍යාදාරය වෙලී ගිය සොම්නසකිනි.

විරුද්ධ වාදීන්ගේ මරණ තර්ජන ගර්ජන මැද අභීතව රටපුරා ජනතාව අමතමින් ගිය ඇයට හැම අතම දිස් වූයේ හරසරින් පිළිගැනෙන ජය හඬය. අහසට නැගුණු දෙඅත්වල සැලෙන නිල් -රතු කොඩිය. තැන තැන සුබ පතමින් නැගෙන ජයඝෝෂා හඬය.

ඈ යන මහ දෙපස නිල් - රතු කොඩි හා සැරසිලිවලින්ද පිරී පැවතිණ. ඇය වේදිකාවට අවතීර්ණ වීමට පෙර ජනතාව විසින් නැගූ ප්‍රීති ඝෝෂා නිමා වීමට සමහර අවස්ථාවල විනාඩි 10 - 15 අතර වූ අවස්ථාද එළැඹ තිබුණි.

"බස්නාහිර පළාතෙන් ලැබූ ජනවරම තුළින් අපි දකුණු පළාතට ගියා. එයින් ලැබූ ශ්‍රේෂ්ඨ ජනවරම ශක්තිය අරගෙන අපි මුළු රටේම ජනතා අතරට ආවා. ලබන මහ මැතිවරණයෙන් අපි ලබන ජය තුළින් අපි උතුරට යනවා. ගිහිං සාකච්ඡා කරලා ශ්‍රී ලංකාව තුළ පවතින භීෂණය, යුද්ධය තුරන් කරලා ගලාගෙන යන ලේ ගංගාව අපි නතර කරනවා." යනුවෙන් ඇය මහජනතාවට ප්‍රකාශ කළාය. අරුත් බර, පැහැදිලි, හිස් ප්‍රලාපයන්ගෙන් තොර ඇගේ වදන් ජනහද අමතන විට, අවදි වූ ජනහඬ, නියත වශයෙන්ම 94 මැතිවරණයේදී ජනවරම හිමි කරන ලදී.

"වෛරයෙන් වෛරය නොයන්සිදේ" යන බුදු වදනට අනුව 'ඡන්දයෙන් පසු ගැටුම් ඇතිවීම වළක්වා ගැනීමට ඉටා ගන්නැ'යි ඇය මැතිවරණයට පෙර ජනතාවගෙන් ඉල්ලීමක් කළාය. ඡන්ද කම්වූ සාම කම්වූ ලෙස ක්‍රියා කළ යුතු බවට ඈ කරුණු පැහැදිලි කළාය.

පොදු ජන පෙරමුණේ ප්‍රතිපත්ති හා උදාර අරමුණු කෙරෙහි මහජනතාව රොක්වී පෙළ ගැසී සිටින බවත් රටේ ජනතාව ස්ථිරවම පොදු පෙරමුණ බලයට පත්කිරීමට එක්රොක් වෙමින් ස්ථිර අදිෂ්ඨානයකින් කටයුතු කරන නිසා ජයග්‍රහණය වළක්වා ලීමට නොහැකි බව 94 අගෝ: 14 වැනි දින සිළුමිණ පුවත් පතට ලියූ ඇගේ ලිපියකින් ස්ථිරවම ප්‍රකාශ කෙරිණි.

මරණයේ දේශය බවට පත්ව ඇති මේ රට ජීවත්වීමේ දේශයක් බවට පත්කරලීමේ උදාර අරමුණින් ජනතාවගේ විශ්වාසය මත යන මේ ගමන තුලින්, පොදු ජන එක්සත් පෙරමුණේ ආධාර කරුවන් කිසිවෙක් හිංසා, පීඩා හා ප්‍රකෝප කිරීම් වලට අබමල් රෝනක තරම්වත් රුකුලක් නොදෙන බවට ඇ තරයේ විශ්වාස කළාය.

මැතිවරණය ආරම්භයේ සිටම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නියෝජ්‍ය නායිකාව වශයෙනුත් පොදු ජන එක්සත් පෙරමුණේ අගමැති අපේක්ෂිකාව වශයෙනුත්, වචනයෙන් මෙන්ම ක්‍රියාවෙන් ද ඇප කැපව මැතිවරණයෙන් පසු භීෂණ සිද්ධීන් වලක්වා ගැනීමට තම ආධාර කරුවන් ගෙන් හා පොදුවේ සියලුම රට වැසියන් ගෙන් ඇය ඉල්ලා සිටියාය. 94 අගෝ: 16 වැනිදින මැතිවරණ ඡන්ද ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු "අපේ මැතිවරණ කමිටු තම තමන් නියෝජනය කරන ප්‍රදේශවල සාමය රකින කමිටු බවට පත්විය යුතු" යැයි ඇය කියා සිටියාය. පොදු පෙරමුණේ ජයග්‍රහණයෙන් පසු රටේ කොතැනක හෝ සුළුවෙන් වුව ගැටුමක් ඇති නොවීමට වග බලා ගන්නා ලෙස ඇය ජනතාවගෙන් ඉල්ලීමක් කළාය. එසේ වුවහොත් පොදු ජන ආණ්ඩුවක් පිහිටුවා ගැනීමේ උදාර ක්‍රියාවලියට බාධාවක් ඇති වන බවත් එය අප විසින් අපටම කර ගන්නා ද්‍රෝහිකමක් බවත්, තරයේ සිත තබා ගන්නා ලෙස ඇය අවධාරණය කළාය.

අපේ ප්‍රතිවාදීන් සමග ඔවුන්ට ඡන්දය දුන් සියලුමදෙනා සමග එක්ව වාද භේද දුර හැර කැවුම් කිරිබත් අනුභව කොට නව පොදු ජන සමාජයකට පිවිසෙන ලෙස ඇය මහජනතාව වෙත ඉතා ඕනෑකමෙන් ආයාචනය කළාය.

සියලුම විශ්ව විද්‍යාල ප්‍රශ්න විසඳා නේවාසික පහසුකම් ලබා දී විශ්ව විද්‍යාල අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩි කර උසස් මට්ටමේ ගුරු සේවයක් ඇති කරන බවටත්, කාන්තාවන්ට සමතැනද, දෙවසරක් ඇතුළත රැකියා දසලක්ෂයක් ලබා දී දුප්පත්කම නැති කිරීම හා සමෘද්ධිය උදා කිරීමේ නව ව්‍යාපාර ඇති කර නව ආර්ථික පිබිදීමක් ඇති කරන බවට පොදු ජන එක්සත් පෙරමුණ ප්‍රකාශ කළහ.

පෙට්‍රල් හා ඩීසල් මිල අඩු කිරීමෙන් අත්‍යවශ්‍ය ආහාර මිල අඩු කරන්නටද ගොවීන්ට නව විශ්‍රාම වැටුප් ක්‍රමයක් හා රක්ෂණ

ක්‍රමයක් හඳුන්වා දී කල්ගත වූ ගොවි ණය කපා හරින්නටද, නිදහස් ආර්ථික රාමුවක් තුළ ශක්තිමත් දේශීය ආර්ථිකයක් ගොඩ නගා දේශීය හා විදේශීය පෞද්ගලික අංශයට ප්‍රමුඛස්ථානයක් ලබා දීමටද, කර්මාන්ත ක්ෂේත්‍රයේ පැහැදිලි හා දුර දක්නා සැලසුමක් මත සංවර්ධනය කිරීමට නව රජයක ප්‍රතිපත්ති බව ඇය පැහැදිලි කළාය.

අඩු ආදායම්ලාභීන්ට සිය ආදායම් අනුව මසකට රු. 2000/- විශේෂ දීමනාවක්ද රැකියාවක් ලැබෙන තෙක් තරුණ තරුණියන්ට මසකට රු. 1500/- ක දීමනාවක්ද, ජලබද්ද ඉවත් කර සහනාධාර ලබාදීමටද පියවර ගන්නා බවද සඳහන් කළාය.

ළදරුවන්ගේ හා මව්වරුන්ගේ මන්ද පෝෂණය නැති කර පාසල් වයසේ සෑම දරුවෙකටම පාසලක් ලබා දීමට පියවර ගන්නා බව සහතික කර ඇත. මෝටර් සයිකල් හා ත්‍රි රෝද රථ ආනයනයට අය කෙරෙන බද්ද අහෝසි කිරීමටද මැතිවරණ ප්‍රකාශණයෙන් කරුණු දක්වා ඇත. නගරබද හා වෙරළ බඩ පැල්පත් වාසීන්ටත්, ග්‍රාමීය ජනතාවටත් වඩා හොඳ නිවාස ලබා දීමට පියවර ගැනීමත්, වතුකරයේ කම්කරු ජනතාවගේ නිවාස, අධ්‍යාපන හා පොදු පහසුකම් ප්‍රශ්න විසඳීමට විශේෂ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීමටද පියවර ගන්නා බව පැහැදිලි කර ඇත.

විශ්‍රාමික වැටුප උපරිමය දක්වා සකස් කළ විශ්‍රාම වැටුප් ක්‍රමයක් ලබා දීමටත්, විවේකය කැප කරමින් දිවා රෑ සේවය කරන පොලිසිය හා ත්‍රිවිධ හමුදා සාමාජිකයන්ට විශේෂ සේවාවන් වෙනුවෙන් ප්‍රමාණවත් වැටුපක් හා ගෞරවනීය දීමනා පහසුකම් ලබා දෙන බවද පැහැදිලි කර ඇත.

මාධ්‍යවේදීන්ගේ රැකියා සුරක්ෂිත කර සාධාරණ වැටුප් ක්‍රමයක් ලබා දී, ප්‍රාදේශීය වාර්තාකරුවන්ගේ වැටුප් හා දීමනාද වැඩි කිරීමට යෝජනා කිරීමටද, මනාව සැකසුණු වැටුප් තලයක් මේ සඳහා පදනම් කර ගැනීමට බලාපොරොත්තු වන බවද අවධාරණය කර ඇත.

සිදු වී ඇති මිනීමැරුම්, අතුරුදහන් වීම් හා අභිරහස් අපරාධ පිළිබඳව සොයා බැලීමට විශේෂ කමිටුවක් පත් කරන බවද, රාජ්‍ය සේවයේ ගෞරවය සහ විවෘත බව ආරක්ෂා කිරීමටද අල්ලස හා

දූෂණය පිටු දැකීමට කටයුතු කිරීමට ස්ථාවර කොමිසමක් පත් කරන බවද, සිංහල බෞද්ධ බහුතරයේ අයිතිය තහවුරු කර ආරක්ෂා කරන බවද අප රටේ ජීවත් වන සියලු ජාතීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර දීම තම පක්ෂයේ අරමුණ බව පොදු ජන එක්සත් පෙරමුණේ මැතිවරණ ප්‍රකාශය මගින් චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය ප්‍රකාශ කර සිටියාය.

මේ අනුව 1994 මහ මැතිවරණය නව පිටුවක් පෙරළමින් නිති ගරුක, සාධාරණ මැතිවරණයක් තුළින් පොදු ජන එක්සත් පෙරමුණට ජය අත් වී නව යුගයක ජනතා පැතුම් උදා කරන්නට ජනවරම ලැබුණි.

# චන්ද්‍රිකා යුගයේ ආරම්භය

1994 මහ මැතිවරණයෙන් ආසන 105 ක් හිමි කර ගත් චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය ශ්‍රී ලංකාවේ දසවන පාර්ලිමේන්තුවේ දෙවැනි කාන්තා අගමැතිනිය ලෙස එම වසරේ අගෝස්තු 19 වැනිදා ශුභ නැකතින් ජනාධිපති මන්දිරයේදී ජනාධිපති ඩී. බී. විජේතුංග මහතා ඉදිරියේ දිවුරුම් දුන්නාය.

ශ්‍රී ලංකාවේ දසවන පාර්ලිමේන්තුවේ නව අගමැතිනිය වශයෙන් අභිෂේක ලද චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය විසින් දියත් කරන වැඩ පිළිවෙල ඔස්සේ ක්‍රියාත්මක කෙරෙන පරිපාලන තන්ත්‍රය දෙස මුළු ලොවම දැඩි අවධානයකින් පසු විය.

ශ්‍රී ලංකාවේ ජාතික දේශපාලනය මත රඳා පවතින ගමන් මගේ හමුවන කටුක අත්දැකීම් බාධක හා බලාපොරොත්තුවේ ගැඹුර වැඩි වන තරමට නව අගමැතිනිය හමුවේ පවතින වගකීමේ පරිමානයද නව නවන් ගැඹුර වැඩි වීම පොදු සාධකයකි. තුන්වන ලෝකයේ රටවල් කීපයකම ජාතික නායකත්වයට පත් වී ජනතා අරගලයේ නියමුවන් අතර කාන්තාවෝ කිහිපදෙනෙකුම ඒ ඒ දේශයන්ට විවිධ වූ දේශීය යථාර්ථයන් පණ පොවමින් අයුක්තියට එරෙහිව සටන් වැදුනාහ.

මිලේච්ඡ කෲර හමුදා ආඥාදායකත්වයට පෑගි සිටි පකිස්ථානු ජනතාව මුදා ගන්නට ගෙන ගිය ජනතා සටනේ නායකත්වය ගෙන කටයුතු කළේ **බෙනාසීර් භූතෝ** නම් වීර කාන්තාවය.

බෙංගාලි දේශයේ ඒකාධිපති පාලනයට එරෙහිව කළ ජනතා අරගලයේ ප්‍රතිවිරුද්ධව සිටි දේශපාලන පක්ෂ දෙකක ශක්තිය දෙපැත්තකින් එකට ගොනු කරමින් වත්මන් අගමැතිනි **බෙගම් කලිදාසි** සහ විපක්ෂ නායිකා **ෂික් හසිනා** ඉතිහාසය තුළට එක් වූවාය.

පිලිපීනයේ කෲර ආඥාදායක පර්ඩිනන්ඩ් මාකෝස්ට එරෙහි විය හැකි ප්‍රබලම අභියෝගය වූ බෙනිනෝ අකිනෝ අභිරහස් ලෙස දේශපාලන ඝාතකයකු අතින් මැරුම් කෑ පසු ඔහුගේ තැන ගනිමින්

ජන අරගලය ඔස්සේ දේශපාලන ප්‍රතිසංස්කරණ ක්‍රියාදාමය ජාතික නායකත්වයට පණ පෙවූ නායිකාව වූයේ **කොරාසොන් අකිනෝය.**

බුරුම සමාජ වාදය මුවාවෙන් පෝරිසාද මිලේච්ඡ කෲර හමුදා කල්ලියක් ගෙන ගිය පාලනයට එරෙහිව ප්‍රජාතන්ත්‍රවාදයට නව පණක් එක් කළේද උපන් බිමේ තම මහගෙය තුළ දේශපාලන සිරකාරියක් බවට පත්ව සිටියදීත් ජනතා අරගලය අදත් මෙහෙයවන වීර කාන්තාවක් ලෙස **අවුංසාං සූකී** ඉතිහාසයට එක්ව සිටින්නීය.

දුක් විඳින ජනතාවගේ කඳුළු පිස දැමීමට, ජනතාව අතරට මැදිව මර්දනයේ ගිනි සිළු අතර දැවෙමින් ඇමරිකා කලාපයේ සමාජ අසාධාරණයට එරෙහිව පැන නැඟුන අරගලයේ ප්‍රජා නායිකාව ලෙස නොබෝදා නොබෙල් සාම ත්‍යාගයෙන් පිදුම් ලැබූයේ **රිගොබර්තා මෙංචු** නම් වීර කාන්තාවය.

ජගත් කීර්තියට පත් සමකාලීන ස්ත්‍රී වංශ කතාවේ විරෝධාර ප්‍රතාපවත් නාමාවලියට ශ්‍රී ලංකාවේ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ශ්‍රේෂ්ඨ ජනනායිකාවගේ නමද රන් අකුරින් සටහන් වනු ඇත.

ඇය දේශපාලනයට පිවිසී ඇත්තේ අහම්බෙන් නොව දේශපාලන මාවත පුරා අඩ සියවසකට ආසන්න කාලයක සිට ගිරිදුර්ග, කඳු පල්ලම්, වට වංගු, කටු කොහොලින් හා මරුවැල්ද පතිමින් ලත් ආභාශයත් සමගය. දේශපාලන චින්තන රූපක් එකට සංකලනය කරමින් පොදුජන හිතවාදී ප්‍රතිපත්ති රූපකටම ජීවය කවමින් අද ඇය පැමිණ සිටින්නේ දේශපාලන ප්‍රභූත්වයේ අසාමාන්‍ය කඳු මුදුනටකටය.

ජනතාව තම දෙපා මුලට එනතුරු බලා නොසිට නගරයේ මෙන්ම ගම් - නියම්ගම් පුරා ජනතාව ලැහුම් ගෙන සිටි මහ මන්දිරයේ සිට අතුපැල දක්වා තම දෙපයින් ගොස් ජනතාව සමඟ පෙරට යාමට පැකිලීමකින් තොරව ඇය ගත් වෙහෙස ජන හදවත් තුළ නොමැකෙන සිහිවටන අතරට කිඳා බැස ඇත්තේය. රතු විල්ලුද පලසක් මතින් පූජ්‍ය සම්මානයට පාත්‍ර වෙමින් තමන් කැඳවා රන් තැටියක තැන්පත් කළ ආණ්ඩු බලයේ සන්නස් පත්‍රය ගෞරව පූර්වකව තමන්ගේ පූරතට පත්කිරීමට රටේ ජනතාව සැදී පැහැදී සිටිතැයි යන්න ඇය කිසිසිටෙකත් නොසිතුවාය. ජනතා

සිතුම් පැතුම් තුළ ඇ දිදුලන මාණික්‍යයක් වූවාය. ඇය වචනයේ පරිසමාප්තියෙන්ම පීඩිත ජනතාවගේ හදවතේ නැඟෙන රිද්මය හඳුනා ගත්තාය.

ඈත අතීත ශ්‍රී විභූතිය දෙස බලන කල විහාර මහා දේවි වැනි වීරෝධාර කාන්තාවන් බිහිවුණ යුගයක එවන් හැම කාන්තාවකම ජාතියට මවක වූවාය. මාතෘ සෙනෙහසින් ජනතාවගේ ආදර ගෞරවයට පාත්‍ර වූවාය.

සිය දරු තිදෙනාට පමණක් නොව මුළු මහත් ජාතියටම සෙනෙහෙබර මවක වූ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය මීට තිස් හතර වසරකට පෙරාතුව ලොව එකම කාන්තා අගමැතිනිය බවට පත් වෙමින් දේශපාලන ප්‍රතිවාදීන්ගේ තාඩන පීඩන වලට හා අභියෝග වලට මුහුණ දෙමින් අවමානයෙන් පිරුන දුෂ්කර මාවතේ අභීත ලෙසින් තරණය කර දේශපාලන ඉතිහාසයේ නව ජය ටැඹක් ඉදිවූ මොහොතක සිය ප්‍රණාමය හා කෘතවේදීත්වය පළ කරනු වස් මාතෘ පක්ෂයට ජනතාව දුන් අත් පොළසන් හඬ යළි. චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ වීරෝධාර ජනතා නායකත්වයට ලැබීම අරුමයක් නොවේ.

මැතිවරණයකදී ඒ ඒ දේශපාලන පක්ෂ නිකුත් කරන ප්‍රතිපත්ති හා පොරොන්දු මහජනතාව විසින් තෝරා බේරා ගෙන වඩාත්ම ජනතා පැතුම් සපිරෙන පක්ෂයකට සිය කැමැත්ත ඡන්දය මගින් ප්‍රකාශ කිරීමෙන් අනතුරුව එම පක්ෂය එකී පොරොන්දු ඉටු කිරීම පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය තුළ එකිනෙකට වෙනස් වන අවස්ථා දෙකකි. නව ජනපතිනිය ප්‍රවිෂ්ඨ වී සිටින්නේ ජනතා පාර්ශවයේ වඩාත් වැදගත් ඉසව්වකටය.

මේ අනුව අනාගත පරපුරේ අත්පොළසමට පාත්‍රවීමට ඇයගේ නව ආකල්ප හා ප්‍රතිපත්ති අකුරටම ඉටු කර ජනතාවගෙන් ලබන ප්‍රගති වාර්තාව අනුව රටේ ජනතාවගේ ජන වරම ලබා ගත යුතුය. එය ඇයගේ උදාර කාර්යභාරයක් බව දැන් සිටම අවබෝධයෙන් කටයුතු කිරීම ඇය තුළ ඇති නායකත්වයේ සුවිශේෂ ගුණාංගයකි.

අර්බුදකාරී පාලන තන්ත්‍රයක් පසුකර මෙරට ජාතික ඉතිහාසයේ දේශපාලනමය, සංකීර්ණ වූ ආණ්ඩුවක් මහජන සිතුම් පැතුම් සපුරා ලන මාවතක හසුරුවාගෙන යාමේ ඉතා දුෂ්කරවුත්

කාර්යභාරයකට යොමුකරවීමේ අසීරු කර්තව්‍යයක් ඉටුකරන්නට ඇය පෙරමුණ ගෙන සිටින්නීය.

වාමාංශික දේශපාලන පක්ෂය සංකලනයෙන් විවිධ මත එක් ප්‍රතිපත්තියක් මත පිහිටුවා ස්ථාවර කර ගත් පොදු ජන එක්සත් පෙරමුණේ සමගිය පවත්වා ගැනීමට ඇය මෙතෙක් දැක්වූ කුශලතාවය ඉදිරියේ ඇති දුෂ්කරතා ජය ගැන්මට ප්‍රබල අවියකි. පොදු පෙරමුණේ නියෝජ්‍ය නායිකාව ලෙස මෑත දේශපාලන මෙහෙයුමේදී දැක් වූ කුශලතාවය, ඉදිරියේ ඇති බාධක ජයගන්නට දක්වන පෙරහුරුවක සේයාවක් වූවාය.

සිය පක්ෂයේ ප්‍රාදේශීය බල පදනම හා නායකත්වය තුළින් මෙරට වාමාංශිකයේ විජයග්‍රහණය ලෙස දකුණේ ජයග්‍රහණය සැලකිය හැකි අතර එහි රශ්නය පිටම විවෘත ආර්ථිකය පැලපදියම්වී ඇති අගනුවර වෙළඳ සිටුවරුන්ගේ හා ආයෝජක ධනේශ්වරයින්ගේ බිය - සැක දුරුකරන්නට ඉදිරිපත් වූවා පමණක් නොව නැවතත් දකුණට ගොස් සිය සෙන්පතියන්ගේ දායකත්වයෙන් 94 මැතිවරණය ජය ගන්නට මග පාදා ගැනීමට ඇය සමත් වූවාය. තනි දෘෂ්ටියකින් යුත් විනය ගත පක්ෂයක් ලෙස ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආරම්භයේ සිට නොපෙනුනද දක්ෂිණාංශිකයින්ගේ හා දැඩි වාමාංශිකයන් දක්වා විවිධ බලවේග වලින් සැදුම් ලත් සුවිසාල දේශපාලන සංකීර්ණයක් සේ නැවත පොදු පෙරමුණ නැමති සංධානයකට එක්කර ගැනීමට චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය දැක් වූ වෙහෙස දේශපාලන ඉතිහාසය තුළ සැබැවින්ම කිඳා බැස ඇත්තේය.

තම පක්ෂය තුළ සමබර තාවය වර්ධනය කර පවත්වා ගෙන යාමට ජනපතිනිය දක්වන හැකියාව හා කුශලතාවය මත චන්ද්‍රිකා යුගයේ සාර්ථකත්වය රඳා පවතිනු ඇත.

මෙම කාර්ය සාර්ථක කර ගැනීමට නිසැකයෙන්ම දේශපාලන දුෂ්කර ක්‍රියාවක නියැලිය යුතු බවත්, එය සාර්ථකව ජය ගැනීමට ඇයට හැකිවනු ඇතැයි පොදු ජනතාව තබා ඇති විශ්වාසය මහ මෙරකට සමකල හැකිය.

94 දේශපාලන පෙරළියකටට තුඩු දුන් නව ප්‍රවේශයන් නිසා පක්ෂ සංධානය පලල් වි ඇත. එහි ප්‍රධාන අන්තර් ගතය තුළ මෙම සංකීර්ණත්වය පොදු ජන එක්සත් පෙරමුණ නමැති වඩාත් සුවිසාල වූ සංකීර්ණය තුළ නවත් පැහැදිලිව කැපි පෙනෙති.

# මැතිවරණ ගමන් මග

ප්‍රථම පාර්ලිමේන්තු මැතිවරණය 1947 වසරේ පවත්වා ඇත. මෙම මැතිවරණයට පක්ෂ 09 ක් සහ ස්වාධීන අපේක්ෂකයින් 181 දෙනෙකු ඉදිරිපත් වී ඇත. ආසන 95 ක් සඳහා පාර්ලිමේන්තු නියෝජිතයන් 101 දෙනෙකු පත්කර ගන්නා ලද අතර පත් කළ මන්ත්‍රීවරු වශයෙන් 06 දෙනෙකුද ඒ අතර වූහ.

ප්‍රථම පාර්ලිමේන්තු මැතිවරණයෙන් එක්සත් ජාතික පක්ෂය ආසන 42 ක් ලබා ලංකාවේ ප්‍රථම ආණ්ඩුව පිහිටුවා ඇත. ලංකා සම සමාජ පක්ෂය, කොමියුනිස්ට් පක්ෂය, ලෙනින්වාදි පක්ෂය ඇතුලු වාමාංශික කොටස් ආසන 18 ක් හිමි කර ගෙන ඇත. ද්‍රවිඩ කොංග්‍රසය ආසන 07 ක් ලබා ගත් අතර ඉන්දියන් කොංග්‍රසය ආසන 06 ක් ලබා ගන්නා ලදි. ශ්‍රී ලංකා මැතිවරණ ඉතිහාසයේ ස්වාධීන අපේක්ෂකයින් වැඩිම සංඛ්‍යාවක් වූ 21 දෙනෙකු තේරී පත් වූයේද මෙම මැතිවරණයෙනි.

## 1952 මැතිවරණය

1952 මැයි මාසයේ මෙම මැතිවරණය පවත්වා ඇත. දින හතරක් පුරා පවත්වනු ලැබූ මෙම මැතිවරණයට දිවංගත එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මැතිඳුන්ගේ නායකත්වයෙන් ප්‍රථම වරට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තරගයට එක්ව ඇත. ප්‍රධාන පක්ෂවලින් අපේක්ෂකයින් 305 ක් හා ස්වාධීන අපේක්ෂකයින් 85 දෙනෙකු තරග බිමට එක් වූහ.

මෙම මැතිවරණයේදී ඡන්ද 10,26,005 ක් ලබා එක්සත් ජාතික පක්ෂය ආසන 54 ක් ලබා ගෙන ඇත. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හා ලංකා සම සමාජ පක්ෂය ලබා ගෙන තිබුණේ ආසන 09 කි. කොමියුනිස්ට් පක්ෂය හා විප්ලවකාරී සම සමාජ පක්ෂය ආසන 04 ක් හිමි කර ගෙන තිබුණි. ද්‍රවිඩ පක්ෂවලින් නියෝජිතයන් 06 ක් සහ එක් ආසනයක් කම්කරු පක්ෂයටද හිමි විණි. 1947 මැතිවරණය සඳහා 55.4%ක් ඡන්දය පාවිච්චි කර තිබූ අතර මෙම මැතිවරණයේදී එය 70.7% දක්වා වර්ධනය විය. 1952 මැතිවරණයෙහිදීද එක්සත් ජාතික පක්ෂයට ආණ්ඩුවක් පිහිටුවීමට හැකිවී ඇත.

## 1956 මැතිවරණය

මෙම මැතිවරණය 1956 අප්‍රේල් මස 06. 07. සහ 10 යන තෙදිනක් තුළ පවත්වා ඇත. මැතිවරණ ඉතිහාසයේ පෙරළිකාර මැතිවරණයක් බවට පත් වූ මෙම මැතිවරණයෙන් එක්සත් ජාතික පක්ෂය ආසන 08 ක් දක්වා පහත වැටී හතර වන ස්ථානයට පත් විය.

දිවංගත එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මැතිඳුන්ගේ නායකත්වයෙන් පිහිටුවා ගත් මහජන එක්සත් පෙරමුණට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හා විප්ලවකාරී සම සමාජ පක්ෂය දායකත්වය ලබා දී ඇත. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකත්වය දිවංගත බණ්ඩාරනායක මැතිඳුන් හෙබවූ අතර විප්ලවකාරී සම සමාජ පක්ෂයේ නායකත්වය දිවංගත පිලිප් ගුණවර්ධන මැතිඳුන් දරා ඇත.

බණ්ඩාරනායක මැතිඳුන් නායකත්වය දැරූ මහජන එක්සත් පෙරමුණ ආසන 51 ලබා නව ආණ්ඩුවක් පිහිටුවනු ලැබූ අතර මෙම මැතිවරණයේදී ලංකා සම සමාජ පක්ෂය ආසන 14 ක් හා ෆෙඩරල් පක්ෂය ආසන 10 ක් ලබා ගෙන ඇත. කොමියුනිස්ට් පක්ෂය දිනා ගනු ලැබුයේ ආසන 03 කි. ස්වාධීන අපේක්ෂකයින් ආසන 08 ක් ලබා ගෙන තිබූ අතර ද්‍රවිඩ කොංග්‍රසයට හිමි වූයේ එක් අසුනකි. ලෙස්ලි ගුණවර්ධන, විවියන් ගුණවර්ධන හා රොබට් ගුණවර්ධන, පිලිප් ගුණවර්ධන හා කුසුමා ගුණවර්ධන ඇතුළු අලුත් මුහුණු රැසක් එම මැතිවරණයෙන් පාර්ලිමේන්තුවට පත් වූහ.

එම මැතිවරණයේදීම ජේ. ආර්. ජයවර්ධන මහතා කැළණිය ආසනය වෙනුවෙන් ආර්. ජී. සේනානායක මහතා සමග තරග කොට පරාජය වූ අතර රුවන්වැල්ල ආසනය සඳහා තරඟ කොට ආර්. ප්‍රේමදාස මහතා පරාජයට පත් වූයේ ආචාර්ය ඇන්. එම්. පෙරේරා මහතාටය.

## 1960 මැතිවරණය (මාර්තු)

1960 මාර්තු 19 වැනි දින මෙම මැතිවරණය පවත්වා ඇත. එක් දිනක් තුළ මුළු රටේම මැතිවරණය පැවැත්වීමට හැකිවීම

විශේෂ සිද්ධියකි. මීට පෙර පැවැත්වූ හැම මැතිවරණයක්ම දින කිහිපයකදී සිදුවී ඇත. මෙම මැතිවරණයේදී ඡන්ද කොට්ඨාශ නව ප්‍රතිසංස්කරණයට ලක්ව ඒ අනුව තවත් ඡන්ද කොට්ඨාශ ගණනක් අලුතින් බිහිවිය.

ඡන්ද ප්‍රචාරක වැඩ සඳහා ආගමික ස්ථාන යොදා ගැනීමත්, ඡන්ද දායකයින් වාහන වලින් ගෙන යාමත් සපුරා තහනම් කරනු ලැබීම මෙම මැතිවරණයේ සුවිශේෂ සිද්ධියකි. දේශපාලන පක්ෂ විස්සක් මෙම මැතිවරණයට ඉදිරිපත්වී ඇත. ඉදිරිපත් වූ සම්පූර්ණ අපේක්ෂකයින් ගණන 732 කි. ස්වාධීන අපේක්ෂකයක් 167 දෙනෙක්ද ආසන සඳහා තරග වැදී ඇත.

මෙම මැතිවරණයෙන් එක්සත් ජාතික පක්ෂයට ආසන 50ක් ලබා ගැනීමට හැකි විය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ලබා ගැනීමට හැකිව තිබුණේ ආසන 46 කි. ෆෙඩරල් පක්ෂය ආසන 15ක්ද, ලංකා සමසමාජ පක්ෂය ආසන 10ක්ද, මහජන එක්සත් පෙරමුණ ආසන 10ක්ද, ලංකා ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය වෙනුවෙන් ආචාර්ය දහනායක මහතාගේ ප්‍රධානත්වයෙන් තරඟ කොට ආසන 04ක්ද, ලබා ගෙන ඇත නමුත් ආචාර්ය දහනායක මහතාට ගාල්ල ආසනය අහිමි විය. කොමියුනිස්ට් පක්ෂය ඊට අතිරේකව ආසන 03 ක්ද ලබාගෙන තිබුණි. 70.6% ක ප්‍රමාණයක් මෙම මැතිවරණය වෙනුවෙන් ඡන්දය පාවිච්චි කර ඇත. හිටපු ජනාධිපති ආර්. ප්‍රේමදාස මහතා ප්‍රථම වතාවට මැද කොළඹින් පාර්ලිමේන්තුවට පිවිසියේ මෙම මැතිවරණයේදිය. ගම්පහ ආසනයෙන් එස්. ඩී. බණ්ඩාරනායක මහතා පාර්ලිමේන්තුවට පිවිස ඇත්තේ බෝසත් බණ්ඩාරනායක පෙරමුණ වෙනුවෙන් තරග වදිමිනි.

## 1960 මැතිවරණය (ජුලි)

1960 මහ මැතිවරණයෙන් ජයගත් එක්සත් ජාතික පක්ෂයට බලයේ සිටින්නට හැකි වූයේ මාස තුනකි. ලබාගත් ආසන ගණන අඩු වීමෙන් විපක්ෂය බලවත් වීම නිසා රාජාසන කතාවෙන් එක්සත් ජාතික පක්ෂය පරාජය වීමෙන් නැවත මහ මැතිවරණයක් පැවැත්වීමට සිදුවිය. ඒ නිසාම මෙම මැතිවරණය මැතිවරණ ඉතිහාසයේ බලවත් පෙරළියකට පත්විය.

1960 ජූලි මස පැවැත් වූ මෙම මැතිවරණයේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හා ලංකා සමසමාජ පක්ෂය ඇති කරගෙන තිබූ නිතරග ගිවිසුම අනුව අපේක්ෂකයින් 75 දෙනෙකු පාර්ලිමේන්තුවට පත්කර ගැනීමට හැකි විය. එක්සත් ජාතික පක්ෂයට ලැබුණේ ආසන 30 කි. ෆෙඩරල් පක්ෂයට ආසන 16 ක් ලබා ගැනීමට හැකි වූ අතර ලංකා සම සමාජ පක්ෂය හිමි කර ගත්තේ ආසන 12 කි. කොමියුනිස්ට් පක්ෂය ලබා ගත්තේ ආසන 04 කි. මහජන එක්සත් පෙරමුණ ආසන 03 ක් හා ස්වාධීන අපේක්ෂකයින් ඇතුළු අනෙකුත් කුඩා පක්ෂ හිමි කර ගෙන තිබුණේ ආසන 12 කි.

මෙම මැතිවරණයට සිරිමා බණ්ඩාරනායක මැතිනිය ඉදිරිපත් නොවිය. සෙනෙට් සභාව වෙත පත් කර ගත් බණ්ඩාරනායක මැතිනිය සෙනෙට් සභාවෙන් අගමැති තනතුරට පත් වූ ලෝකයේ ප්‍රථම කාන්තා අගමැතිනිය ලෙස එතුමිය ඉතිහාසයට එක් විය.

ෆිලික්ස් ඩයස් බණ්ඩාරනායක, ලක්ෂ්මන් ජයකොඩි, ගාමිණී ජයසූරිය යන මහතුන් පාර්ලිමේන්තුවට පත් වූ අලුත් මුහුණු අතරට එක් වූහ. තොණ්ඩමන් මහතා මෙවර පාර්ලිමේන්තුවට පත් වූයේ පත් කළ මන්ත්‍රිවරයෙකු ලෙසිනි.

## 1965 මැතිවරණය

1965 මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂයේ නායකත්වය දැරුවේ දිවංගත ඩඩ්ලි සේනානායක මැතිතුමන්ය. ආසන 66 කට හිමිකම් ලැබූ එක්සත් ජාතික පක්ෂය සී. පී. ද සිල්වා මහතාගේ ශ්‍රී ලංකා නිදහස් සමාජවාදී පක්ෂය සඳහා ආසන 05 ක නිතරග ගිවිසුමකට එළඹ තිබුණි.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ලබා තිබුණේ ආසන 41 කි. ලංකා සමසමාජ පක්ෂය ආසන 14 කි. කොමියුනිස්ට් පක්ෂය ආසන (මොස්කව්) 09 ක්ද, ද්‍රවිඩ කොංග්‍රසය ආසන 03ක්ද, අනෙකුත් ස්වාධීන අපේක්ෂකයින් 06 දෙනෙකු ද පාර්ලිමේන්තුවට තේරී පත්විය.

ප්‍රථම වතාවට ශ්‍රී ලංකා මැතිවරණ ඉතිහාසයේ 80% ක ප්‍රමාණයක් ඡන්දය පාවිච්චි කර ඇත්තේ මෙම මැතිවරණය තුළිනි. මෙම අවස්ථාවේදී ඩඩ්ලි සේනානායක මහතා පිහිටවූ සභාග

රජයට පෙඩරල් පක්ෂයේ ආසන 14ක්ද, කේ. එම්. පී.රාජරත්තන මහතාගේ නායකත්වයෙන් යුත් ජාතික විමුක්ති පෙරමුණ එක් ආසනයක්ද, මහජන එක්සත් පෙරමුණේ පිලිප් ගුණවර්ධන මහතා, පත්කළ මන්ත්‍රී තොණ්ඩමන් මහතාත් සමග එක්සත් ජාතික පක්ෂය සහාග ආණ්ඩුවක් පිහිටුවන ලදි. ප්‍රථම විරුද්ධ පක්ෂ නායිකාව ලෙස සිරිමා ආර්. ඩී. බණ්ඩාරනායක මැතිනිය පත් වූවාය.

## 1970 මැතිවරණය:

1970 මැතිවරණයේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ සමගි පෙරමුණ රජය ආසන 91 ක්ද, ලංකා සමසමාජ පක්ෂය ආසන 19 ක්ද, කොමියුනිස්ට් පක්ෂය ආසන හයක්ද (06) එකතුව ආසන 116 ක් ලබා ගෙන සමගි පෙරමුණු රජයක් පිහිටුවන ලදි. එක්සත් ජාතික පක්ෂය මෙවර මැතිවරණයෙන් ලබා ගත්තේ ආසන 17 කි. පෙඩරල් පක්ෂය ආසන 13 ක්ද, ද්‍රවිඩ කොංග්‍රසය ආසන 03 ක්ද ස්වාධීන ආසන 02 ක්ද, ලබා ගෙන තිබුණි.

මෙම මැතිවරණයේදී ප්‍රමුඛ පෙළේ දේශපාලඥයන් වූ පිලිප් ගුණවර්ධන, සී. පී. ද සිල්වා, එම්. ඩී. බණ්ඩා, යූ. බී. වන්නිනායක යන මහතුන් පරාජයට පත් විය. ජේ. ආර්. ජයවර්ධන මහතා විරුද්ධ පක්ෂයේ නායකත්වය ඉසිලූ අතර ඩඩ්ලි සේනානායක මහතා එක්සත් ජාතික පක්ෂයේ නායකයා විය.

දොම්පෙ ආසනය තරග කළ ෆිලික්ස් ආර්. ඩයස් බණ්ඩාරනායක මහතා ඡන්ද 22,373 ක් ලබා ගෙන මුළු ශ්‍රී ලංකාවෙත්ම වැඩිපුර ඡන්ද සංඛ්‍යාවක් ලබා ගත් ප්‍රථමයා විය. අත්තනගල්ල ආසනය තරග කළ සිරිමා බණ්ඩාරනායක මැතිනිය ඡන්ද 21,723 ක් ලබා ගෙන ඇත.

## 1977 මැතිවරණය

1977 පැවති මෙම මැතිවරණය සඳහා අපේක්ෂකයින් 461 ක් සහ ස්වාධීන අපේක්ෂකයින් 295 ක් තරග වැදී ඇත. පක්ෂ 7 ක් මේ සඳහා ඉදිරිපත් විය. මෙම මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂය 50.9% ක් ඡන්ද ලබා ආසන 140 ක් ලබා ගනිමින් විශිෂ්ඨ ජයක් අත්කර ගත්තේය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය 29.7% ක් ඡන්ද

හිමිකම් ලබා ආසන 8 ක් ලබා තිබුණි. ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ ආසන 18 ක් ලබා ගනිමින් විරුද්ධ පක්ෂයේ නායකත්වයට පිවිසුණි. ලංකා කම්කරු කොංග්‍රසයෙන් තරග කළ තොණ්ඩමන් මහතා නැවතත් පාර්ලිමේන්තුවට ඡන්දයෙන් පත් වූ මන්ත්‍රීවරයෙකු ලෙස පිවිසුණි.

වාමාංශික ව්‍යාපාරයේ ප්‍රනාක යෝධයින් වූ ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා, ලෙස්ලි ගුණවර්ධන, පීටර් කේනමන්, දොස්තර වික්‍රමසිංහ, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා යන මහතුන්ට 1977 මැතිවරණයෙන් පාර්ලිමේන්තුව අහිමි විය.

1970 වැඩිම ඡන්ද ලබා ගත් ෆීලික්ස් ආර්. ඩයස් බණ්ඩාරනායක මහතා 1977 මැතිවරණයෙන් ලබා ගෙන තිබුණේ ඡන්ද 2,397 කි. මෙම මැතිවරණයේදී 86.7% ක් ඡන්දය ප්‍රකාශ කර තිබුණි.

## 1989 මැතිවරණය

1977 මහ මැතිවරණයෙන් 6/5 ක බලයක් හිමි කර ගත් එක්සත් ජාතික පක්ෂය 1978 දී විධායක ජනාධිපති ව්‍යවස්ථාව අනුමත කර ගැනීමෙන් පසු 6/5 ක බලය උපයෝගී කර ගනිමින් ජේ. ආර්. ජයවර්ධන මහතා විධායක ජනාධිපතිවරයා ලෙස පත් විය. මහ මැතිවරණය 1982 වසරේ පැවැත්වීමට නියමිතව තිබුණත් ඒ වෙනුවට ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා ජනමත විචාරණයක් පවත්වා පාලන බලය තව වසර 06 ක් දීර්ඝ කර ගන්නා ලදී.

1977 න් පසු නිල වශයෙන් නැවත මහ මැතිවරණයක් පැවැත් වූයේ 1989 පෙබරවාරි මාසයේදීය. මෙතෙක් පැවති ආසන මට්ටමේ ක්‍රමය වෙනුවට සමානුපාතික ඡන්ද ක්‍රමය මෙම මැතිවරණය තුළින් ජනතාවට හඳුන්වා දෙන ලදී. මෙම ක්‍රමය තුළින් පළමුව පක්ෂයටත්, දෙවනුව තමන් කැමති පුද්ගලයින් තිදෙනෙකුටත් මනාප ඡන්දය පාවිච්චි කිරීමට අවස්ථාව ලැබිණි.

අපේක්ෂකයින් 1,396 දෙනෙක් මන්ත්‍රී ධූර 196 ක් සඳහා මෙම මැතිවරණයේදී තරග වැදී ඇත. එක්සත් ජාතික පක්ෂය, ලංකා කම්කරු කොංග්‍රසය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, එක්සත් සමාජවාදී පෙරමුණ, (සම සමාජ, නව සම සමාජ, කොමියුනිස්ට්) ද්‍රවිඩ

එක්සත් විමුක්ති පෙරමුණ, ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය, මහජන එක්සත් පෙරමුණ, සමස්ථ ලංකා ද්‍රවිඩ සංගමය, ප්‍රජාතන්ත්‍රවාදී මහජන විමුක්ති පෙරමුණ, එක්සත් ලංකා ජනතා පක්ෂය හා ස්වාධීන කණ්ඩායම් හතක් මෙම මැතිවරණය නියෝජනය කළහ.

එක්සත් ජාතික පක්ෂය ආසන 110 ක් ලබා ගත් අතර 50.71% ක් ඡන්ද ලබා ගෙන ඇත. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය 31.09% ක් ලබා ආසන 58 ක්ද, ස්වාධීන අපේක්ෂකයන් 12 ක්ද, ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ ඡන්ද 3.37% ක් ලබා ආසන 09 ක්ද ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය ආසන 03 ක්ද, එක්සත් සමාජවාදී පෙරමුණ ආසන 02 ක් සහ මහජන එක්සත් පෙරමුණ ආසන 02 ක්ද හිමි කර ගෙන ඇත. නැවතත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විපක්ෂය බවට පත්විය. එක්සත් ජාතික පක්ෂයට බලය හිමි විය.

## 1994 මහ මැතිවරණය :

1988 ජේ. ආර්. ජයවර්ධන මහතාගේ ජනාධිපති පාලන කාලය අවසන් වීමෙන් පසු පැමිණි ජනාධිපතිවරණයේදී ජනාධිපති පදවියට පත් වූයේ ආර්. ප්‍රේමදාස මැතිඳුන්ය. එතුමා 1993 මැයි 01 දා ඝාතනය කිරීමෙන් පසු ඩී. බී. විජේතුංග මහතා ජනාධිපති පදවියට පත් විය.

එතුමා ජනාධිපති පදවියට පත් වීමෙන් පසු 1995 පැවැත්වීමට නියමිතව තිබූ මහ මැතිවරණය 1994 පැවැත්වීමට කටයුතු යොදන ලදී.

1994 අගෝස්තු 16 වැනිදා පැවැත් වූ මෙම මැතිවරණයට පිළිගත් දේශපාලන පක්ෂ 13 ක් හා ස්වාධීන කණ්ඩායම් 27 ක් තරගයට ඉදිරිපත් වූහ. අපේක්ෂකයන් සංඛ්‍යාව 1,440 කි. අවසන් ප්‍රතිඵලය අනුව පොදු ජන එක්සත් පෙරමුණට ආසන (91+14) 105 ක් හිමි විය. එක්සත් ජාතික පක්ෂයට හිමි වූයේ ආසන (81+13) 94 කි. යාපනයේ ස්වාධීන කණ්ඩායම් ආසන 09 ක් හිමි කර ගත් අතර ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය ආසන (6+1) 07 ක් හිමි කර ගත්තේය. ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ ආසන (4+1) 5 ක්ද, ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවකාරී පෙරමුණ ආසන 03 ක්ද, ශ්‍රී ලංකා ප්‍රගතිශීලී පෙරමුණ ආසන 01 ක්ද, නුවරඑළිය ස්වාධීන කණ්ඩායම ආසන 01 ක්ද හිමි කර ගත්හ. අවසන් ඡන්ද ප්‍රතිඵලය

අනුව පොදු ජන එක්සත් පෙරමුණට මුළු ඡන්ද ප්‍රමාණයෙන් ඡන්ද 48.94% ක් හිමි විය. එක්සත් ජාතික පක්ෂය ලබා ගෙන තිබුණේ ඡන්ද 44.04% කි. මෙම මැතිවරණයට එක්ව ජනතා විමුක්ති පෙරමුණද එක් අසුනක් දිනා ගෙන ඇත. එක්සත් ජාතික පක්ෂ රජයේ ප්‍රබල ඇමතිවරු ගණනාවක්ම පරාජයට පත් වූහ. විපක්ෂයේ සිට පාර්ලිමේන්තුව තුළ ප්‍රබල හඬක් නැගූ මහජන එක්සත් පෙරමුණටද එකම අසුනක්වත් හිමි නොවිය.

සිරිමා බණ්ඩාරනායක මැතිනිය ඇමතිවරියක් ලෙසත්, චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය අගමැතිවරිය ලෙසත්, අනුර බණ්ඩාරනායක මහතා විපක්ෂයේ මන්ත්‍රීවරයෙකු ලෙසත්, එකම පවුලේ තිදෙනෙකු මෙවර පාර්ලිමේන්තුවේ අසුන් ගෙන සිටීම සුවිශේෂ සිද්ධියකි.

තවත් අතෙකින් සියා වන සෞම්‍ය මූර්ති තොණ්ඩමන් මහතාත්, ඔහුගේ මුණුබුරකු වන ආරුමුගන් තොණ්ඩමන් මහතාත් මෙවර පාර්ලිමේන්තුවේ එකට අසුන් ගෙන ඇත. 1994 වසර තුළම ජනාධිපතිවරණය පැවැත්විණි.

# ශ්‍රී ලංකා පාර්ලිමේන්තු ඉතිහාසයේ කාන්තා ගමන් මග

ශ්‍රී ලංකා පාර්ලිමේන්තු ඉතිහාසයේ කාන්තාව විසින් ඉටු කරන ලද මෙහෙය කාන්තා වංශ කාතාවේ සැබවින්ම අරුත්බර කාල පරිච්ඡේදයක් වශයෙන් සටහන්ව තිබීම සමාජ සාධනයට බෙහෙවින් වැඩ දායකය. 1931 වසරේදී ස්ත්‍රී / පුරුෂ දෙපක්ෂයටම ශ්‍රී ලංකාවේ ඡන්ද බලය හිමිවිය. එම වසරේදීම රාජ්‍ය මන්ත්‍රණ සභාවට කාන්තාවන් පිවිසීම සුවිශේෂ සිද්ධියකි.

රුවන් වැල්ල ආසනය සඳහා රාජ්‍ය මන්ත්‍රණ සභාවට නිතරගයෙන් පත් වී සිටි ජෝන් හෙන්රි මීදෙනිය අදිකාරම් තුමාගේ වියෝව නිසා තම දියණිය වූ ඇඩිලින් මොලමුරේ කුමාරිහාමි (ඇඩිලින් ඩොරති මීදෙනිය) එම වසරේම රුවන්වැල්ල ආසනයෙන් රාජ්‍ය මන්ත්‍රණ සභාවට පිවිසියේ කාන්තා වංශ කතාවට නව පිටුවක් පෙරලමිනි. දේශපාලනය පිළිබඳවත් සමාජ සාධනය සඳහාත් කාන්තාව නැඹුරු නොවූ යුගයක රුවන්වැල්ල අතුරු මැතිවරණයට තරග වැද රාජ්‍ය මන්ත්‍රණ සභාවට ඇය පත්වූවාය.

ඉන් අනතුරුව රාජ්‍ය මන්ත්‍රණ සභාවට එම වසරේම තවත් කාන්තාවක් පත්වූවාය.

එවක කොළඹ අප්පුන නියෝජනය කළ රත්නජෝති සරවන මුත්තු මහතාට ඡන්ද පෙත්සමක් නිසා තම අසුන අහිමිවීමෙන් පසු එතුමාගේ බිරිඳවන නේසම් සරවන මුත්තු මහත්මිය අතුරු මැතිවරණයකින් රාජ්‍ය මන්ත්‍රණ සභාවට පිවිසියාය. ඇය රාජ්‍ය මන්ත්‍රණ සභාවට පිවිසි දෙවන කාන්තාව වූවාය.

1936 දෙවැනි රාජ්‍ය මන්ත්‍රණය සභාව සඳහා කාන්තාවන් තිදෙනෙකු තරගයට ඉදිරිපත්ව ඇතත් එයින් එක් කාන්තාවක් ජයග්‍රහණය කර රාජ්‍ය මන්ත්‍රණ සභාවට පිවිසීමට වරම් ලැබුවාය. ඇය උතුරු කොළඹ ආසනය සඳහා තරග කළ නේසම් සරවන මුත්තු මහත්මියයි. හැටන් ආසනය සඳහා තරග කළ සී. එන්. රාජරත්නම් මහත්මිය හා රුවන්වැල්ල තරග කළ ඇඩිලින් මොලමුරේ මහත්මිය මෙම මැතිවරණයෙන් පරාජය වූවාහ.

මහ මැතිවරණයක් තුළින් ප්‍රථම වරට රාජ්‍ය මන්ත්‍රණ සභාවට පිවිසි කාන්තාව වශයෙන් නේෂම් සරවනමුත්තු මහත්මිය ඉතිහාසය තුළට එක් වූවාය.

රාජ්‍ය මන්ත්‍රණ සභා ක්‍රමය අහෝසි කර පාර්ලිමේන්තු ක්‍රමයට (නියෝජිත මන්ත්‍රී මණ්ඩල ක්‍රමය) අනුව 1947 දී පවත්වන ලද ප්‍රථම මැතිවරණයට කාන්තාවන් තිදෙනෙකු ඉදිරිපත්ව ඇත.

මැද කොළඹින් අයේෂා රාවුෆ්, බලපිටියෙන් ශ්‍රීමති අභය ගුණවර්ධන, කිරි ඇල්ලෙන් ෆ්ලොරන්ස් සේනානායක යන මහත්මීන් මෙම මැතිවරණය සඳහා ඉදිරිපත් වූ කාන්තාවන් වූවාහ.

මේ අතරින් ඩේයි මරියා ෆ්ලොරන්ස් සේනානායක මහත්මිය තම ආසනය ජයගෙන ප්‍රථමයෙන් පාර්ලිමේන්තුවට පිවිසියාය. අයේෂා රාවුෆ්, ශ්‍රීමති අභය ගුණවර්ධන යන මහත්මීන් පරාජයට පත් විය. මෙම පාර්ලිමේන්තුවේ අවසන් සමයේ තවත් කාන්තාවන් දෙදෙනෙකු පිවිසෙන ලදි. අවිස්සාවේල්ල ආසනය පිලිප් ගුණවර්ධන මහතාට අහිමි වීමෙන් එතුමාගේ බිරිඳ කුසුමා ගුණවර්ධන මහත්මිය නිතරගයෙන් පාර්ලිමේන්තුවට පිවිසි අතර මහනුවර ආසනය ටී. බී. ඉලංගරත්න මහතාට අහිමි වීමෙන් එතුමාගේ බිරිඳ තමරා කුමාරි ඉලංගරත්න මහත්මිය අතුරු මැතිවරණයකින් ජයගෙන පාර්ලිමේන්තුවට පිවිසි කාන්තාවන් දෙදෙනාය.

1952 වසරේ ලංකාවේ දෙවැනි පාර්ලිමේන්තු මැතිවරණයට නාම යෝජනා බාර ගන්නා විට කාන්තාවන් 12 දෙනෙකු දක්වා එය ඉහළ නැගිණි. එහෙත් ජය ලැබුවේ කාන්තාවන් දෙදෙනෙකි. ඒ අවිස්සාවේල්ල ආසනයෙන් කුසුමා ගුණවර්ධන මහත්මිය හා අකුරැස්ස අසුනෙන් ඩොරින් වික්‍රමසිංහ මහත්මියයි.

මෙම ජයග්‍රහණයන්ගෙන් සුවිශේෂ වූයේ අවිස්සාවේල්ල අසුන සඳහා කාන්තාවන් දෙදෙනෙකුම තරග වැදීමය. ඒ විප්ලවකාරී සම සමාජ පක්ෂයේ කුසුමා ගුණවර්ධන මහත්මිය හා එක්සත් ජාතික පක්ෂයේ ක්ලෝඩා ජයසූරිය මහත්මිය යන දෙදෙනාය. එංගලන්තයේ සුදු කාන්තාවක් එංගලන්තයේම යටත් විජිතයක් බවට පත්ව තිබූ ලංකාවේ ජනතා ඡන්දයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරියක ලෙස පත් වීමට වරම් ලැබුයේ ඩොරින් විනිෆ්‍රඩ් යං හෙවත් ඩොරින් වික්‍රමසිංහ නම් වූ සිව්ස්ත්‍රී කාන්තාවය. ඇය ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂයේ නායක දොස්තර වික්‍රමසිංහ මහතාගේ බිරිඳය.

1956 මහා මැතිවරණයෙන් පසු කාන්තාවක් ප්‍රථම වරට ඇමති පදවියකට පත් වීම දේශපාලන ඉතිහාසයේ වැදගත් කාලපරිච්ඡේදයකි.කාන්තාවන් පස්දෙනෙකු නාමයෝජනා බාරදුන් අතර එයින් හතර දෙනෙක්ම මැතිවරණයෙන් ජයග්‍රහණය කළාහ. පරාජයට පත්වූයේ දැදිගම ආසනය වෙනුවෙන් තරගකළ විමලා කන්නන්ගර මහත්මිය පමණි.

උතුරු කොළඹ විවියන් ගුණවර්ධන, අවිස්සාවේල්ල ක්ලෝඩා ජයසූරිය, මීරිගම විමලා විජයවර්ධන හා කිරිඇල්ල කුසුමා ගුණවර්ධන යන මහත්මීහු මෙම මැතිවරණයෙන් ජයගෙන පාර්ලිමේන්තුවට පිවිසියාහ. මහජන එක්සත් පෙරමුණේ කැබිනට් මණ්ඩලයේ සෞඛ්‍ය ඇමතිනිය ලෙස පත් වූයේ විමලා විජයවර්ධන මහත්මියයි. ඇය ලංකාවේ පමණක් නොව එවක දකුණු ආසියාතික රටක ඇමති පදවියක් ලත් ප්‍රථම කාන්තාව වූවාය.

ලෙස්ලි ගුණවර්ධන මහතා සහ විවියන් ගුණවර්ධන මහත්මියත්, පිලිප් ගුණවර්ධණ මහතා සහ කුසුමා ගුණවර්ධන මහත්මියත් යන අඹුසැමි දෙපලත් තෙවන පාර්ලිමේන්තුව නියෝජනය කිරීම විශේෂ සිද්ධියක් විය. 1956 මහ මැතිවරණයෙන් වැලිමඩ ආසනය ජයගත් කේ. ඇම්. පි. රාජරත්න මහතාට ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවකින් එම ආසනය අහිමිවීමෙන් පසු 1957 පැවති අතුරු මැතිවරණයෙන් ඔහුගේ බිරිඳ කුසුමා රාජරත්න මහත්මියට ජය අත්වීමෙන් ඇයද පාර්ලිමේන්තුවට පිවිසියාය. 1959 එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා ඝාතනය කිරීමෙන් අනතුරුව හිස් වූ අත්තනගල්ල ආසනය වෙනුවෙන් සිරිමාවෝ බණ්ඩාරණායක මැතිනිය එහි අතුරු මැතිවරණයට ඉදිරිපත් වූවාය. එහෙත් අතුරු මැතිවරණය පවත්වන්නට මත්තෙන් අග්‍රාමාත්‍ය දහනායක මහතා විසින් පාර්ලිමේන්තුව විසිරුවා හරිනු ලැබීය.

1960 මාර්තු මස පැවැත් වූ මහ මැතිවරණයටද කාන්තාවන් 14 දෙනෙකු ඉදිරිපත් වූවාහ. එයින් ජයග්‍රහණය ලැබුවේ කාන්තාවන් තිදෙනෙකු පමණි. ජය ලැබූ තිදෙනා අතර දෙහිඕවිට ආසනයෙන් සෝමා වික්‍රමනායක මහත්මියත්, ගලිගමුව ආසනයෙන් විමලා කන්නන්ගර මහත්මියත් පාර්ලිමේන්තුවට පිවිසි අලුත් මුහුණු අතරට එක්විණි. ඌව පරණගම ආසනය සඳහා වැලිමඩ හිටපු මන්ත්‍රිනි කුසුමා රාජරත්න මහත්මියද ජය ලැබූ කාන්තාවන්

තිදෙනා අතරට එක්විය. සිව්වෙනි පාර්ලිමේන්තුවේද මන්ත්‍රී යුවළක් විය. ඒ වැලිමඩ ආසනය ජයගත් කේ. එම්. පී. රාජරත්න සහ කුසුමා රාජරත්න යුවළය.

රාජාසන කතා විවාදයේදී බලයේ සිටි එක්සත් ජාතික පක්ෂ රජය පරාද වීම නිසා එම වසරේම 1960 ජූලි මස තවත් මැතිවරණයකට මං පෑදී ඇත. එම මැතිවරණය සඳහා කාන්තාවන් ඉදිරිපත් වූයේ සිවුදෙනෙකු පමණි. ඌව - පරණගම - කුසුමා රාජරත්න, දෙහිඕවිට - විමලා කන්නන්ගර හා සෝමා වික්‍රමනායක, උතුරු කොළඹ - විවියන් ගුණවර්ධන යන මහත්මීහුය.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපති වරයා වූ සී. පී. ද සිල්වා මහතා එම තනතුරෙන් ඉවත්වීම නිසා සිරිමාවෝ බණ්ඩාරණායක මැතිනිය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායිකාව වශයෙන් පත්වූවාය. පක්ෂයේ නායිකාව වශයෙන් 1960 ජූලි මැතිවරණය මෙහෙය වූ ඇය ආසනයක් තරඟ නොකළාය. මෙය ප්‍රතිවිරුද්ධ දේශපාලන පක්ෂ අතර දැඩි විවේචනයට ලක්වූවද සෝල්බරි ව්‍යවස්ථාව අනුව ආසනයක් තරඟ නොකිරීමෙන් බණ්ඩාරණායක මහත්මියට අගමැති පදවිය ප්‍රදානය කිරීමට බාධාවක් නොමැති බව පාක්ෂකයින්ගේ මතය විය. ඒ අයුරින්ම 1960 ජූලි 20 වැනි දින ඡන්ද ගණනය ... ඡය සැබෑ කරමින් පසු දින එනම් 21 වැනි දින දහවල් 11.30 ට සිරිමා ආර්. ඩී. බණ්ඩාරණායක මැතිනිය ශ්‍රී ලංකාවේ පස්වන පාර්ලිමේන්තුවේ අගමැතිනිය වශයෙන් පදවි ප්‍රාප්තවීමට ආණ්ඩුකාර ඔලිවර් ගුණතිලක මැතිතුමා හමුවේ දිවුරුම් දුන්නාය. උත්තර මන්ත්‍රී මණ්ඩලයේ මන්ත්‍රීවරියක වශයෙන් ද දිවුරුම් දුන් බණ්ඩාරනායක මැතිනිය උත්තර මන්ත්‍රී මණ්ඩලය නියෝජනය කළ පළමු වැනි අග්‍රාමාත්‍ය වරිය වශයෙන් ද ඇය වාර්තා ගත වූවාය එම උත්තර මන්ත්‍රී මණ්ඩලයේ උපසභාපතිණී තනතුරු දැරූයේද කාන්තාවකි. ඇය ඇඩ්ලින් මොලමුරේ මහත්මියයි. මේ වන විට උත්තරමන්ත්‍රී මණ්ඩලය එව්ලින්ද සොයිසා මහත්මියද නියෝජනය කළාය. ඇයට ලෝක කාන්තා සම්මේලනයේ සාමාජිකත්වයද හිමිව තිබුණාය.

මෙම මැතිවරණයේ දී දෙහිඕවිට සෝමා වික්‍රමනායක මහත්මියත්, ඌව - පරණගමට කුසුමා රාජරත්න මහත්මියත් යන දෙපලට පමණක් ජය අත්විය.

1961 පැවති කුරුණෑගල අතුරු මැතිවරණයටද කාන්තාවක් ඉදිරිපත් වූවාය ඇය තම්මිට ඒ. ඩී. කුමාරි නම් වූ අතර ඇය එහිදී පරාජිත වූවාය.

1964 දී දොස්තර ඩබ්. ඒ. පී. ද සිල්වා මහතාගේ අභාවයෙන් පසු හිස් වූ බොරැල්ල ආසනය වෙනුවෙන් තරඟ කළ විවියන් ගුණවර්ධණ මහත්මිය ජය ලැබුවාය. දොස්තර සිල්වා මහතාගේ බිරිඳ කමලා ද සිල්වා මහත්මියද මෙම මැතිවරණයට තරඟ කර පරාජයට පත්වූවාය. මැතිවරණ අටකට ඉදිරිපත්ව තෙවරක්ම ජයගත් විවියන් ගුණවර්ධන මහත්මිය පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ නියෝජ්‍ය ඇමති පදවියට පත්වීමෙන් ලංකා පාර්ලිමේන්තු වේ පළමු නියෝජ්‍ය ඇමතිවරිය වීමේ ගෞරවය හිමිකර ගත්තාය.

ශ්‍රී ලංකාවේ 06 වන පාර්ලිමේන්තුව සඳහා 1965 පැවති මහ මැතිවරණයට කාන්තාවන් 13 දෙනෙකු ඉදිරිපත් වූ නමුත් එයින් ජයගෙන ඇත්තේ කාන්තාවන් සිව්දෙනෙකු පමණි. අත්තනගල්ල ආසනයෙන් සිරිමා බණ්ඩාරනායක මැතිනිය හා මීරිගම ශිවා ඔබේසේකර, ඌව පරණගම කුසුමා රාජරත්න, ගලිගමුවේ විමලා කන්නන්ගර යන මහත්මීන් ජය ලැබූ කාන්තාවන් සිව්දෙනා අතරට එක් වූවාහ. එම පාර්ලිමේන්තු කාලය අවසන් වන විට තවත් කාන්තාවන් දෙපළක් පාර්ලිමේන්තුවට එක් වී තිබුණි. බලංගොඩ අතුරු මැතිවරණයේදී එහි හිටපු මන්ත්‍රී ක්ලිෆර්ඩ් රත්වත්තේ මහතාගේ බිරිඳ මල්ලිකා රත්වත්ත මහත්මිය හා දොඩන්ගස්ලන්ද ආසනයේ හිටපු මන්ත්‍රී ආර්. ආර්. ඩබ්. රාජපක්ෂ මහතාගේ බිරිඳ ලැටීෂියා රාජපක්ෂ යන මහත්මීන් දෙපළ පාර්ලිමේන්තුවට පිවිසියාහ.

ශ්‍රී ලංකාවේ හත්වන පාර්ලිමේන්තුව සඳහා 1970 වසරේ කාන්තාවන් 14 දෙනෙක් ඉදිරිපත් වූවාහ. ජය ගනු ලැබුයේ ඉන් කාන්තාවන් 06 දෙනෙකු පමණි. අත්තනගල්ල ආසනය සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය සහ බලංගොඩ මල්ලිකා රත්වත්ත, මීරිගම ශිවා ඔබේසේකර, ගලගෙදර තමරා කුමාරි ඉලංගරත්න, බොරැල්ල කුශලා අබේවර්ධන, දෙහිවල - ගල්කිස්ස විවියන් ගුණවර්ධන යන මහත්මීන් ජය ලබා ගත් කාන්තාවන් 06 දෙනා අතරට එක් වූවාහ.

අඹු - සැමි ජෝඩු 3 ක් එවර මැතිවරණයට ඉදිරිපත් වූ නමුත් එයින් කුසුමා, පිලිප් යුවළ පරාජය වී තමරා, ඉලංගරත්න යුවළද, විවියන් - ලෙස්ලි යුවළද පාර්ලිමේන්තුවට පිවිස ඇත.

එම මැතිවරණයෙන් සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය දෙවැනි වරටද අග්‍රාමාත්‍ය පදවිප්‍රාප්ත වූවාය. දස වසරක් තුළ දෙවරක් අග්‍රාමාත්‍ය පදවිය ඉසිලීමත්, එක් වරක් විපක්ෂ නායක බවට පත් වීමත් ඇයගේ දේශපාලන ජීවිතයේ වැදගත් කාල පරිච්ඡේදයක් ලෙස ලොව පුරා ප්‍රකටව තිබිණ.

1977 පැවැත් වූ මහ මැතිවරණයට කාන්තාවන් 14 දෙනෙකු ඉදිරිපත් වූවාහ. එයින් ජය අත් වූයේ සිව්දෙනෙකුට පමණි. බණ්ඩාරනායක මැතිනිය අත්තනගල්ල ආසනය ජය ගත් අතර වලපනේ - රේණුකා හේරත් මහත්මිය, වාරියපොළ - අමරා පියසීලි රත්නායක මහත්මිය, ගලිගමුව - විමලා කන්නන්ගර මහත්මිය යන මහත්මීන්ට ජය අත් වූවාහ.

අතුරු මැතිවරණයකින් තොරව හිස්වන ආසන සඳහා මන්ත්‍රිවරුන් පත්කර ගැනීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 1978 දි සංශෝධනය කිරීමෙන් පසු මන්ත්‍රීවරියන් 06 දෙනෙකු පාර්ලිමේන්තුවට පත්වූවාහ. එම්. කනකරත්නම් මහතාට හිමි පොතුවිල් ආසනය වෙනුවෙන් ඔහුගේ සහෝදරිය රංගනායකි පද්මනාදන් මහත්මිය පත්වූයේ පාර්ලිමේන්තුවට පත්කරනු ලැබූ ප්‍රථම ද්‍රවිඩ කාන්තාව වශයෙනි. කරන්දෙනිය - බන්දුල සේනාධීර මහතාගේ අභාවය නිසා ඔහුගේ බිරිඳ දයා සේපාලි සේනාධීර මහත්මිය පත් වූවාය. හේවාහැට අනුර ඩැනියෙල් මහතා ඉල්ලා අස්වීම නිසා ඔහුගේ සහෝදරිය රූපා ශ්‍රියාණි ඩැනියෙල් මහත්මිය පත්කරනු ලැබූවාය. හාරිස් පත්තුව - ආර්. පී. විජේසිරි මහතා ඉල්ලා අස්වීම නිසා ඔහුගේ බිරිඳ එල්. එම්. විජේසිරි මහත්මිය පාර්ලිමේන්තුවට පිවිසියාය.

ඒ හැරුණුවිට දෙහිවල - මන්ත්‍රී එස්. ද එස්. ජයසිංහ මහතාගේ අභාවය නිසා පැවති අතුරු මැතිවරණයෙන් ඔහුගේ දියණිය සුනේත්‍රා රණසිංහ මහත්මියද පාර්ලිමේන්තුවට පිවිසියාය. පාර්ලිමේන්තුවේ බෝම්බ පිපිරීමෙන් මියගිය දෙනියාය මන්ත්‍රී කීර්ති අබේවික්‍රම මහතා වෙනුවට ඔහුගේ සහෝදරියක වන කීර්තිලතා අබේවික්‍රම මහත්මියද, රඹුක්කන සමාජ සේවා අමාත්‍යවරයාව සිටි

අශෝක කරුණාරත්න මහතාගේ අභාවයෙන් හිස් වූ එම අසුනට ඔහුගේ දියණිය සමන්තා කරුණාරත්න මහත්මියද පත් වූවාහ.

එම පාර්ලිමේන්තුවේ දී සුනේත්‍රා රණසිංහ මහත්මිය සෞඛ්‍ය නියෝජ්‍ය ඇමති පදවියටද, පසුව සෞඛ්‍ය අමාත්‍ය පදවියටද, යළිත් වනිතා කටයුතු හා ශික්ෂණ රෝහල් ඇමති පදවියටද, අධ්‍යාපන සේවා ඇමති පදවියටද, වරින් වර පත් වූවාය.

රේණුකා හේරත් මහත්මිය නුවරඑළියේ දිසා ඇමතිනිය ලෙසටද, සෞඛ්‍ය හා වනිතා කටයුතු ඇමති පදවියෙහිද ඇය සේවය කළාය.

රංග නායකී පද්මනාදන් මහත්මිය මඩකලපුව දිසා ඇමතිතුමිය ලෙසද, සමන්තා කරුණාරත්න මහත්මිය සමාජ සුබ සාධක ඇමතිවරිය ලෙසද කටයුතු කළාය.

1989 වසරේ ශ්‍රී ලංකාවේ 9 වැනි පාර්ලිමේන්තුව සඳහා සමානුපාතික ඡන්ද ක්‍රමය යටතේ පැවති මැතිවරණයෙන් එක්සත් ජාතික පක්ෂයෙන් මන්ත්‍රීවරියන් හත් දෙනෙකුද, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් මන්ත්‍රීවරියන් හතරදෙනෙකුද පත් වූවාහ.

සුනේත්‍රා රණසිංහ, සමන්තා කරුණාරත්න, රේණුකා හේරත්, අමරා පියසීලි රත්නායක, සුජාතා ධර්මවර්ධන, රසෝ මනෝහරී පුල්ලෙන්ද්‍රන්, චන්ද්‍රා කරුණාරත්න, හා සිරිමා බණ්ඩාරනායක, සුමිත්‍රා ප්‍රියංගනී අබේවීර, ගුණවතී දියානායක, හේමා රත්නායක යන මහත්මීන් එකොළොස් දෙනෙකු 1989 මැතිවරණයෙන් මැති සභයට පිවිසියාහ.

නාම යෝජනා බාර දීමෙන් අනතුරුව ඝාතනය කළ කළුතර ඉන්ද්‍රපාල අබේවීර මහතා වෙනුවට ඔහුගේ දියණිය සුමිත්‍රා ප්‍රියංගනී අබේවීරත්, බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍ර.බ. රත්නායක මහතා වෙනුවෙන් ඔහුගේ බිරිඳ හේමා රත්නායකත්, මොනරාගල සුමේද ජයසේන මහතා රෝගාතුරව මිය ගියෙන් ඔහුගේ බිරිඳ ගුණවතී දියානායක යන මහත්මීහු එවර පාර්ලිමේන්තුවට පිවිසී ඇත්තේ නාමයෝජනා ලැයිස්තුවට පසුව නම් කිරීම මගින් මැතිවරණයට ඉදිරිපත් වීමෙනි.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තු ඉතිහාසයේ පාර්ලිමේන්තුව තුළ වැඩිම කාන්තාවන් පිරිසක් නියෝජනය කළ පාර්ලිමේන්තුව වශයෙන් නව වැනි පාර්ලිමේන්තුව ඉතිහාසයට එක් වී ඇත.

ශ්‍රී ලංකාවේ දසවැනි පාර්ලිමේන්තුව සඳහා 1994 මැතිවරණයට විවිධ පක්ෂවලින් තරග කළ කාන්තාවන්ගේ ගණන 40 ක් පමණ වේ. එයින් ජයග්‍රහණය කොට ඇත්තේ නව දෙනෙකු පමණි.

අත්තනගල්ල - චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය සමග රත්මලාන - ශ්‍රීමති ඇතුලත්මුදලි, මොනරාගල සුමේධ ජයසේන, කළුතර සුමිත්‍රා ප්‍රියංගනි අබේවීර, බදුල්ල හේමා රත්නායක, මුල්කිරිගල නිරුපමා රාජපක්ෂ, කලවාන - පවිත්‍රා වන්නිආරච්චි යන මහත්මීන් සමග වාරියපොළ - අමරා පියසීලි රත්නායක, වලපනේ රේණුකා හේරත් යන මහත්මීන් එම මැතිවරණයෙන් ජයගත් කාන්තාවෝය. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය සමග දසවැනි පාර්ලිමේන්තුවේ කාන්තාවන් දස දෙනෙකි.

මුල් වරට පාර්ලිමේන්තුවට පිවිසි කාන්තාවන් අතර ශ්‍රීමති ඇතුලත්මුදලි, පවිත්‍රා වන්නිආරච්චි, සහ නිරුපමා රාජපක්ෂ යන මහත්මීන් අලුත් මුහුණු වේ.

ශ්‍රී ලංකාවේ ප්‍රවීන දේශපාලනඥයෙකුව සිටි ලලිත් ඇතුලත්මුදලි මහතාගේ ඝාතනයෙන් පසු එතුමාගේ බිරිඳ ශ්‍රීමති ඇතුලත්මුදලි මහත්මිය ලක්ෂ එකහමාරකට වැඩි මනාප ඡන්ද සංඛ්‍යාවක් ලබා පාර්ලිමේන්තුවට පිවිස එහි ප්‍රවාහන, මහාමාර්ග, පාරිසරික හා වනිතා කටයුතු පිළිබඳ ඇමතිවරිය වන්නිය.

පවිත්‍රා වන්නිආරච්චි මහත්මිය හා නිරුපමා රාජපක්ෂ මහත්මිය 1993 පළාත් සභා මැතිවරණ ජයගෙන පළාත් සභා මන්ත්‍රීවරියන් ලෙස කටයුතු කරමින් සිටි තරුණ කතුන් දෙපොලකි.

1977, 1989, 1994 යන පාර්ලිමේන්තු මැතිවරණයන්ගෙන් නොකඩවා ජයගත් මන්ත්‍රීවරියන් දෙදෙනෙකු වන රේණුකා හේරත් මහත්මිය හා අමරා පියසීලි රත්නායක මහත්මිය පාර්ලිමේන්තු කාන්තා ගමන් මගෙහි කැපී පෙනෙන දෙදෙනෙකි.

මනාප ඡන්ද ක්‍රමය හඳුන්වා දීමෙන් අනතුරුව වැඩිම මනාප ඡන්ද ලබා ගන්නට වරම් ලැබුයේ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියයි. ඇය 1993 පළාත් සභා මැතිවරණයේදී ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කර මනාප ඡන්ද 2,98,457 ක් ලබාගත් අතර 1994 මහ මැතිවරණයට ඉදිරිපත්ව ඡන්ද 4,64,588 ක් ලබා ගැනිමට සමත් වෙමින් ශ්‍රී ලංකා මැතිවරණ ඉතිහාසයේ විශිෂ්ඨ වාර්තාවක් තැබුවාය.

චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය ශ්‍රී ලංකා දේශපාලන යුගයේ වාර්තා රැසක්ම හිමි කර ගත්තාය. ඇය ශ්‍රී ලංකාවේ දෙවැනි කාන්තා අගමැතිනිය ලෙසද, සිව්වැනි ජනාධිපතිනිය ලෙසද පදවිප්‍රාප්ත වූයේ දකුණු ආසියාතික රටවල් අතර පමණක් නොව ලොව පුරා හඹා යමින් තිබෙන කාන්තා නායකත්වයට නව ජීවයක් එක් කරමිනි.

# පවුල් තුළින් ඔපවත් වුණු දෙරටක පොදු සබඳතා

ධර්මාශෝක - දෙවන පෑතිස් යුගයේ ආරම්භ වූ ඉන්දු - ශ්‍රී ලංකා සබඳතාවය දළු ලා ලියැලෙමින් මීට දශක කිහිපයකට පෙර ලංකාවේ බණ්ඩාරනායක යුගයත්, ඉන්දියාවේ ශ්‍රී නේරු යුගයත් විසින් නව සන්ධිස්ථානයකට යොමු කළ බව නොරහසකි. එහෙත් ඉකුත් වකවානුව තුළ ඉන්දු - ලංකා සබඳතාවයන් දැඩි ලෙස පළුදු වී ගිය බවක් දක්නට ලැබිණි. අසල්වැසි රටක් වශයේ සෑම අතින්ම අප රටට සමීප වූ ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර දැඩි සබඳතාවයක් පැවතීම දෙරටේම යහපතට තුඩු දෙන්නකි.

මිහින්තලාගල මුදුනින් ඇරඹි දෙරටේ සබඳතාවය අනුරාධපුර ශ්‍රී මහා බෝධීන් වහන්සේ තෙක් සමීපව ඇත. රජරට වැව් දාගැබ් අතරින් හමා යන් මද නල වැල් ශ්‍රී මහා බෝ පත් අතර ගැටෙමින් නගන රාවය අදත් ඉන්දු - ශ්‍රී ලංකා සබඳතාවය සවන් පෙති යුග්මයන් තුළ පතිත වී අතීත ශ්‍රී විභූතිය පිළිබඳ කථාව අපට සිහිපත් කරවයි.

රජ පවුල්වලින් ඇරැඹුණ ඉන්දු - ශ්‍රී ලංකා සබඳතාවය කිසි කලෙකත් මකා දැමිය නොහැක්කකි. එම උදාර මිත්‍ර දහම අඛණ්ඩව රැකගත් පවුල් දෙකක් වශයෙන් ඉන්දියාවේ නේරු පවුලත්, ශ්‍රී ලංකාවේ බණ්ඩාරනායක පවුලත් ඉතිහාසගතව ඇත. මේ පවුල් දෙකේ සබඳතාවය දශක කීපයක් පුරා ඈතට විහිදී අඩසිය වසකටත් වඩා පැරැණිය. මෙවැනි ඓතිහාසික පවුල් දෙකක් අතර ඇති සමානාත්මතාවය වෙන අන්කිසි රටවල් දෙකක පැවතුනා යයි සිතිය නොහැක.

දෙවැනි ලෝක සංග්‍රාමය වන විට ශ්‍රී ලංකාවත් ඉන්දියාවත් එකම යටත් විජිතයක සොහොයුරන් මෙන් පැවතිනි. එකල ශ්‍රී ලංකාවෙන් ඉන්දියාවට යන කෙනෙකුට හෝ ඉන්දියාවෙන් ශ්‍රී ලංකාවට එන කෙනෙකුට විසා බලපත්‍ර නොමැතිව නිදහසේ සංචාරය කිරීමට හැකිව තිබිණි. ඈත අතීතයේ එකම බිම් කඩක් ලෙස දෙරටම පැවති බවට භූගෝලීය සාධක පෙන්නුම් කර ඇත.

බ්‍රිතාන්‍ය පාලනයෙන් ඉන්දියාවත් ලංකාවත් නිදහස් වූ පසුව දෙරටේම ස්වදේශීය ආණ්ඩු දෙකක් බිහිවිය. ශ්‍රී ජවහර්ලාල් නේරු ඉන්දියාවේ ප්‍රථම අගමැතිවරයා වන විට ඇස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා ශ්‍රී ලංකාවේ පළාත් පාලන හා සෞඛ්‍ය ඇමතිවරයා විය. එහෙත් මීට පොරොතුව සිට නේරු පවුලේ හා බණ්ඩාරනායක පවුලේ සබඳතාවය ගොඩ නැඟී ඇත. වරක් ශ්‍රී නේරු ශ්‍රී ලංකාවේ දූත මෙහෙවරක නියැලුන අවස්ථාවක සුනේත්‍රා, චන්ද්‍රිකා හා අනුර කුඩා දරුවෝය. ශ්‍රී ලංකාවේ පේෂ කර්මාන්තය නඟාසිටුවීමට බණ්ඩාරනායක මහතා ගාන්ධි පිළිවෙත්ද අනුගමනය කරමින් ආරම්භ කළ අත් යන්ත්‍ර පෙහෙකම්හල් නරඹන්නට තම මිත්‍ර ශ්‍රී නේරු කැඳවා ගෙන ගියේය. අතීත ශ්‍රී විභූතිය අතරින් අනුරාධපුර ඓතිහාසික නටබුන් දැක වශී වූවා පමණක් නොව ඒවා රැක ගැනීමේ අවශ්‍යතාවය ශ්‍රී නේරු විසින් බණ්ඩාරනායක මහතාට අවධාරණය කළේය. අනුරාධපුර නගරය පූජා භූමියක් කිරීමේ චින්තනය බණ්ඩාරනායක යුගයෙන් ආරම්භ වූයේ මේ එකවානුව තුළය. ශ්‍රී ලංකාවට පැමිණි වාරවල ශ්‍රී නේරු හොරගොල්ලේ බණ්ඩාරනායක නිවහනට යාමට අමතක නොකළේය.

එහිදී සුනේත්‍රා, චන්ද්‍රිකා, අනුර තුරුලට ගෙන සුරතල් කළේය. තවත් වරෙක ශ්‍රී නේරු ලංකාවට පැමිණියේ තම දියණිය වූ ඉන්දිරා ගාන්ධි සමඟය. ඒ පැමිණි හැම වාරයකම ඔවුහු බණ්ඩාරනායක පවුලේ නොමඳ ආගන්තුක සත්කාර හා ආදර බුහුමන් ලැබූහ.

දේශපාලන ක්ෂේත්‍රයේදී ශ්‍රී ජවහර්ලාල් නේරු තුමාත් බණ්ඩාරනායක මහතාත් අතර පැවති අදහස් සමානාත්මක භාවයෙන් යුක්ත විය. 1956 ශ්‍රී ලංකාවේ අග්‍රමාත්‍යවරයා බවට බණ්ඩාරනායක මහතා පත්වන විට ශ්‍රී නේරු ඉන්දියාවේ අග්‍රාමාත්‍යවරයාය. විදේශීය ප්‍රතිපත්ති අතින් මේ දෙදෙනාම සමකාලීන අදහස් දැරුවෝය. දෙදෙනාම ඇලුම් කළ පංචශීල ප්‍රතිපත්තිය ඉතා වැදගත් විය. නොබැඳි පිළිවෙතේ නිර්මාතෘවරුන් අතර මේ දෙදෙනාම පුරෝගාමීන් වූහ.

1959 දී බණ්ඩාරනායක මහතා ඝාතනය කෙරිණ. තම මිතුරාගේ අභාවය පිබඳව වඩාත්ම කම්පනය වූයේ ශ්‍රී නේරුය.

හින්දූ පුවත් පතකට ප්‍රකාශයක් කරමින් ශ්‍රී නේරු කියා සිටියේ "මට මගේ මිතුරෙකු පමණක් නොව අත්වැලක්ද අහිමි වූ බවයි".

ශ්‍රී නේරුගේද අභාවයෙන් පසු ඉන්දියාවේ අග්‍රාමාත්‍ය ධූරයට පත් වූයේ ලාල් බහදූර් ශාස්ත්‍රිය. ඒ වන විට ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍ය ධූරය දැරුවේ ලෝකයේ ප්‍රථම කාන්තා අගමැතිනිය වූ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියයි. දෙවැනි කාන්තා අගමැතිනිය වූයේ ඉන්දිරා ගාන්ධි මැතිනියයි.

බණ්ඩාරනායක - ශ්‍රී නේරු අභාවයෙන් පසුවද බණ්ඩාරනායක - නේරු පවුලේ මිත්‍රත්වය ගිලිහුනේ නැත. එය දේශපාලන සබඳතාවයන් මත කෙමෙන් කෙමෙන් වර්ධනය විය. මේ මිත්‍රත්වය නිසා ඉන්දියානු සම්බවයක් ඇති ශ්‍රී ලංකාවේ වතු කම්කරුවන්ගේ ප්‍රශ්නය විසඳන්නට සිරිමා - ශාස්ත්‍රි ගිවිසුම ඇති කර ගත්තේය. එම ගිවිසුම පිළිබඳව සාකච්ඡා සඳහා සිරිමා බණ්ඩාරනායක මැතිනිය ඉන්දියාවට ගියේ රාජ්‍ය අමුත්තකු ලෙස වුවද ඇය බෙහෙවින් ලෙන්ගතුකම් හා ආදර සත්කාර ලැබුවේ ඉන්දිරා ගාන්ධි මැතිනියගෙනි. ඉන්දිරා ගාන්ධි මැතිනියගේත් - සිරිමා බණ්ඩාරනායක මැතිනියගේත් ජීවිත තුළ බෙහෙවින් සමානකම් ඇත. දේශපාලන ජීවිතයත් එක හා සමානය.

ඉන්දිරා ගාන්ධි මැතිනිය ඉන්දියාවේ අග්‍රාමාත්‍යවරිය වීමෙන් අනතුරුවද බණ්ඩාරනායක නේරු පවුල් අතර සබඳතාව පුළුල් වශයෙන් ව්‍යාප්තව පැවතුණි. දේශපාලන වශයෙන් ඔවුනොවුන් අතර ඇති වූ සබඳතාවයේ ප්‍රතිඵලය වූයේ දෙරටේ ප්‍රශ්න අරගලයකින් තොරව සාකච්ඡා මාර්ගයෙන් විසඳා ගැනීමය.

1974 ජුනි 26 වැනි දින පෝක් සමුද්‍ර සන්ධිය පිළිබඳව අයිතිය බෙදා ගන්නටද, කච්චදූවේ අයිතිය ශ්‍රී ලංකාවට ලබා ගන්නටද, 1976 වසරේ අගෝස්තු මාසයේදී ශ්‍රී ලංකා වෙරලේ සිට සැතපුම් දෙසීයක් (200) තුළ ස්වයං අයිතිය තහවුරු කර ගන්නටද දෙරට අතර ඇති සබඳතා තුළින් සිරිමා බණ්ඩාරනායක මැතිනිය සමත් වූවාය.

ආසියාවේ ඇති වූ ලොකුම අරගලය ලෙස 1960 පැවැති ඉන්දු - චීන අරගලය නම් කළ හැක. මෙම අරගලය උත්සන්න වීමෙන් දෙරට අතර යුද්ධයක් ඇති විය. යුද්ධය නිමා කොට මිත්‍රත්වය තහවුරු කර ගන්නට බණ්ඩාරනායක මැතිනිය අත්

වැලක් වූවාය. මේ සම්බන්ධයෙන් 1962 දෙසැම්බර් 10 - 12 යන දිනවල කොළඹදී පැවැත්වූ සමුළුවට ශ්‍රී ලංකා අගමැතිනියගේ ආරාධනයෙන් ඉන්දුනීසියාවෙන් ආචාර්ය සුබන්ද්‍රියෝ, බුරුමයෙන් ජෙනරාල් නේවින්, කාම්බෝජයෙන් සිහනුක් කුමරු, අරාබි ජනරජයෙන් අලිසබ්රි, ඝානාවෙන් මපරිඅව්ටා යන රාජ්‍ය නායකයෝ සහභාගි වූහ.

ඉන්දියාවේ මිත්‍ර රටවල නායකයින් සමග පැවැත්වූ සාකච්ඡාවේ ප්‍රතිඵලය වූයේ ඉන්දු - චීන යුද්ධය වැලැක්වීම සඳහා සාම දූතිකාව ලෙස බණ්ඩාරනායක අගමැතිනිය ඉන්දියාව හා චීනය වෙත යැවීමය. ඒ අනුව 1962 දෙසැ: 27 දා මිත්‍ර ජාතින්ගේ සාම පණිවුඩය රැගෙන ශ්‍රී ලංකා අගමැතිනිය පිකිං හා නව දිල්ලිය බලා පිටත් වූවාය.

බණ්ඩාරනායක අගමැතිනිය චීනයේ ගුවන් තොටුපළට පා තැබීමෙන් අනතුරුව රාජ්‍ය උත්සවයකින් ඇය පිළිගනු ලැබුවාය. ගුවන් තොටුපලේ සිට ඇය ගමන් කළ හැම මාර්ගයකම චීන - ශ්‍රී ලංකා ධජ ලෙලදෙන්නට විය. මග දෙපස රැස්ව මල් පොකුරු අතැතිව සිටි චීන බාලිකාවෝ අගමැතිනියට සුබ පැතූහ. බණ්ඩාරනායක අගමැතිනියගේ ඉල්ලීම පරිදි මිත්‍ර ජාතින්ගේ ඉල්ලීම පිළිගත් චීන - ඉන්දියානු නායකයෝ ඉන්දු - චීන යුද්ධය නතර කරන්නට එකඟ වූවෝය. චීන මහජන සමූහ ආණ්ඩුවේ නායක මාවෝ සේතුං ශ්‍රී ලංකා අග්‍රාමාත්‍යවරියගේ උදාර මෙහෙවර පිළිබඳ අගය කළේය. බිහිසුනු යුද්ධයක් නතර කරන්නට එදා බණ්ඩාරනායක අගමැතිනිය සමත් වූයේ නොබැඳි පිළිවෙතත් හා ඉන්දියාව සමග පැවති මිත්‍රත්වයත් නිසාය.

එදවස ශ්‍රී ජවහර්ලාල් නේරු තුමත්, ශ්‍රීමතී ඉන්දිරා ගාන්ධි මැතිනියත් ශ්‍රී ලංකාවට සැපත් වූ හැම විටෙකම ඔවුන් ඉතා භක්ත්‍යාදරයෙන් පිළිගනු ලැබුවේ බණ්ඩාරනායකවරුන් විසිනි. එදා ශ්‍රී නේරුගේ ගෙලට සෙනෙහස් මල්දම පැළැඳුනේ කුඩා අනුරගේ දෑතිනි. එහෙත් ඉන්දිරා ගාන්ධි මැතිනියගේ පුත් රජීව් ගාන්ධි ඉන්දිය අග්‍රාමාත්‍යවරයා ඉන්දු - ලංකා ගිවිසුම අත්සන් කරන්නට ශ්‍රී ලංකාවට සැපත් වූ විට ඔහු පිළිගන්නට බණ්ඩාරනායක වරුන්ට නොහැකි වූහෝය. අතීතය සිහිපත් කරමින් ඒ ගැන අනුර බණ්ඩාරනායක මහතා ඉන්දිය අගමැති

රජීව් ගාන්ධි මැතිතුමා වෙත යවන ලද හසුනක මෙසේ සඳහන් කළේය.

"ඔබේ ආදරණීය පියාත්, ඔබේ ආදරණීය මවත් පිළිගත් අයුරින් ඔබ පිළිගන්නට නොහැකි වීම ගැන මම අතිශයින්ම කණගාටු වෙමි" යනුවෙනි.

එහෙත් මේ සිදුවීමෙන්ද බණ්ඩාරනායක - නේරු පවුල් අතර සබඳතාවය සිඳී බිඳී ගියේ නැත. ශ්‍රී නේරුත්, ඉන්දිරා හා රජීව් ගාන්ධිත් මේ වන විට ජීවතුන් අතර නැත. එසේ වුවද නේරු පවුල් පදනමෙන් අඩසිය වසකට අධික කාලයක් තුළ බණ්ඩාරනායක පවුල් පදනමත් අතර ගොඩ නැගුනු පෞද්ගලික හා දේශපාලනමය මිත්‍රත්වය චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග යුගය තුළින් සජීවි ලෙස වර්ධනය වනු නිසැකය. චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ ජනතා නායකත්වය වෙනුවෙන් ඉන්දිය අගමැති නරසිංහ රාඕගේ සුබ පැතුම් පණිවුඩයෙන්ද එය සනාථ කර තහවුරු කරයි.

සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ආරාධනයෙන් ශ්‍රී ලංකාවට සැපත් වුන ශ්‍රී ජවහර්ලාල් නේරු තුමා නාවින්නේ බණ්ඩාරනායක ආයුර්වේද පර්යේෂණාගාරය 1962 ඔක්: 14 දා විවෘත කරමින් "දිවංගත අගමැති බණ්ඩාරනායක මහතා වෙනුවෙන් පවත්වන ඕනෑම උත්සවයක් කෙරෙහි මගේ සිත නදින් ඇදී යන්නේය. මා මෙහි පැමිණියේ ඒ නිසාය. ඒ විරෝධාර නායකයාට මම ගරු කරමි. එතුමාගෙන් පසු රටේ බර කරට ගෙන බණ්ඩාරනායක මැතිනිය කටයුතු කරන ආකාරය ඇත්ත වශයෙන්ම ප්‍රශංසනියයි" යනුවෙන් ප්‍රකාශ කළේය.

බණ්ඩාරනායක - ශ්‍රී නේරු පවුල් පදනම් තුලින් ඉන්දු - ලංකා සබඳතා ගොඩනැගෙමින් එවකට පැවති දැවෙන ප්‍රශ්න කිපයක්ම සමථයකට පත් කරන්නට හැකි වූවා සේම උතුරු - නැගෙනහිර ප්‍රශ්නයද විසඳා ලන්නට බණ්ඩාරනායක - නේරු පවුල් පදනමෙන් ගොඩනැගුන ඉන්දු - ලංකා සබඳතාවයන් ඉවහල් වනු ඇතැයි ශ්‍රී ලංකා ජනතාව තුළ අචල විශ්වාසයක් ගොඩනැගී ඇත.

# අගමැති වරම් ලැබීම

"නොට්ල්ල පදවන අත ලොව පාලනය කරයි" යන වදන ශ්‍රී ලංකා මැතිවරණ ඉතිහාසයට එක් කරමින් නව පරිච්ඡේදයක් උදා කළ ඇය මනාප ඡන්ද හාර ලක්ෂයකට අධික මහජන වරමකින් ගම්පහ දිස්ත්‍රික්කයෙන් 94 මැතිවරණයට ඉදිරිපත්ව ශ්‍රී ලංකාවේ දසවන පාර්ලිමේන්තුවේ දෙවන කාන්තා අග්‍රාමාත්‍ය ධූරයට හිමිකම් ලැබූ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය 1994 අගෝස්තු 19 වැනිදා පෙරවරු 10.14 ට යෙදුන සුබ මොහොතින් ජනාධිපති මන්දිරයේදී ජනාධිපති ඩී. බී. විජේතුංග මහතා ඉදිරියේ උපරිම ශක්තියෙන් ගෞරව බහුමානයෙන් යුතුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව රකිමින් නීතියට අනුකූලව කටයුතු කරන බවට ප්‍රතිඥා දෙමින් ජගත් දේශපාලනයේ නව පරිච්ඡේදයක් උදා කරමින් ශ්‍රී ලංකාවේ 11 වැනි අග්‍රාමාත්‍ය පදවියටත්, දෙවැනි කාන්තා අගමැතිනිය ලෙසත්, දසවැනි පාර්ලිමේන්තුවේ ශ්‍රී ලංකා අග්‍රාමාත්‍යවරිය වශයෙනුත් දිවුරුම් දී වැඩ බාර ගත්තාය.

19 වැනි සිකුරාදා පෙ.ව 9.32 ට යෙදුණු සුබ නැකතින් කොළඹ රොස්මිඩ් පෙදෙසේ සිය නිවසේ පිය ගැට පෙළින් ඇය ජනපති මැඳුර බලා යාමට එළියට බසිද්දී සමන්පිච්ච මල් සහිතව කිරි විදුරුවක් රැගත් දැරියක් ඉදිරියට ආවාය. තම ආදරණීය යසෝදරා දියණියගේ වයසේ පසුවන මාලි ලියනගේ දැරිය සමන්පිච්ච මල් බහාලූ කිරි විදුරුව රැගෙන චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය ඉදිරියට පැමිණි අවස්ථාවේ සෙනෙහසින් යුතුව දැරියගේ හිස පිරිමැද කෑම මේසයට ගොස් හෙළ චාරිත්‍ර ධර්මවලට අනුකූලව කිරිබත් අනුභව කිරීමෙන් අනතුරුව බුදුන් වැන්දාය.

ඉන්පසු මහ ගෙදරට ගොස් සිය මව වන සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය බැහැ දැක දෙපා නැමද අවසර ගත්තාය. එහිදී පැපිලියානේ සුනේත්‍රා දේවි පිරිවෙනේ පරිවෙනාධිපති ආචාර්ය මැදගොඩ සුමනතිස්ස හිමියන් හා දරම්ටිපල රතනසාර හිමියන් ප්‍රධාන මහා සංඝ රත්නය සෙත් පිරිත් දේශනා කර නව අග්‍රාමාත්‍යතුමියට තුණුරුවන්ගේ ආශිර්වාදය හා දෙවියන්ගේ දේව රැකවරණය ප්‍රාර්ථනා කළහ.

ජනාධිපති ඩී.බී විජේතුංග මහතා ඉදිරියේ ප්‍රතිඥාව කියවා ජාතිකාභිමානයෙන් සිය දේශයේ දුක් විඳින ජනතාවගේ යුග මෙහෙවරට රන් පැහැ පැනකින් තම සුපුරුදු අත්සන තැබුවාය. සුදු මිශ්‍ර තිල්පාට උඩරට සාරියකින් සැරසී සුදු පබළු මාලයක් පැළඳ චාම් ලෙස සැරසී සිටි චන්ද්‍රිකා මැතිනිය හෙළ කුල කාන්තාවකට සරිලන දේහ ලක්ෂණයෙන් ඔද වැටී සිටියාය. ඇය හෙළ කුල කාන්තාවගේ නිහතමානීත්වයේ හා චාම් ගති ගුණ දැක්වෙන කැඩපතක් වූවාය. ඇ මුළු කාන්තා වර්ගයාටම පරමාදර්ශයක් වූවාය. නව අග්‍රාමාත්‍ය ධූරයේ වැඩ බාර ගත් චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය මුලින්ම කළේ තම මෑණියන් වන සිරිමා බණ්ඩාරනායක මැතිනියට වැඳ නමස්කාර කිරීමය.

ජනාධිපතිවරයා සමග නව ඇමති මණ්ඩලයේ විසිතුන් දෙනෙකුම මෙදින අග්‍රාමාත්‍යතුමිය සමග දිවුරුම් දී නව රජයේ වැඩ බාර ගත්හ.

පෙරවරු 10 ට ජනාධිපති මන්දිරයට සැපැත් වූ නව අගමැතිනිය හා අමාත්‍ය මණ්ඩලය රතු පලස මතින් ජනාධිපතිතුමා ඉදිරියට පැමිණීමට පෙර ජනාධිපති මන්දිරය අවට රැස්ව සිටි මහජනතාව ඔල්වරසන් හඬ නගමින් ඇයට හා නව ඇමති මණ්ඩලයට සුබ පැතුවෝය. අග්‍රාමාත්‍ය ධූරයේ වැඩ බාර ගැනීමෙන් අනතුරුව අරලිය ගහ මන්දිරයේ පැවති දෙස් විදෙස් ජනමාධ්‍යකරුවන් අමතමින් විධායක ජනාධිපති ක්‍රමයේ හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කිරීමට සෙසු පක්ෂවල සහයෝගයෙන් ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයක් පත් කරන බවද පැවසුවාය. උතුරු - නැගෙනහිර ප්‍රශ්නය නිමා කරන්නට කොටි සංවිධානය ඇතුළු ද්‍රවිඩ පක්ෂ සමග සාකච්ඡා අරඹන බවත් ජීවන වියදම අඩු කර ජනතා සහන සැලසීමට තුන් මසක් ඇතුළත ක්‍රියා කරන බවද වැඩි දුරටත් සඳහන් කළාය.

දැන් පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ විධායක ජනාධිපති ක්‍රමය වෙනස් කළ නොහැකි බවද, එතුමිය ප්‍රකාශ කළාය. අල්ලස් කොමිසමක්ද, විජය කුමාරතුංග, ලලිත් ඇතුලත්මුදලි හා ආර්. ප්‍රේමදාස යන මහත්වරුන්ගේ ඝාතන ගැනද පසුගිය රජය කාලයේ අතුරුදහන් වූ පුද්ගලයන් සෙවීමට කොමිසමක් පත් කරන බවටද අගමැතිනිය ප්‍රතිඥා දුන්නාය.

94 මැතිවරණය තුළින් පොදු ජන එක්සත් පෙරමුණට ජය අත්වීමෙන් ප්‍රීතියට පත් පක්ෂයේ අනුගාමිකයන්ට 1994 අගෝ. 19 වැනිදා තවත් ප්‍රීතිමත් දිනයක් උදා විය. නව අග්‍රාමාත්‍යවරිය දිවුරුම් දෙන සුබ නැකත් හෝරාව සමීප වෙත්ම රට පුරා ජනතාව ඔල්වරයන් හඬ නැගූහ. රතිඤ්ඤා හඬ රට පුරාම රැව් පිළිරැව් දුනි. අගමැති පදවි ප්‍රාප්ත වීමෙන් පසු ඇය ජනතාව ඇමතුවාය.

තමාට උපකාර කළ සියලුම ඡන්දදායකයන්ට ස්තුති කළාය. රටේ සාමය ස්ථාපිත කරන ලෙස තම අනුගාමිකයන්, ප්‍රතිවාදීන් ඇතුළු සමස්ථ මහජනතාවගෙන් ඉල්ලා සිටියාය. යුක්තිය, සාධාරණත්වය, හා මිනිස්කම රජයන අලුත් රටක් බිහි කරන්නට නව රජය ඇප කැප වී කටයුතු කරන බවත් නීතිය අතට ගෙන කටයුතු නොකරන ලෙස සියලුමදෙනාගෙන් ඉල්ලා සිටින බවත් ශ්‍රී ලංකා අග්‍රාමාත්‍යවරිය වශයෙන් චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය විසින් ජාතිය අමතමින් පැවසුවාය.

"ජනතාව විසින් මවෙත පැවරූ කාර්ය භාරය අවංකව හා සාධාරණව ඉටු කිරීමේ අභියෝගය බාර ගන්නවා." යනුවෙන් සිය කතාව ආරම්භ කළ නව අගමැතිනිය මෙසේද කීවාය.

"පොදු ජන එක්සත් පෙරමුණ කෙරෙහි තැබූ විශ්වාසය ගැන මුලින් අවංකව ස්තුති කළ යුතුයි. මහජනතාව විසින් බාර දුන්න කටයුත්ත නිහතමානීව, කැපවීමකින් ඉටු කිරීමට බැඳී සිටිනවා. අප රටේ යළිත් වරක් ප්‍රජාතන්ත්‍රවාදය ජනතා නිදහස ස්ථාපිත කරන්නට වහාම අවශ්‍ය කටයුතු යොදන බවට ප්‍රතිඥා දෙනවා. සියලු ජන කොටස්වලට කතා කිරීමේ නිදහස, වෘත්තියේ නිදහස, ජීවත් වීමේ නිදහස ස්ථාපිත කර රැක දෙනවා"

"පසුගිය කාලයේ භීෂණය දේපොල පලිගැනීම්වලින් සමාජ දේශපාලන සංස්කෘතික ව්‍යුහයේ විශාල පරිහානියක් ඇති වුණා. ඒ තත්වය වහා වෙනස් කළ යුතුයි. ප්‍රජාතන්ත්‍රවාදී ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී නිදහස ස්ථාපිත කරමින් දේශපාලන විරුද්ධවාදීන්ට පවා නිදහසේ සිටීම, කැමති දේශපාලනයක් කිරීමේ අයිතිය ආරක්ෂා කර තහවුරු කරන බවට පොරොන්දු වෙනවා"

"අනලොස්සකට සීමා වූ ආර්ථික වරප්‍රසාද මුළු මහත් ජනතාවටම ලබා දෙන අයුරින් ස්ථාවර හා ශක්තිමත් ආර්ථිකයක් වහා ගොඩ නගනවා"

"දේශීය නිෂ්පාදන සංවර්ධනය කරමින් පෞද්ගලික අංශයේ සහභාගිත්වයෙන් ජාතික ආර්ථික සැලැස්මක් ගොඩ නැගීමට අපේ රජය බැඳී සිටිනවා. උතුරු නැගෙනහිර වසර 11 ක් තිස්සේ අඛණ්ඩව පැවත එන මහා විනාශකාරී යුද්ධය නවත්වා දැමීම සඳහා දේශපාලන විසඳුම් සෙවීමට උපරිම ශක්තිය යොදවනවා. දෙමළ ජනතාවට ආත්ම ගරුත්වයක් ඇතිව අප රටේ ජීවත් වීමේ අයිතිය ලබා දෙමින් ඔවුන්ගේ ප්‍රශ්නවලට යුද්ධය වෙනුවට සාකච්ඡාවෙන් දේශපාලන විසඳුම් යෙදීමට දෙමළ ජනතාවගේ සියලු නියෝජිතයන් සමග සාකච්ඡා කරනවා"

"අගෝස්තු 16 වැනිදා ජන වරමෙන් අප ලබා ගත් ශක්තිය ජන වාර්ගික ප්‍රශ්නයට විසඳුම් සඳහා උපරිම වශයෙන් යොදා ගන්නවා. ඒ වගේම ඔබ සැමගෙන් විශේෂ ඉල්ලීමක් කරනවා. සාමය හා නීතිය ආරක්ෂා කිරීම අපගේ පරම යුතුකම බව මතක් කළ යුතුයි. පසුගිය කාලේ අපේ පාක්ෂිකයන් සෑහෙන පිරිසකට දේපල හානි වී, රැකියා අහිමි වී, දේශපාලන පලිගැනීම්වලට ලක් වූ බව දන්නවා. එහෙත් අප ඔබ එකතුව ජය ගත් සටනින් මේ රටේ පසුගිය කාලේ පැවැති තිරිසන් යුගය වෙනුවට උතුම් මනුෂ්‍ය සමාජයක් ගොඩ නගන්නට ඇප කැප වී සිටිනවා"

"හිංසාකාරී කටයුතු සම්පූර්ණයෙන් අත හැර ප්‍රචණ්ඩකාරී ක්‍රියාවල නොයෙදී වෙනත් අයද නොයොදවා සාමය ඇති කරන්නට සහය දෙන්න. වැරදිකරුවන්ට නීතිය කඩ කළ අයට අවශ්‍ය දඬුවම් ලබා දීමේ කාරිය රජයට බාර දෙන්න. නීතිය අතට ගන්න එපා. රජයට සහයෝගය දෙන්න."

පක්ෂ භේදයෙන් තොරව වැරදිකරුවන් හට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරවන පොලිසියේ හා රජයේ නිලධරයනට අපගෙන් හානියක් සිදු නොවේ. සියලුම වැරදිකරුවන් හට නීත්‍යානුකූල දඬුවම් ලබා දීමට කටයුතු කරන බව තරයේ මතක් කළ යුතුයි".

"වසර 17 ට පසු සාධාරණ මැතිවරණයක් පැවැත්වීම ගැන ගරු ජනාධිපතිතුමාට, හිටපු අගමැතිතුමාට ස්තුතිය හා ප්‍රශංසාව හිමි විය යුතුයි. තැන තැන ප්‍රචණ්ඩකාරී ක්‍රියා කිපයක්ම හැරුණු විට මැතිවරණය සාධාරණව සිදු වූ බව ප්‍රකාශ කළ යුතුයි. මැතිවරණ කොමසාරිස්වරයාට හා නිලධාරින්ට ස්තුති කළ යුතුයි."

"නොයෙකුත් බාධක මැද්දේ ප්‍රශ්නයක් නැතිව රාජ්‍ය බලය අපට බාර දීමට කටයුතු කළ ජනාධිපතිතුමාට හා හිටපු අගමැතිතුමාට ස්තුතිය හා ප්‍රශංසාව හිමි වේ."

"ඔබට හා අපට දීර්ඝ කාලයක් තිස්සේ හිංසනයට ලක්ව නොයෙකුත් පලිගැනීම්වලට භාජනය වී කටුක අතීතයකට මුහුණ දෙන්නට සිදු වුණා. අපේ රටේ අනාගතය වෙනුවෙන් දුටු සිහිනය ඉදිරි කාලයේදී සැබෑ කරවන්නට එකට එක්ව අවංකව නිර්භීතව කැපවීමෙන් කටයුතු කරමුයි මා හැමට ආරාධනය කරනවා"

ඡන්දය දුන් නොදුන් සියලුදෙනා වෙනුවෙන් සේවය කිරීමට නව රජය බැඳී සිටිනවා"

"යුක්තිය සාධාරණත්වය මිනිස්කම රජයන අලුත් රටක් බිහි කරන්නට අපේ රජය උපරිම ශක්තියෙන් ඇප කැප වෙනවා"

"ඔබ සැමට තෙරුවන් සරණයි"

කියා ප්‍රාර්ථනා කරමින් ඇය ජාතිය අමතා කළ ප්‍රථම කතාව අවසන් කළාය.

ගම්පහ දිස්ත්‍රික්කයේ ජනතාවට විශේෂ පණිවුඩයක් නිකුත් කරමින් ඇය කෙරෙහි ගම්පහ ජනතාව තැබූ විශාල විශ්වාසය කිසිසේත් පලුදු වෙන්නට ඉඩ නොදෙන බවත් අඳුරු හා කටුක යුගයකින් රට ගොඩ ගන්නට ඔවුන් තමාට දුන් සහයට තම ස්තුතිය පුද කරන බවත් පැවසුවාය.

"මගේ උපරිම ශක්තියෙන් මගේ ගම් ප්‍රදේශයට සේවය කරනවා" යැයිද නව අග්‍රාමාත්‍යතුමිය ප්‍රකාශ කළාය.

ශ්‍රී ලංකාවේ දසවැනි පාර්ලිමේන්තුවේ නව අග්‍රාමාත්‍යවරිය හා නව රජයේ මුදල්, සැලසුම්, ජනවාර්ගික හා ජාතික ඒකාබද්ධ අමාත්‍යවරිය ලෙසද ඇය කටයුතු කරනු ඇත.

නව අමාත්‍ය මණ්ඩලයේ කාර්ය නියමයක් නොමැති ඇමතිණිය ලෙසත්, නව රජයේ අමාත්‍ය මණ්ඩල උපදේශිකාව වශයෙන්ද සිරිමා බණ්ඩාරනායක මැතිනිය පත්ව සිටින්නීය. 1916 උපත ලද බණ්ඩාරනායක මැතිනිය ප්‍රථම කාන්තා අගමැතිනිය වශයෙන්ද දෙවරක් ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍ය පදවිප්‍රාප්ත වී ඇත.

කළුතර දිස්ත්‍රික්කයෙන් තේරී පත් වූ වැඩිම මනාප ඡන්ද 88,213 ක් ලබා ගත් රත්නසිරි වික්‍රමනායක මහතා, නව කැබිනට්

මණ්ඩලයේ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා වශයෙන් පත්විණි.

සංස්කෘතික හා ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යවරයා වශයෙන් පත් වූයේ ලක්ෂ්මන් ජයකොඩි මහතාය. මෙතුමා මනාප ඡන්ද 62,652 ක් ලබා ගම්පහ දිස්ත්‍රික්කයෙන් පාර්ලිමේන්තුවට පිවිස ඇත.

මෙවර මැතිවරණයේදී කොළඹ දිස්ත්‍රික්කයෙන් මනාප ඡන්ද 50,872 ක් ලබා ගනිමින් පාර්ලිමේන්තුවට පිවිසි බර්නාඩ් සොයිසා මහතා රජයේ විද්‍යා, තාක්ෂණ, කටයුතු හා මානව සම්පත් පිළිබඳව අමාත්‍යවරයා වශයෙන් පත් විය.

දි. මු. ජයරත්න මහතා නව රජයේ කෘෂිකර්ම, ඉඩම් හා වන සංරක්ෂණ අමාත්‍යවරයා වශයෙන් පත් විය. මහනුවර දිස්ත්‍රික්කයෙන් මනාප ඡන්ද 1,01,558 ක් ලබා ගෙන පාර්ලිමේන්තුවට පිවිස ඇත.

නව රජයේ කම්කරු හා වෘත්තීය පුහුණු අමාත්‍යවරයා ලෙස තේරී පත්ව ඇත්තේ මහින්ද රාජපක්ෂ මහතාය. මෙතුමා බෙලිඅත්ත ආසනය නියෝජනය කරමින් පාර්ලිමේන්තුවට තේරී පත්ව ඇත.

ශ්‍රී ලංකාවේ මුස්ලිම් කොංග්‍රසයේ නායක ඇම්. එච්. ඇම්. අෂ්රොෆ් මහතා, නාවික, වරාය හා පුනරුත්ථාපන කටයුතු පිළිබඳ අමාත්‍යවරයා වශයෙන් තේරී පත්ව ඇත.

නව රජයේ වාරි මාර්ග, විදුලිය බල හා බලශක්ති අමාත්‍යවරයා ලෙසත් රාජ්‍ය ආරක්ෂක නියෝජ්‍ය ඇමතිවරයා ලෙසත් කර්නල් අනුරුද්ධ රත්වත්ත මහතා තේරී පත්ව සිටී. එතුමා මහනුවර දිස්ත්‍රික්කය නියෝජනය කරමින් මනාප ඡන්ද 92,644 ක් ලබා ගෙන පාර්ලිමේන්තුවට පිවිස ඇත.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම්වරයා වන ධර්මසිරි සේනානායක මහතා නව රජයේ ප්‍රවෘත්ති, සංචාරක කටයුතු හා ගුවන් ගමන් පිළිබඳ අමාත්‍යවරයා වශයෙන් තේරී පත්ව ඇත. මෙතුමා මෙවර ජාතික ලැයිස්තුවෙන් තේරී පත් වූ මන්ත්‍රීවරයෙකි.

නව රජයේ වෙළඳ කටයුතු, වානිජ හා ආහාර අමාත්‍යවරයා වශයෙන් කිංස්ලි ටී. වික්‍රමරත්න මහතා පත්ව සිටී. මෙතුමා කොළඹ දිස්ත්‍රික්කයෙන් මනාප ඡන්ද 95,077 ක් ලබා ගෙන පාර්ලිමේන්තුවට පිවිසි මන්ත්‍රීවරයෙකි.

සී.වී. ගුණරත්න මහතා නව රජයේ කර්මාන්ත සංවර්ධන අමාත්‍යවරයා වශයෙන් තේරී පත්ව ඇත. මෙතුමා මෙවර මැතිවරණයේදී මනාප ඡන්ද 1,14,756 ක් ලබා ගෙන පාර්ලිමේන්තුවට පිවිස ඇත.

අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යවරයා වශයෙන් තේරී පත්ව ඇත්තේ රිචඩ් පතිරණ මහතාය. මෙවර මහ මැතිවරණයෙන් මෙතුමා ගාල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරමින් මනාප ඡන්ද 1, 16, 843 ක් ලබා ගෙන පාර්ලිමේන්තුව නියෝජනය කිරිමට වරම් ලබා ඇත.

නව කැබිනට් මණ්ඩලයේ නිවාස ඉදිකිරීම් හා පොදු පහසුකම් කටයුතු පිළිබඳ අමාත්‍යවරයා වශයෙන් නිමල් සිරිපාල ද සිල්වා මහතා පත්ව සිටී. එතුමා මෙවර මැතිවරණයේදී මනාප ඡන්ද 1,11,730 ක් ලබා ගෙන පාර්ලිමේන්තුවට පත්ව ඇත.

මංගල සමරවීර මහතා නව රජයේ කැබිනට් මණ්ඩලයේ තැපැල් හා විදුලි සංදේශ පිළිබඳ ඇමතිවරයා වශයෙන් තේරී පත්ව ඇත. මෙතුමා මෙවර මැතිවරණයෙන් මාතර දිස්ත්‍රික්කයෙන් ඉදිරිපත්ව මනාප ඡන්ද 61,574 ක් ලබා ගෙන පාර්ලිමේන්තුවට පත්ව සිටී.

නව කැබිනට් මණ්ඩලයේ තරුණ කටයුතු, ක්‍රීඩා හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යවරයා ලෙස පත්ව සිටින්නේ ඇස්. බී. දිසානායක මහතාය. මෙතුමා මෙවර මහ මැතිවරණයෙන් මනාප ඡන්ද 38,372 ක් ලබා ගෙන පාර්ලිමේන්තුවට තේරී පත්ව සිටී.

නව රජයේ ස්වදේශ කටයුතු, ප්‍රාදේශීය සභා හා සමුපකාර අමාත්‍යවරයා වශයෙන් තේරී පත්ව ඇත්තේ අමරසිරි දොඩංගොඩ මහතාය. දකුණු පළාත් සභාවේ මහ ඇමතිවරයා වශයෙන්ද, මෙතුමා කටයුතු කර ඇත. මෙවර මැතිවරණයේදී මනාප ඡන්ද 1,76,151 ක් ලබා ගැනීමට දොඩංගොඩ මහතා සමත් විය.

නව රජයේ ප්‍රවාහන, මහමාර්ග, පාරිසරික කටයුතු හා වනිතා කටයුතු ඇමැතිනිය වශයෙන් ශ්‍රීමතී ඇතුලත්මුදලි මහත්මිය පත්වූවාය. ඇය ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් ජාතික පෙරමුණේ (ලලිත් පිල) නායිකාව වශයෙන් පොදු පෙරමුණු සංධානයට එක්ව මෙවර මහ මැතිවරණයෙන් වැඩිම මනාප ඡන්ද සංඛ්‍යාවක් ලබා පාර්ලිමේන්තුවට තේරී පත්වූවාය.

අධිකරණ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදන හා විදේශ වෙළඳාම් කටයුතු බාර අමාත්‍යවරයා වශයෙන් තේරී පත්ව සිටින්නේ ජී. ඇල්. පීරිස් මහතාය. කොළඹ විශ්ව විද්‍යාලයේ හිටපු උපකුලපතිවරයෙකුද වන පීරිස් මහතා කොළඹ සරසවියේ නීති පීඨාධිපතිවරයා වශයෙන්ද කටයුතු කර ඇත.

නව රජයේ සෞඛ්‍ය හා සමාජ සේවා අමාත්‍යවරයා වශයෙන් ඒ. එච්. එම්. ෆවුසි මහතා පත්ව ඇත. මෙවර මහ මැතිවරණයට කොළඹ දිස්ත්‍රික්කයෙන් තේරී පත් වූ ෆවුසි මහතා මනාප ඡන්ද 72,294 ක් ලබා පාර්ලිමේන්තුවට පත් විය.

නව රජයේ විදේශ කටයුතු බාර අමාත්‍යවරයා වශයෙන් තේරී පත්ව සිටින්නේ ලක්ෂ්මන් කදිරගාමර් මහතාය. රාජ්‍ය නීතිඥයකු වන මෙතුමා මහනුවර ත්‍රිත්ව විද්‍යාලයේ අධ්‍යාපනය ලබා ඇත. කැබිනට් මණ්ඩලයේ සිටින එකම ද්‍රවිඩ ජාතිකයා මෙතුමාය.

ඉන්දික ගුණවර්ධන මහතා නව රජයේ ධීවර හා ජලජ සම්පත් අමාත්‍යවරයාය. මෙතුමා පිලිප් ගුණවර්ධන මහතාගේ ජ්‍යෙෂ්ඨ පුත්‍රයාය. කොළඹ දිස්ත්‍රික්කයෙන් තරග කොට පාර්ලිමේන්තුවට පිවිසීමට වරම් ලබා ඇත.

ජනාධිපති ඩී. බී. විජේතුංග මහතා ආරක්ෂක හා බුද්ධ ශාසන අමාත්‍යවරයා බවට පත් විය.

ප්‍රථම අග්‍රාමාත්‍යවරිය වශයෙන් චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය ඉහත කී අමාත්‍ය මණ්ඩලය සමග දිවුරුම් දීමෙන් අනතුරුව කෝට්ටේ ශ්‍රී නාග විහාරයට පැමිණ ආගමික වතාවත්වල නියැලී තෙරුවන්ගේ ආශිර්වාදය ලබා ගත්හ. ගරු මාදුළුවාවේ සෝභිත නායක ස්වාමීන් වහන්සේ ඇතුළු ගරුතර මහා සංඝරත්නය එතුමියට සහ නව කැබිනට් අමාත්‍ය මණ්ඩලයට පිරිත් දේශනා කර තුණුරුවන්ගේ ආශිර්වාදයත්, දෙවියන්ගේ රැකවරණයත් පැතූහ. මෙම අවස්ථාවට සිරිමා බණ්ඩාරනායක මැතිනියද එක් වූවාය.

සිය පියා වන දිවංගත එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක ශ්‍රී මතාණන්ගේ හොරගොල්ල සමාධිය වෙත ගොස් ගෞරව දැක්වීමටද, ඇය අමතක නොකළාය. සිය මව වන සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ දෙපා වැඳ ඇයට සිය ප්‍රණාමය පුදකර, අග්‍රාමාත්‍යවරිය වශයෙන් දිවුරුම් දීමට ගමනාරම්භ

කළාය. දිවුරුම් දීමෙන් පසුවද ඇය තම මැණියන්ට දෙවන වරටත් නමස්කාර ප්‍රණාමය දැක්වූවාය.

ශ්‍රී ලංකාවේ දෙවැනි කාන්තා අග්‍රාමාත්‍යවරිය වශයෙන් දස වැනි පාර්ලිමේන්තුවට පිවිසීමට දිවුරුම් දීමෙන් අනතුරුව සිය මව වන බණ්ඩාරනායක මැතිනිය විසින් උදාර සෙනෙහසින් යුතුව ඇය සිප වැළඳ ගෙන මව් කෙනෙකුගෙන් පිදෙන උදාර උත්තමාචාරය පිදූවාය.

ඒ උදාර සෙනෙහස තුළ "මා ලේ කිරි කර පෙවූ මගේ ආදරණීය දියණියනි, ඔබ ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍යවරිය නොව මා ජීවත්ව සිටියදීම ජනාධිපතිනිය වීමටද වරම් ලැබේවා" යි නිසැකයෙන්ම එතුමිය ප්‍රාර්ථනා කරන්නට ඇත.

යුධ්වභයක් ජනතා හදවත් තුළ ගැහෙන රිද්මය හඳුනා ගත් 94 මැතිවරණයෙන් විශිෂ්ඨ ජනවරමක් ලබා ගත් ඔබට ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරිය වීමේ භාග්‍යය උදා වී ඇත.

දුක්විඳින ජනතා හද ගැබතුර ජීවමානව වෙසෙන ඔබතුමිය ශ්‍රී ලංකාවේ ජනාධිපතිතුමිය වේවායි මුළුමහත් ජනතාව නගන හඬ ශ්‍රී ලංකා ධරණිතලය තුළම ජය සංඛ නාදයක් සේ රැව් පිළිරැව් දී ඇත.

# සාමය, සමාදානය, සදාචාරය, සමෘද්ධිය වෙනුවෙන් කැප කළ ජනවරම

අපේ උතුම් මව්බිම බිහිසුණු ඝනඳුරක ගිල්වමින් පසුගිය දිගු කාල පරිච්ඡේදයක මානව සදාචාරය වල්මත් කරවමින් හමා ගිය ඛේදවාචකයේ පුන්බුන් ජන හදවත් ගැබතුර සදාතනික වූ අවධියක, සාමය, සමාදානය, සදාචාරය, සමෘද්ධිය නැමති නව ලොවේ රත් අරුණළු ලක් දෙරණ සිසාරා පතිත වන දිනය පිළිබඳව මැවූ සිහිනය සැබෑ කරවන්නට තැබූ බලාපොරොත්තු ජන වරමින් සඵල කර ගන්නට තැබූ විශ්වාසය වූයේ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ නායකත්වයෙන් යුත් රජයකි.

62% ක් ඉක්මවා ගිය ජනවරම ශ්‍රී ලංකා දේශපාලන ඉතිහාසයේ මෙතෙක් නොවූ විරූ සේම සෙසු ලෝකයේ අසහාය නායකත්වයට පත් ජන නායකයින්ගේ මට්ටමින් සසදා බැලුවද එයද අභිබවා යන්නට තරම් ඉහළ තැනකට පත් වී තිබීම චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ජනපතිනියගේ දේශපාලන ජීවිතයේ මෙන්ම ලෝක දේශපාලන ඉතිහාසයේ සුවිශේෂ වූ දුර්ලභ ගනයේ සිද්ධියකි.

අපේක්ෂා භංග වී පැගී, තැලී පොඩී වුණ ජාතියකටද, ජාතිවාදී ප්‍රශ්න, බෙදුම්වාදී අරගල තුළින් කැඩුණු බිඳුණු, භීෂණයේ මරබියෙන් පෙළුණ රටකටද, අනාගත සුභදායක මංපෙත් විවර කරමින් සෞභාග්‍ය හා සාමය, සංකේතවත් කළ ප්‍රදීපස්ථම්භයක් බඳු, සාපේක්ෂ වශයෙන් කෙටි කලක් තුළින් පෙරට විත් චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය විවෘත හදවතින් දුන් පණිවුඩය ඈත පිටිසර ගම් නියම් ගම් සිසාරා හමා ගියේ විමුක්තියේ කාහල නාදයක් සේය.

ජනපති වරණයෙන් අති විශිෂ්ඨ ජයක් අත්පත් කර ගත් කුමාරතුංග මැතිනිය ඡන්දය ප්‍රකාශ කළ මුළු ඡන්ද ප්‍රමාණය වන 77,13,232 ක් වූ ගණනින් සියයට 70.52 ක් වූ ප්‍රමාණයෙන් කුමාරතුංග මැතිනිය ඡන්ද 47,09,205 ක් වූ ප්‍රමාණයක් එනම් සියයට 62.28 ක් ලබා ගත්තාය.

දිසානායක මැතිනිය ලබා ගත්තේ ඡන්ද 27,15,283 කි. සියයට ගණනින් 35.91 කි. 1982 ප්‍රථම ජනපතිවරණයෙන් ජේ. ආර්. ජයවර්ධන මැතිතුමා මුළු ලියාපදිංචි ඡන්ද ප්‍රමාණය වන 65,22,000 කින් 34,50,000 ක් ලබා සියයට 52.91 ක් ලබා ජය ප්‍රත්‍යක්ෂ කළේය. එසේම 1989 දෙවන ජනපතිවරණයේදී මුළු ඡන්ද 51,86,000 කින් 25,69,000 ක්ද සියයට 50.43 ක් ලබා ආර්. ප්‍රේමදාස මැතිතුමා ජයග්‍රහණය කළේය. මේ අනුව සලකා බැලීමේදී 1994 ජනපතිවරණයෙන් චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය ලත් සුවිශේෂ ජනවරම ලංකා දේශපාලන ඉතිහාසයේ නොව ලෝක දේශපාලන ඉතිහාසයේ ලියවුණු අසිරිමත් ජනවරමකි.

මේ අනුව බලන කල පහත සඳහන් අයුරු 1994 ජනපතිවරණයෙන් අපේක්ෂකයන් ලැබූ ඡන්ද ප්‍රමාණය පහත දක්වා ඇත.

| | | ලැබූ ඡන්ද ප්‍රතිශතය |
|---|---|---|
| 1. චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය (පොදු ජන එක්සත් පෙරමුණ) | 47,09,205 | - 62.28 |
| 2. වජිරා ශ්‍රීමති දිසානායක මැතිනිය (එක්සත් ජාතික පක්ෂය) | 27,15,283 | - 35.91 |
| 3. හඩ්සන් සමරසිංහ මහතා (ස්වාධීන අංක 2) | 58,886 | - 0.78 |
| 4. හරිස්චන්ද්‍ර විජයතුංග (සිංහල භූමි පුත්‍ර පක්ෂය) | 32,651 | - 0.43 |
| 5. ඒ. ජේ. රණසිංහ (ස්වාධීන අංක 1) | 22,752 | - 0.30 |
| 6. නිහාල් ගලප්පත්ති (ශ්‍රී ලංකා ප්‍රගතිශීලී පෙරමුණ) | 22,749 | - 0.30 |
| ඡන්දය පාවිච්චි කළ මුළු ඡන්ද සංඛ්‍යාව | 75,61,526 | - 98.03 |
| අවලංගු ඡන්ද සංඛ්‍යාව | 1,51,706 | - 1.97 |
| පාවිච්චි කළ වලංගු ඡන්ද ප්‍රමාණය | 77,13,232 | - 70.52 |
| ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාව | 1,09,37,279 | |

# සාමය, සමාදානය, සදාචාරය, සමෘද්ධිය වෙනුවෙන් කැප කළ ජනවරම

අපේ උතුම් මව්බිම බිහිසුණු සනදූරක ගිලවමින් පසුගිය දිගු කාල පරිච්ඡේදයක මානව සදාචාරය වල්මත් කරවමින් හඹා ගිය බේදවාචකයේ සුන්බුන් ජන හදවත් ගැබතුර සදාතනික වූ අවධියක, සාමය, සමාදානය, සදාචාරය, සමෘද්ධිය නැමති නව ලොවේ රත් අරුනළු ලක් දෙරණ සිසාරා පතිත වන දිනය පිළිබඳව මැවූ සිහිනය සැබෑ කරවන්නට තැබූ බලාපොරොත්තු ජන වරමින් සඵල කර ගන්නට තැබූ විශ්වාසය වූයේ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ නායකත්වයෙන් යුත් රජයකි.

62% ක් ඉක්මවා ගිය ජනවරම ශ්‍රී ලංකා දේශපාලන ඉතිහාසයේ මෙතෙක් නොවූ විරූ සේම සෙසු ලෝකයේ අසහාය නායකත්වයට පත් ජන නායකයින්ගේ මට්ටමින් සසඳා බැලුවද එයද අභිබවා යන්නට තරම් ඉහළ තැනකට පත් වී තිබීම චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ජනපතිනියගේ දේශපාලන ජීවිතයේ මෙන්ම ලෝක දේශපාලන ඉතිහාසයේ සුවිශේෂ වූ දුර්ලභ ගනයේ සිද්ධියකි.

අපේක්ෂා භංග වී පැගී, තැලී පොඩි වුණ ජාතියකටද, ජාතිවාදී ප්‍රශ්න, බෙදුම්වාදී අරගල තුළින් කැඩුණු බිඳුණු, භීෂණයේ මරබියෙන් පෙළුණ රටකටද, අනාගත සුභදායක මංපෙත් විවර කරමින් සෞභාග්‍ය හා සාමය, සංකේතවත් කළ ප්‍රදීපස්ථම්භයක් බඳු, සාපේක්ෂ වශයෙන් කෙටි කලක් තුළින් පෙරට විත් චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය විවෘත හදවතින් දුන් පණිවුඩය ඈත පිටිසර ගම් නියම් ගම් සිසාරා හඹා ගියේ විමුක්තියේ කාහල නාදයක් සේය.

ජනපති වරණයෙන් අති විශිෂ්ඨ ජයක් අත්පත් කර ගත් කුමාරතුංග මැතිනිය ඡන්දය ප්‍රකාශ කළ මුළු ඡන්ද ප්‍රමාණය වන 77,13,232 ක් වූ ගණනින් සියයට 70.52 ක් වූ ප්‍රමාණයෙන් කුමාරතුංග මැතිනිය ඡන්ද 47,09,205 ක් වූ ප්‍රමාණයක් එනම් සියයට 62.28 ක් ලබා ගත්තාය.

දිසානායක මැතිනිය ලබා ගත්තේ ඡන්ද 27,15,283 කි. සියයට ගණනින් 35.91 කි. 1982 ප්‍රථම ජනපතිවරණයෙන් ජේ. ආර්. ජයවර්ධන මැතිතුමා මුළු ලියාපදිංචි ඡන්ද ප්‍රමාණය වන 65,22,000 කින් 34,50,000 ක් ලබා සියයට 52.91 ක් ලබා ජය ප්‍රත්‍යක්ෂ කළේය. එසේම 1989 දෙවන ජනපතිවරණයේදී මුළු ඡන්ද 51,86,000 කින් 25,69,000 ක්ද සියයට 50.43 ක් ලබා ආර්. ප්‍රේමදාස මැතිතුමා ජයග්‍රහණය කළේය. මේ අනුව සලකා බැලීමේදී 1994 ජනපතිවරණයෙන් චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය ලත් සුවිශේෂ ජනවරම ලංකා දේශපාලන ඉතිහාසයේ නොව ලෝක දේශපාලන ඉතිහාසයේ ලියවුණු අසිරිමත් ජනවරමකි.

මේ අනුව බලන කල පහත සඳහන් අයුරු 1994 ජනපතිවරණයෙන් අපේක්ෂකයන් ලැබූ ඡන්ද ප්‍රමාණය පහත දක්වා ඇත.

| | | ලැබූ ඡන්ද ප්‍රතිශතය |
|---|---|---|
| 1. චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය (පොදු ජන එක්සත් පෙරමුණ) | 47,09,205 | - 62.28 |
| 2. වජිරා ශ්‍රීමතී දිසානායක මැතිනිය (එක්සත් ජාතික පක්ෂය) | 27,15,283 | - 35.91 |
| 3. හඩ්සන් සමරසිංහ මහතා (ස්වාධීන අංක 2) | 58,886 | - 0.78 |
| 4. හරිස්චන්ද්‍ර විජයතුංග (සිංහල භූමි පුත්‍ර පක්ෂය) | 32,651 | - 0.43 |
| 5. ඒ. ජේ. රණසිංහ (ස්වාධීන අංක 1) | 22,752 | - 0.30 |
| 6. නිහාල් ගලප්පත්ති (ශ්‍රී ලංකා ප්‍රගතිශීලී පෙරමුණ) | 22,749 | - 0.30 |
| ඡන්දය පාවිච්චි කළ මුළු ඡන්ද සංඛ්‍යාව | 75,61,526 | - 98.03 |
| අවලංගු ඡන්ද සංඛ්‍යාව | 1,51,706 | - 1.97 |
| පාවිච්චි කළ වලංගු ඡන්ද ප්‍රමාණය | 77,13,232 | - 70.52 |
| ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාව | 1,09,37,279 | |

ජනවාර්ගික ප්‍රශ්නය නිමා කොට සාමය උදා කර පක්ෂ, ජාති භේදයෙන් තොරව නිදහසේ නිවහල්ව ජීවත් වීමට හැකි පරිසරයක් උදා කරන්නට උතුරත්, දකුණත්, බටහිරත්, නැගෙනහිරත්, අත්වැල් බැඳ එක යදමක පුරුක් ලෙයින් සවිමත්ව දීර්ඝවූත්, දුෂ්කර වූත් යුග මෙහෙවරේ නියැලෙන්නට අවංකව, එඩිතරව යන මග සුදු වැලි ඇතිරුණු මලින් පිරි අතු පතරින් සුසැදි මාවතේ මෙන් සිසිලෙන්, සකල ලංකාවාසී ජනතාවගේ හදවත් ගැබතුර පවතින අපේක්ෂා මල්ඵල ගැන්වේවායි! සාමය අගයන සමස්ථ ලංකාවාසී ජනතාවගේ ප්‍රාර්ථනය වූහ.

# ශ්‍රී ලංකාවේ සිව්වන ජනාධිපති පදවි ප්‍රාප්තවීමට වරම් ලද දිරිය දියණිය

සමනල ගිරි සිරස මතින් ලා හිරු රැස් සුපුරුදු නියායෙන් ලක් දෙරණ සිසාරා පැතිරුණු තවත් දිනයක පිටුවක් පෙරළුණි. ලක් ජනතාවගේ අසීමිත බලාපොරොත්තු මල්ඵල ගැන් වූ එක් සොඳුරු දිනයක මූලාරම්භයක් විය. දාහත් වසරක ඒකාකාරී පාලන රටාවකට සමු දෙන්නටත් නව යුගයක් උදා කරලන්නටත් ඔවුන් තැබූ දහසක් බලාපොරොත්තු ඒ අතර වූහ. ඒ අසිරිබර දිනය 1994 වර්ෂයේ නොවැම්බර් 09 දිනය. එය ශ්‍රී ලංකාවේ තුන්වන ජනාධිපතිවරණය පැවැත් වූ දේශපාලන ඉතිහාසයේ නව පරිච්ඡේදයකට තුඩු දුන් ඓතිහාසික දිනයකි. එදින පෙරවරු 7.00 සිට ඡන්දය දැමීමේ කටයුතු දිස්ත්‍රික් විසි දෙකක ඡන්ද පොළවල් තුළින් ආරම්භ කෙරිණ. ක්‍රමක්‍රමයෙන් පස්වරු කාලයට මුල පුරන්ම ඡන්ද පොළවල් කරා විශාල පිරිස් ඇදෙන්නට වූහ. දිවයිනේ සෑම ප්‍රදේශයකම පැවතුනේ දැඩි සාමකාමී පසුබිමකි. ඡන්දය දැමීමේ කටයුතු හමාර වීමෙන් පසුදින අළුයම කරා එළඹෙත්ම කුමාරතුංග මැතිනිය විශිෂ්ඨ ජයක් ලබන බව තහවුරු වී තිබුණි.

ප්‍රතිඵල නිකුත් වී අවසන් වන්නටත් පෙර අරලිය ගහ මන්දිරය පොදු ජන එක්සත් පෙරමුණේ මැති ඇමතිවරුන්ගෙන් හා සිය ආධාරකරුවන්ගෙන් පිරී ඉතිරී ගියහ. අරලිය ගහ මැඳුරේ දුරකථනය නාද වෙමින් කුමාරතුංග මැතිනියට සුභ පැතුම් නොකඩවා ගලා එන්නට විය.

1994 නොවැ. 10 වන බ්‍රහස්පතින්දා පෙ.ව. 11.30 ට මැතිවරණ කොමසාරිස් කාර්යාලයේ පැවතුන රැස්වීමේදී චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය ජනාධිපතිවරණයෙන් ජය ලබා ශ්‍රී ලංකාවේ විධායක බලැති සිව්වන ජනාධිපතිනිය වූ බව නිල වශයෙන් ප්‍රකාශ කිරීමේ අවස්ථාවට එතුමිය සමග රජයේ මැති ඇමතිවරුන්, රැසක්ම සහභාගි වූහ. මැතිවරණ කොමසාරිස් චන්ද්‍රානන්ද ද සිල්වා මහතා නිල වශයෙන් ජනාධිපතිවරණයේ ප්‍රතිඵල නිකුත් කරමින් ජනාධිපති පදවිප්‍රාප්ත වීමට වරම් ලැබූ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියට ජාතිය අමතන

ලෙස කරන ලද ආරාධනයෙන් එතුමිය ජාතිය අමතා සිය දේශනය පැවැත්වූවාය.

මැතිවරණ කාර්යාලයෙන් සිය මැති ඇමතිවරුන් හා ආධාරකරුවන්ද සමඟින් පිටව ගිය කුමාරතුංග මැතිනිය ප්‍රථමයෙන් රොස්මීඩ් පෙදෙසේ සිය මෑණියන්ගේ නිවස වෙත ගොස් පළමුව මෑණියන්ට වැඳ වැටී නමස්කාර කර ආශිර්වාද ලබා ගත්තාය. සිරිමා බණ්ඩාරනායක මැතිනිය තම දියණිය ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරිය වීමෙන් දැඩි ලෙස උද්දාමයෙන් හා සෙනෙහසින් යුතුව ඇය සිප වැළඳ ගත්තාය. හෙළ සිරිතට අනුව කිරිබත් සංග්‍රහයක්ද කරමින් තම දියණියට සිරිමා බණ්ඩාරනායක මැතිනිය හා පවුලේ ඥාතීන් විසින් සුභ පැතූහ. ඉන් අනතුරුව අරලිය ගහ මැදුර වෙත පැමිණි කුමාරතුංග මැතිනියට දුරකථනය මඟින් ජනාධිපති ඩී. බී. විජේතුංග මහතා විසින් සුභ පැතූ අතර නමා ඉතා ඉක්මනින් පදවියෙන් ඉවත් වන බවත් දිවුරුම් දීමේ කටයුතු නොපමාව සිදු කිරීමට කටයුතු සලසන ලෙසත් ඉල්ලා සිටියේය.

ඒ අනුව 1994 ක් වූ නොවැම්බර් මස 12 වන සෙනසුරාදා යෙදුණු සුභ මොහොතින් ශ්‍රී ලංකා දේශපාලන ඉතිහාසයේ ප්‍රථම වරට ජාතික නායිකාවක ලෙස ශ්‍රී ලංකාවේ පොදු මහජනතාව විසින් තෝරා පත් කර ගනු ලැබූ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග නව ජනාධිපතිනිය සමස්ථ ජාතියේම වගකීම භාර ගනිමින් හමුදා ප්‍රධානීන්ද පිරිවරා ගෙන ජී. පී. එස්. ද සිල්වා අග විනිසුරුතුමන් ඉදිරියේදී දිවුරුම් දුන්නාය.

අති විශිෂ්ඨ ජන වරමක් ලබා ඇය ජයග්‍රාහී හිණිමගේ මුදුන්පෙත්තටම පැමිණ සිටියද එතැනට ආ ගමන ලෙහෙසි පහසු කටයුත්තක් නොවීය. දේශපාලන ඉතිහාසයේ නොයෙක් හැල හැප්පීම් ඝට්ටනවලට ලක් වෙමින් සියලු බාධක මැඩ ජය ගනිමින් කැපවීම හා අධිෂ්ඨානය යන වදන්වලට නව අරුතක් එක් කළ නව ජනපතිනිය ජාතිය අමතමින් "සිංහල ජාතියේ අයිතිවාසිකම් ආරක්ෂා කර ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවයට නිසි සැලකිල්ල දක්වමින් සෑම ජන කොටසකගේම ආත්ම ගෞරවය හා සමාන ලෙස සලකනු ලැබීමේ, පිළිගැනීමේ අවශ්‍යතාවය අනුව සකස් වන්නක් බවට වග බලා ගන්නවායි" දිවුරුම් දීමෙන් අනතුරුව

ජනපතිනිය ප්‍රතිඥා දුන්නාය. ජනපතිනිය ලෙස පදවිප්‍රාප්ත වීමෙන් අනතුරුව ජනාධිපති ලේකම් කාර්යාලයේ සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත් වූ මංගල සභාවේදී තව දුරටත් කරුණු පැහැදිලි කළ ජනපතිනිය යුද්ධයෙන් රටේ උතුරු කොටසේ ජීවිත හා සම්පත් මහා පරිමාණයෙන් විනාශ වී ඇති බවත් ජනතාව ලබා දුන් මේ සා විශාල ජන වරමින් පෙනෙන්නේ අංශු මාත්‍රයකුදු සැකයකින් තොරව සාමය සඳහා ඔවුන්ගේ ශ්‍රේෂ්ඨ අභිලාෂය යයිද කෙසේ වුවද සාමය යනු ගැටුමට සම්බන්ධ පාර්ශව දෙකටම ගෞරවාන්විතව ලබා දිය යුතු දෙයක් බවද දුෂ්කර වුවත් තමාත් තමාගේ ආණ්ඩුවත් සාමය සොයා දිගටම ගමන් ගන්නා බවද පැවසුවාය. මේ ජයග්‍රහණය මට පමණක් අයිතිවූවක් නොවේ යයිද ශ්‍රී ලංකා සමාජයේ සෑම කොටසක්ම මෑත අතීතයේදී අපේ රට වසාගෙන පැවතුන මුළු අඳුරු යුගය පුරාම දැරූ අප්‍රතිහත ධෛර්යයෙන් නොසැලෙන අධිෂ්ඨානයෙන් මහගු ප්‍රතිඵලයකැයිද පැවසුවාය.

මගේ හදවතේ අධිෂ්ඨානයේ යම්කිසි ශක්තියක් ඇත්නම් එය ජනතාවට සේවය කිරීම සඳහා මුළුමනින්ම කැපවූවක් බව ජනතාව හොඳින් දන්නේ යයිද ජනතාවගේ සැබෑ අපේක්ෂා සහ මියුරු සිහින සැබෑවක් කර ගැනීම සඳහා අප සැවොම එකට පියවර තැබිය යුතුව ඇතැයිද එතුමිය ප්‍රකාශ කළාය.

**ජාතිය අමතා ජනපතිනිය කරන ලද සම්පූර්ණ කථාව මෙසේය.**

ශ්‍රී ලංකාවේ හතරවන ජනාධිපතිනිය ලෙස මා එම ධූරයේ කටයුතු භාරගත්තේ අප රටේ ඉතිහාසයේ ඉතා වැදගත් සන්ධිස්ථානයකදීයි. අප රටේ ජනතාව සාමය සහ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙනුත්, අවංක හා කාර්යක්ෂම පාලන තන්ත්‍රයක් ගොඩනැගීම සඳහාත් හෙංචයියන් සහ හිතවතුන් අතලොස්සකට පමණක් සීමාවී තිබුණු වරප්‍රසාද සෑම දෙනාටම එකසේ ලැබෙන ආර්ථික ප්‍රතිපත්තියක් වෙනුවෙනුත්, තමන් තුළ ඇති සාමූහික අභිලාෂය ඉතා බලසම්පන්නව පසුගිය මැතිවරණයේදී ප්‍රකාශ කර තිබෙනවා.

මා පළමුවෙන්ම හිස නමා ආචාර කරන්නට කැමතියි, අප රටේ පොදු මහත් ජනතාවට. ඔවුන් දීර්ඝ කාලයක් තිස්සේ මේ රට වෙළා ගෙන පැවතුන තර්ජනයත්, මර්දනයත්, ඉදිරියේදී අභිනව තියුණු දේශපාලන බුද්ධියක් ඇතිව අති විශාල කැපවීමක් ඇතිව

අප රට නැවත වතාවක් උතුම් මිනිසුනට ජීවත් වෙන්නට පුළුවන් රටක්, ආණ්ඩුවක්, සමාජයක් බිහි කරන්නට කටයුතු කිරීම ගැන.

ඒ වගේම මේ අවස්ථාවේදී මම මගේ පියාණන්ටත් මෑණියන්ටත් මගේ හිස නමා ගෞරවය, භක්තිය සහ ස්තුතිය පුද කරන්නට කැමති වෙනවා. මට ජනතා සේවයේදී අවංකවම, කැපවීම, මිල මුදල් සහ අනෙකුත් සියලුම බලතලවලට වැඩිය වටිනා බව පෙන්නා දීම සහ ඉගැන්වීම ගැන. ඒ වගේම අපගේ දේශපාලන සටනේදී දිගින් දිගටම මට ශක්තිය ධෛර්යය ලබා දුන් අවංකකමේ අගය පෙන්නා දුන් මාගේ ස්වාමිපුරුෂයාටද මේ අවස්ථාවේදී හිස නමා ගෞරව කරන්නට මා කැමති වෙනවා.

අපේ ජනතාව මාත් මාගේ ආණ්ඩුවත් කෙරෙහි දක්වා ඇති මේ අති මහත් විශ්වාසය නිසා මා තුළ ඇති වූ, තියුණු සංවේදී හැඟීම් මෙන්ම ජනතාව පිළිබඳව මා තුළ ඇති වූ ගෞරවය නිසි ලෙස ප්‍රකාශ කිරීමට වචන මා වෙත නැති තරම්. ජනතාව අපට දී ඇති මෙතරම් විශාල වරමක් ප්‍රජාතන්ත්‍රවාදී ලෝකයේ මැතිවරණ ඉතිහාසය තුළ තවත් නැති තරම්. එහි වැදගත්කම වඩාත් හොඳින් පෙනෙන්නේ ශ්‍රී ලංකාවේ සෑම විවිධ ජන කොටසක්ම එකම නොසැලෙන හඬක් නගා ඇති බව සැලකිල්ලට ගත් විටයි.

මේ ජයග්‍රහණයේ අසමසම පරිමාව එය හුදෙක් තනි පුද්ගලයෙකුගේ හෝ දේශපාලන පක්ෂයක හෝ ජයග්‍රහණයක් ලෙස පමණක් සැලකීමෙන් නිසි ලෙස තේරුම් ගත නොහැකිය. මගේ හදවතේ සහ අධිෂ්ඨානයේ යම් කිසි ශක්තියක් ඇත්නම් එය ජනතාවට සේවය කිරීම සඳහා මුළුමනින්ම කැපවූවක් බව අප ජනතාව හොඳින් දන්නවා. මගේ මුළු ජීවිතයම මා කැප කොට තිබෙන්නේ රටේ සුභ සිද්ධිය හා යහපත වෙනුවෙනුයි. මේ අධිෂ්ඨානය හා කැපවීම ශක්තිමත් ලෙස අළුත් කිරීමට අද ඉතා සුදුසු දවසක්.

කෙසේ වුවත් මේ ජයග්‍රහණය මට පමණක් අයිති වූවක් නොවේ. එය ශ්‍රී ලංකාවේ සමාජයේ සෑම කොටසක්ම මෑත අතීතයේදී අපේ රට වසා ගෙන පැවතුණු මුළු අඳුරු යුගය පුරාම දැරූ අප්‍රතිහත ධෛර්යයේත් නොසැලෙන අධිෂ්ඨානයේත් මහනු ප්‍රතිඵලයයි.

මෙම ජයග්‍රහණයේ පරිමාවෙන් පෙන්නුම් කෙරෙන්නේ රටක ජනතාවක් තිසි අධිෂ්ඨානයෙන් සහ උද්යෝගයෙන් යුක්ත වූ විට ඕනෑම බාධකයක් මැඩ ගෙන ඉදිරියට යාමටත් තමන් සහ අනාගත පරපුර වෙනුවෙන් ඉතාම දුෂ්ට, ප්‍රජා පීඩක පාලන තන්ත්‍රයකින් පවා විමුක්තිය අත්පත් කර ගැනීමට සමත් වන බවයි. මේ අවස්ථාවේදී මා මගේ උණුසුම් භක්ති ප්‍රණාමය පුද කරන්නේ අපේ රටේ මෑත කාලීන ඉතිහාසයේ ඉතාම අඳුරු කාල පරිච්ඡේදයකදී පවා ඉමහත් දුෂ්කරතා මැද මේ අරගලයට දායක වී එය අඛණ්ඩව ඉදිරියට ගෙන ගිය අප රටේ බහුතර ජනතාවටයි. මගේ පියා වූ දිවංගත එස්. ඩබ්. ආර්.ඩී බණ්ඩාරනායක අගමැතිතුමාගේම වචනවලින් කියනවා නම් "අපේ ජනතාවගේ යටපත් කළ නොහෙන, පාගා දැමිය නොහෙන ජීව ගුණයට" පසුගිය දාහත් වසරක් පුරා පැවති මර්දනකාරී ප්‍රජා පීඩක ආණ්ඩුවට අභියෝග කිරීමටත් අවසානයේදී එය පරාජය කිරීමටත් අවශ්‍ය තරම් වූ ශක්තිය තිබුණු බව දැන් ප්‍රත්‍යක්ෂ වී හමාරයි.

අපේ රටේ දැනට පවතින තත්වය ගැන තිසි තක්සේරුවක් කර මහජනතාවගේ හැඟීම් සහ අපේක්ෂා මේ තරම් ප්‍රබලව මතුවී ප්‍රකාශයට පත් වූයේ මන්ද කියා සිතා බැලීමට මෙය සුදුසු අවස්ථාවක්.

මටත් පොදුජන එක්සත් පෙරමුණටත් මේ තරම් විශාල ජයග්‍රහණයක් ලබා දීමට තමන් තුළ පැවති අධිෂ්ඨානය ප්‍රකාශයට පත් කිරීමෙන් පෙන්නුම් කර ඇත්තේ වෙනසක් සඳහා ඔවුන් තුළ ඇති අති ප්‍රබල අභිලාෂයයි. ඔවුන් සිය ඡන්දය මගින් ප්‍රකාශ කර ඇති කැමැත්ත හරයාත්මකව මෙන්ම සියල්ලටම පෙර වෙනසක් සඳහා වූ කැමැත්තක් ශ්‍රී ලංකාවේ ඡන්දදායකයන් අපේක්ෂා කරන්නේ තීරණාත්මක මෙන්ම කල් පවත්නා අංග සම්පූර්ණ වෙනසක්.

හිංසනය සහ භීෂණය, සම්පූර්ණයෙනුත් සෑම ආකාරයෙනුත් ප්‍රතික්ෂේප කිරීමයි. තමන්ගේ ආදරණීයයන් අමු අමුවේ මරා දමනු ලැබීමේත්, අතුරුදහන් කරනු ලැබීමේත් වේදනාව අපේ ජනතාව මෙතෙක් නිහඩව දරා ගෙන සිටියා. දශක දෙකකට ආසන්න මේ අඳුරු යුගය තුළදී මිනිස් ජීවිතය රටේ ඉතාම නොවටිනා දෙයක් බවට පත් කර තිබූ රාජ්‍ය භීෂණය රජ කරමින් විනාශයේ මාවත

දිගේ නොනැවතී ගමන් කළා. දේශපාලන බලය යනු තමන්ගේ පටු සහ ආත්මාර්ථකාමී අරමුණු ඉටු කර ගැනීමේ උපකරණයට වඩා වැඩි යමක් නොවේ යයි සැලකූ හදවතක් නැති ආණ්ඩුවක් කළේ ශිෂ්ටත්වයේ යුක්තියේ සහ සාධාරණත්වයේ සියලුම පිළිගත් මූලධර්මයන් හිතුමතේ සහ දඬුවම් ලැබීමේ බියකින් තොරව උල්ලංඝනය කර ආත්ම රැකවරණය සහ තෘප්තිය පතා කිසිදු ගුණ ධර්මයක් හෝ සදාචාරාත්මක වටිනාකමක් නොතකමින් අඳුරේ අත පත ගාන සමාජයක් ඉතිරි කර යාමයි.

ශ්‍රී ලංකාවේ ජනතාව ඉතා පැහැදිලිව සහ මහ හඬින් අසන්නට කැමති අයට අසා සිටින්නම කෑ ගසා කියා ඇති දෙය මෙයයි. ශක්තිය පමණක් යුක්තිය වූ යුගය, සෑම දෙයක්ම බලයට හා මිලයට ගත හැකි වූ යුගය, සංවිධාන ගත වූ සෑම ආකාරයකම හිංසනය රජය විසින් මුවහත් කර තියුණු කළ යුගය, දැන් අවසානයි. ජනතාව දැන් තීන්දුව දී තිබෙන්නේ නීතියේ ආධිපත්‍යය වෙනුවෙන්, ප්‍රජාතන්ත්‍රවාදී පරමාදර්ශයන් හා හරයන් ආරක්ෂා කිරීම වෙනුවෙන් ආණ්ඩු කිරීමේ කාර්යයේදී ශිෂ්ටකම, සදාචාරය සහ හෘදය සාක්ෂිය ප්‍රතිෂ්ඨාපනය කිරීම වෙනුවෙන්, එය උත්තර කීම සහතික කළ යුතු බව ඔවුන් ඉල්ලා සිටිනවා. දේශපාලන බලය යනු භූදෙක් විශ්වාසය මත පැවරෙන හා ක්‍රියාකාරිත්වයකට වඩා වැඩි යමක් නොවන බවත්, එය සදාචාරාත්මක වගයෙන් සාධාරණීයකරණය කළ හැක්කේ ජනතාවගේ ශුභ සිද්ධිය සහ යහපත වෙනුවෙන් පාවිච්චි කරන තාක් දුරට පමණක් බවත්, ඔවුන් ඉතා තදින්ම අවධාරණය කර තිබෙනවා. දේශපාලඥයන් හිතුමතේ සහ හිතුවක්කාර ලෙසත් කිසිදු නීතියක් නොතකාන් සිටි යුගය ජනතාව දැන් අවසන් කරලා. දේශපාලන ප්‍රචණ්ඩත්වය සහ රජයේ භීෂණය මුලිනුපුටා දැමීමටත්, අප රටේ දේශපාලනයට අවංකකම සහ ගරුත්වය යළි ගෙන ඒමටත්, මගේ ආණ්ඩුව ගත් පියවරට මුළු රටේම අනුමැතිය ලැබී තිබෙන්නේ ඉතාමත් පැහැදිලි ලෙසයි.

අධික ජීවන වියදම් බර සහ අවශ්‍ය තරම් රැකියා නැතිකම සහ අපේ ආර්ථිකය වෙළාගෙන තිබෙන අනික් ප්‍රශ්න නිසා ජනතාවට ඇතිවී තිබෙන ආර්ථික දුෂ්කරතා සැහැල්ලු කිරීමට ක්ෂණික පියවර ගැනීම අත්‍යාවශ්‍යයි. අපේ රට මෙතෙක් හැඩගැසී

තිබුණේ විවෘත ආර්ථිකයේ නාමයෙන් රටේ වැඩිදෙනා දුගීකමෙන් සහ දරිද්‍රතාවයෙන් පෙළෙද්දී, බලයේ සිටින්නන්ගේ හිතවතුන් අතළොස්සකට පමණක් අසාධාරණ වාසි ප්‍රයෝජන ලබා ගැනීමට ඉඩප්‍රස්ථා දීමේ ආර්ථික ක්‍රමයකටයි. සෞඛ්‍ය හා අධ්‍යාපනය වැනි අත්‍යවශ්‍ය මහජන සේවා ඒ ක්‍රමය තුළ මුළුමනින්ම අමතක කෙරුණා. අපේ ආණ්ඩුවේ ප්‍රමුඛත්වය ලබා දී ඇති කාර්යයක් වන්නේ, අපේ ආර්ථිකය සැබෑ ලෙසම නිදහස් සහ තරගකාරී එකක් බවට පරිවර්තනය කරමින්, සෑම ගනුදෙනුවකදීම අවංකකම සහ විවෘතභාවය සහතික කිරීමයි. පැහැදිලි සහ නිරවුල් සංවර්ධන ඉදිරි දර්ශනයක් ඇති විට ජාතික නිෂ්පාදනය පුළුල් කර වේගවත් කළ හැකි වෙනවා ඇති. එමෙන්ම එමගින් අපේ තරුණ පරපුරට නව රැකියා සහ ආර්ථික අවකාශ බිහි කළ හැකි වෙනවා ඇත. ඒ සමගම අපි විදේශ ආයෝජන දිරි ගැන්වීමට ක්‍රියා කරන්නෙමු. ඒ සමගම සාධාරණය සහ කාර්යක්ෂම ආදායම් බෙදී යාමේ ක්‍රම සහ රැකියා අවකාශ වැඩි කිරීම මගින් සංවර්ධනයේ ප්‍රතිලාභ අපේ ජනතාවගේ ඉතා දුගී අය අතටත් පත්වන බවට අපි වගබලා ගන්නෙමු.

තමන් වාර්ගික සහ ආගමික අන්තවාදයේත්, වෛරයේත්, අඳුරු බියකරු සහ කුරිරු ආකල්පවල මහ ප්‍රපාතයට ඇද දැමීමට සමහර අය ගත් ප්‍රයත්නයන් ඉදිරියේ අපේ ජනතාව ක්‍රියා කර ඇත්තේ අතිශයින්ම ප්‍රවේශමෙන්, බුද්ධිමත්ව සහ තීක්ෂණ දේශපාලන අවබෝධයකින් යුතුවයි. සාමය සහ මිනිස්කම අගයන හර පද්ධතියක් සඳහා අප ජනතාව සිය අභිලාෂය, එක හෙළාම පළ කර තිබෙනවා. මුළු ලෝකයටම ඔවුන් ඉතා පැහැදිලිවම ඔප්පු කර තිබෙන්නේ වෛර උණ්ඩය, කතිරයෙන් පරාජය කළ හැකි බවයි. ප්‍රජාතන්ත්‍රවාදය කෙරෙහි අප ජනතාව සතු කැපවීම අප හැමදෙනාම මහහු ලෙස උනන්දු කරවන්නක්. හිංසනය අත හැර දමා, නිදහසේ ප්‍රජාතන්ත්‍රවාදයේ ශිෂ්ටත්වයේ සහ සැමටම සෞභාග්‍යය අත් කර දීමේ ධජය එසවීමට අප සමග එන්නැයි, අප කළ කැඳවීමට තරුණ පෙළ දක්වා තිබෙන්නේ ඉතා උණුසුම් ප්‍රතිචාරයක්. අපේ ප්‍රතිඥාවන් ඉටු කිරීමට අප සතු ශක්තිය පිළිබඳව තරුණ පරපුර දක්වා ඇති විශ්වාසයට, මා හිස නමා ආචාර කරනවා.

අපේ රටේ උතුරු කොටසේ යුද්ධය විසින් දායාද කොට ඇත්තේ ජීවිත සහ සම්පත් මහා පරිමාණ වශයෙන් විනාශ වීමේ ඉරණමයි. ජනතාව අපට දී ඇති වරමින්, අංශු මාත්‍රයකවත් සැකයකින් තොරව පෙනෙන්නේ සාමය සඳහා ඔවුන් සතු ශ්‍රේෂ්ඨ අභිලාෂය කෙතරම් ගැඹුරු සහ පුළුල් එකක්ද යන්නයි. කෙසේ වුවත්, සාමය යනු ගැටුමට සම්බන්ධ පාර්ශවයන් දෙකටම ගෞරව සම්පන්නව ලබා ගත යුතු දෙයක්. එමෙන්ම එය ශක්තිමත් සහ කල් පවත්නා සාමයක් විය යුතුයි. සාමය සඳහා ඇති මාවත දුෂ්කර සහ කටු කොහොල්වලින් ගහන එකක් බව පිළිගනිමින් මාත්, මගේ ආණ්ඩුවත් සාමය සොයා අප යන ගමනේ දිගටම යෙදෙනවා ඇති. සාමය සඳහා වූ අපේ ප්‍රවේශය, සිංහල ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කර ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවයට තිසි සැලකිල්ල දක්වමින්, සෑම ජනවාර්ගික කොටසකගේම ආත්ම ගෞරවය සහ සමාන ලෙස සලකනු ලැබීම, පිළිගැනීමේ අවශ්‍යතාව අනුව සකස් වූ එකක් බවට අප වශබලා ගන්නවා.

අපේ ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී ජීවන රටාවට, විධායක ජනාධිපති ආණ්ඩු ක්‍රමයෙන් සිදු වී ඇති සුව කළ නොහැකි හානිය මනා ලෙස තේරුම් ගෙන ඇති අප, ගෞරව බහුමානයෙන් යුතුව ඔබට දෙන ප්‍රතිඥාව නම්, මේ පිළිකාව අපේ රටේ ආණ්ඩුක්‍රමයෙන් සපුරා ඉවත් කරන බවයි.

මේ අරමුණ සාක්ෂාත් කර ගැනීම පිණිස මා සහ මගේ නායකත්වයෙන් ඇති ආණ්ඩුව කැප වන බවට ඔබට ප්‍රතිඥා දෙමින්, ඔබ අපට දී ඇති සහයෝගය ඉදිරියටත් එලෙසම ලබා දෙන ලෙස මා ඔබෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා. අපේ ඉදිරි මග ආලෝකවත් කරන පහන් වැඹ වන්නේ ඔබ අප වෙත තබා ඇති බලාපොරොත්තුව සහ විශ්වාසයයි. අපට ඉදිරියට පිය නගන්නට අවශ්‍ය ධෛර්යය සහ කැපවීම ලැබෙන්නේ ඔබ අපට දෙන සහයෝගය සහ මග පෙන්වීමෙනුයි.

**බලාපොරොත්තුවේ**
**ගිරිකුළ මුදුනට**
**අපි එකට පිය නගමු.**
**ඒ දුෂ්කර**
**එහෙත් මියුරු සිහිනය**
**සැබෑවක්ම කර ගනිමු**

යයි ශ්‍රී ලංකාවේ සිව්වැනි ජනාධිපතිනිය ලෙස පදවිප්‍රාප්ත වීමෙන් අනතුරුව ජාතිය අමතා කරන ලද මංගල දේශනයේදී චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය ප්‍රකාශ කළාය.

සිය පදවියේ වැඩ භාරගැනීමෙන් පසු හිස් වූ අග්‍රාමාත්‍ය පදවිය සඳහා පොදු පෙරමුණේ ජ්‍යෙෂ්ඨ මංත්‍රීවරුන් කීප දෙනෙකුගේ නම් ඉදිරිපත්ව තිබුණි. ධර්මසිරි සේනානායක, රත්නසිරි වික්‍රමනායක, සී. වී. ගුණරත්න, කර්නල් · අනුරුද්ධ රත්වත්තේ යන අමාත්‍යවරුන්ගේ නම්ද ඒ අතර විය. ඇතැම් මංත්‍රීවරුන් හා පාක්ෂිකයන් ඔවුන්ගෙන් අයෙකුට අගමැති ධූරය ලබාදීම සඳහා මහත් උත්සාහයක නිරත වූ බව කැපී පෙනුණි. එවක තැපැල් හා විදුලි සංදේශ අමාත්‍ය මංගල සමරවීර මහතා, යෞවන කටයුතු හා ක්‍රීඩා අමාත්‍ය එස්. බී. දිසානායක මහතා ඇතුළු පක්ෂයේ ඇතැම් කොටස් මෙයට ප්‍රතිවිරුද්ධ අදහස් දරමින් අගමැති ධූරයට පත්කල යුත්තේ සිරිමා බණ්ඩාරනායක මැතිනිය බව කියා සිටියහ. මංගල සමරවීර අමාත්‍යතුමා මෙහි මූලිකත්වය ගෙන කටයුතු කළ අතර පාක්ෂිකයන් හා මංත්‍රීවරුන් වැඩි දෙනෙක් එම අදහසට කැමැත්ත දැක්වීම නිසා සිරිමා බණ්ඩාරනායක මැතිනිය ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍ය ධූරයට පත් කිරීමේ අදහස සඵල විය. ඒ අනුව 1994 ක් වූ නොවැම්බර් මස 13 වන ඉරිදා පෙරවරුයේ යෙදුනු සුභ මොහොතින් සිරිමා ආර්. ඩී. බණ්ඩාරනායක මැතිනිය දිවුරුම් දී ශ්‍රී ලංකාවේ ආග්‍රාමාත්‍ය පදවිප්‍රාප්ත වූවාය.

මවක් සහ දියණියක් එකමවර එකම රටක අගමැතිනිය හා විධායක බලැති ජනපතිනියක් වීමට ලත් භාග්‍යය ලෝක වාර්තාවක් තබන්නටද සමත් වූහ. බණ්ඩාරනායක මැතිනිය සිය දියණිය ඉදිරියේ දිවිරුම් දීමද තවත් දුර්ලභ ගනයේ සුවිශේෂ සිද්ධියකි. ලෝක දේශපාලනයේ මෙය වඩාත් තීව්‍ර ලෙස කැපී පෙනුන දුර්ලභ අවස්ථාවකි.

# යාපා පටුනට සාමය උදා කරන්නට නායකත්වය දුන් - 'සෙන්පතිනිය'

දස දහස් ගනන් ජීවිත අහිමි කරමින් තවත් දස දහස් ගනනක ජීවිත සදාකාලික ආබාධිතයන් හා අනාථයන් බවට පත් කරමින් කෝටි ගණනක රජයේ හා මහජන දේපල විනාශ මුඛයට ඇද දමමින් ඊලාම් රාජ්‍යයක කිරුළු පළඳින්නට කැස කවමින් සිටි ම්ලේච්ඡ ත්‍රස්තවාදීන් අහිංසක ජනතාවට දරුණු වධ හිංසා පමුණුවමින් මුළු රටම භීතියෙන් හොල්ලා සාම ක්‍රියාදාමයන් කෙරෙහි අංශු මාත්‍රයක් හෝ තැකීමකින් තොරව වසර 12 කටත් අධික කාලයක් උතුරු නැගෙනහිර සිය ආධිපත්‍ය යටතට ගෙන ඒ සඳහා කේන්ද්‍රස්ථානය කොටගත් යාපනය නගරය 1995 දෙසැම්බර් මස 05 වන දින පෙරවරුයේ 'රිවිරැස' නම් ඓතිහාසික හමුදා මෙහෙයුමෙන් ශ්‍රී ලංකා යුධ හමුදාව යටතට අත්පත් කර ගන්නා ලදී.

ලෝක ප්‍රකට ඉන්දීය සාම සාධක හමුදාවටත් අපහසු වූ අභියෝගය පිළිගනිමින් ශ්‍රී ලංකා යුධ හමුදාව අත්පත් කරගත් ජයග්‍රහණය ලංකා ඉතිහාසයේ අමරණීය සිහිවටනයකි.

ජාතිවාදී, ත්‍රස්තවාදී කල්ලියක් වූ දෙමළ කොටින්ට එරෙහිව ශ්‍රී ලංකා ත්‍රිවිධ හමුදාව හා පොලිස් ආරක්ෂක බලකාය ගෙන ගිය වීරෝධාර සටනේ අවසානය මෙය නොවුණත් එහි තීරණාත්මක සන්ධිස්ථානය මෙය බව ඉරහඳ මෙන් විශ්වාශය.

වසර ගණනාවක් තිස්සේ භීෂණයේ අඳුරු පටලයෙන් වැසී තිබුණ උතුරුකරයට සාමය උදාකිරීම සඳහා එඩිතර දේශපාලන නායකත්වයක් ලබා දුන් 'සෙන්පතිනිය' ලෙස ශ්‍රී ලංකා ජනාධිපතිනිය චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ නාමය ඉතිහාසයේ රනින් සටහන් වන අතර පොදු ජනතා හදවත් ගැඹුරද මේ කප පවතින තුරු රැව් පිළිරැව් දෙනු ඇත. මෙකී යුග මෙහෙවර ඉටුකරන්නට ජනපතිනිය ගේ නිවැරදි දේශපාලන මාවත ඔස්සේ තම උපරිම බලශක්තිය යොදා පෙරමුණ ගෙන යාපා පටුන ජයගත් දෙවන සපුමල් කුමරු නම් විරුදාවලිය ලත් ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍ය කර්නල් අනුරුද්ධ රත්වත්තේ මහනාද රටත් ජාතියත්

ගොඩ නගන්නට 'දිරිය දියණියක්' මෙලොවට දායාද කරමින් මෙකී හැම කටයුත්තකටම උපදේශකත්වයේ පහන් ටැඹක් බඳු වූ අග්‍රාමාත්‍ය සිරිමා බණ්ඩාරනායක මැතිනියටත් ජීවිත පූජා කරමින් දිවි පරදුවට තබා සේවය කළ හා කරන ත්‍රිවිධ හමුදා හා පොලිස් බල සේනා සෙන්පතියන් ඇතුළු රණ විරුවන්ටත් ජාතියේ අති උතුම් උත්තමාචාරය ජාති ආගම් කුල භේදයෙන් තොරව සාමයට ලැදි සමස්ථ ශ්‍රී ලංකා වාසීන්ම පුද කළහ. එය ශ්‍රී ලංකා ඉතිහාසයේ මෙන්ම ලෝක ජනතාවගේ දෑස් විවර කළ අමරණීය සිහිවටනයකි.

දින පහක් වැනි කෙටි කාලයක් තුළදී 'රිවිරැස' මෙහෙයුමේ නිරත වූ රණ විරුවන් විසින් මුළුමනින්ම යාපනය නගරය කොටි ත්‍රස්තවාදීන් ගේ ග්‍රහණයෙන් මුදා ගනු ලැබූ ඓතිහාසික අවස්ථාව සනිටුහන් කරමින් උතුරේ ආඥාපති මේජර් ජෙනරාල් රොහාන් දළුවත්තගේ ආරාධනයෙන් ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍ය කර්නල් අනුරුද්ධ රත්වත්තේ මහතා ශ්‍රී බුද්ධ වර්ෂ 2539 ක්වූ උඳුවප් මස පුර පසළොස්වක පොහෝ දින හෙවත් වර්ෂ 1995 ක්වූ දෙසැම්බර් මස 05 වන බදාදා පෙ.ව. 11.52 ට යෙදුන ශුභ මොහොතින් යාපනය නගරයේදී ජාතික කොඩිය එසවිය.

මෙකී අවස්ථාවේදී යුධ හමුදාපති ලුතිනන් ජනරාල් ජෙරී සිල්වා මහතා හමුදා ධජයත්, ගුවන් හමුදාපති එයාර් වයිස් මාර්ෂල් ඔලිවර් රණසිංහ මහතා ගුවන් හමුදා ධජයත්, නාවික හමුදාපති මොහාන් සමරසේකර මහතා නාවික හමුදා ධජයත්, පොලිස් පති ඩබ්ලිව් බී. රාජගුරු මහතා පොලිස් දෙපාර්තමේන්තුවේ ධජයත් ඔසවන ලදී. දෙමළ ජනතාව වෙනුවෙන් යාපන ප්‍රදේශයේ ධජය යාපනේ දිසාපති පී. ධර්මලිංගම් මහතා විසින් ඔසවන ලදී. මන්නාරමේ විශ්‍රාමලත් දිසාපති පී. රාජලිංගම් මහතා විසින් හින්දූ ආගමිකයන් සංකේතවත් කරන ගවයකුගේ රුව සහිත හින්දූ ධජය ඔසවන ලදී.

යාපනය රෝහල, කච්චේරිය ඇතුළු ගොඩනැගිලිද දකුණු දෙසින් ගුරුනගර් ප්‍රදේශයද උතුරු දෙසින් යාපනය බස් නැවතුම් පොල, සුභාෂ් හෝටලය හා ඉන් ඔබ්බට නාග විහාරයද හමුදාව අත් පත් කර ගත් යාපන නගර සීමාව තුළ පිහිටා තිබුණි. රටේ ඒකීයභාවය රකින්නට දිවි හිමියෙන් ජීවිත පරදුවට තබා සේවය කළ රණවිරුවන්ද සැමරූ නියෝජ්‍ය ආරක්ෂක අමාත්‍යවරයා සියලු

බාධක මැද දිවි පරදුවට තබා සටන් වදින රණවිරුවන්ට ගරු ජනාධිපතිනිය වෙනුවෙන් හා සාමය අගයන සමස්ථ ශ්‍රී ලංකාවාසී ජනතාව වෙනුවෙන් සිය ප්‍රණාමය පුද කළේය.

උත්සවය අවසානයේ සාමය සංකේතවත් කරමින් නියෝජ්‍ය ආරක්ෂක අමාත්‍යවරයා ප්‍රමුඛ ත්‍රිවිධ හමුදාපතිවරු හා පොලිස්පතිවරයා විසින් මුදා හරිනු ලැබූ පරවි රැනක් යාපනය. නගරයේ ගුවන් ගැබ සිසාරා ඔබ මොබ පියාසර කරද්දී යාපා පටුනේ ගුරු නගර් හා කොටුවට ඔබ්බෙන් වූ කලපුව දෙසින් හමා ආ මඳ සුළඟේ අපේ ජාතික ධජය හා සෙසු ධජද අභිමානවත් ලෙසින් සුළඟේ ලෙල දෙද්දී සිංහල හා ද්‍රවිඩ මුස්ලිම් යන සමස්ථ ශ්‍රී ලාංකික ජනතාව අතර සාමය සදාකාලිකව ස්ථාපිත කිරීමේ ආරම්භක ව්‍යායාමය හමාර විය.

එඩිතර රාජ්‍ය නායිකාවක ලෙසින් ජනාධිපතිනිය රටේ පාලන තන්ත්‍රය වෙනුවෙන් තීක්ෂණව හා කැපවීමකින් යුතුව නිරතුරුවම ලබා දෙන දේශපාලනමය නිවැරදි නායකත්වය මෙයින් පැහැදිලිවම පෙනුණි.

'රිවිරැස මෙහෙයුම' සාර්ථකව මෙහෙයවා යාපනය ජය ගත් බව සඳහන් නිල නිවේදනය බහාලූ මංජුසාව 1995 ක් වූ දෙසැම්බර් මස 6 වන දින ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍ය කර්නල් අනුරුද්ධ රත්වත්තේ මහතා නිල වශයෙන් ජනාධිපති ලේකම් කාර්යාලයේදී ජනාධිපතිනිය වෙත පිළිගැන්වූයේය. එම නිල නිවේදනය පහත දක්වා ඇත.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති ගරු ජනාධිපතිණි සහ සන්නද්ධ හමුදා සේනාධිනායක චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය වෙත ගෞරව බහුමාන පුරස්වරව සැල කර සිටින වග නම් .....

ශ්‍රී ලංකාද්වීපයේ ගෙවී ගිය දොළොස් වසරක කාලය තුළ උතුරු නැගෙනහිර දිසා භාගයේ පැවති භීෂණය හා යුද්ධය අවසන් කිරීමේ පරම චේතනාවෙන් සාම සංග්‍රාමය දියත් කොට ඒ තුළින් සාම විරෝධීන් පරදවා ඓතිහාසික යාපා පටුන දික් විජය කිරීම වස් මා වෙත සහ ත්‍රිවිධ හමුදාවටත් පොලිසියටත් ඔබතුමිය විසින් කරන ලද ආඥාව ප්‍රකාර අපේ වීරෝදාර සෙන්පතියන් ඇතුළු වීර සෙබළුන් විසින් එම ප්‍රදේශය එල්.ටී.ටී.ඊ සාම විරෝධීන්ගෙන් මහත්

පරිශ්‍රමයෙන් මුදවා ගෙන ජාතික ධජය සහ පළාත් ධජය ඔසවා ඔබතුමියගේ ආඥාව පිහිටු වූ බව මෙයින් ගෞරව පූර්වකව සැල කරන සිටින වගයි.

මෙයට,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වාරිමාර්ග විදුලිබල හා බලශක්ති අමාත්‍ය සහ ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍ය කර්නල් ලෙව්කෝ බණ්ඩාර අනුරුද්ධ රත්වත්ත.

ශ්‍රී බුද්ධ වර්ෂ 2539 ක් වූ උඳුවප් මස පුරපසළොස්වක් දින කොළඹදිය.

1995 දෙසැම්බර් මස 6 වන දින.

ශ්‍රී ලංකා ධරණීතලය තුළ බුදුදහම ස්ථාපිත කරන්නට මීට අවුරුදු දෙදහස් තුන්සිය වසරකට පෙරාතුව ජය ශ්‍රී මහා බෝධීන්වහන්සේගේ දක්ෂිණ ශාඛාව රැගෙන සංඝමිත්තා තෙරණිය සිරිලකට වැඩම කළ දිනය සිහි ගන්වන උඳුවප් පොහෝ දා එනම් වර්ෂ 1995 ක් වූ දෙසැම්බර් මස 6 වන දින මෙකී ඓතිහාසික දැනුම් දීමේ ලේඛනය සහිත මංජුසාව ජනාධිපතිනිය වෙත පිළිගැන්වීම විශේෂ සිද්ධියකි.

සුදු ඔසරියකින් සැරසී යාපා පටුන ජයගත් නිල නිවේදනය බහාලූ මංජුසාව පිළිගත් ජනාධිපතිනිය විජයග්‍රාහී සටන මෙහෙය වූ කර්නල් අනුරුද්ධ රත්වත්තේ අමාත්‍යතුමන්ගේ දැත තරයේ අල්ලා ගනිමින් සාමය අගයන මුළු මහත් සකල ශ්‍රී ලංකාවාසී ජනතාවගේ උණුසුම් සුභපැතුම් සමගින් ජාතියේ ප්‍රණාමය පුද කළාය. හමුදාපතිවරු හා පොලිස්පතිවරයා මේ අවස්ථාවට එක් වූහ.

'රිවිරැස විජයග්‍රහණය' ජනාධිපතිනියට දැනුම් දෙන්නට ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යවරයා සැරසෙද්දී රැස්ව සිටි කතානායක, ආණ්ඩුකාරවරු, ඇමතිවරු, මන්ත්‍රීවරු සහ සම්භාවනීය අමුත්තෝද සිය අසුන්වලින් නැගී සිට අත්පොළසන් දුන්නාහ.

උළෙල ඇරඹීමට පෙරාතුව ත්‍රිවිධ හමුදාවෙන් පිදෙන ජනාධිපති උත්තමාචාර සහ ආචාර වෙඩිමුරය ජනාධිපතිතුමිය විසින් විශේෂ පීඨිකාවක සිට පිළිගන්නා ලදී. මිනිත්තු දෙකක නිහැඬියාවකින් රටේ භෞමික අඛණ්ඩතාව වෙනුවෙන් දිවි පිදූ රණවිරුවන් සිහි කිරීමද සිදු විය.

ජාතික ගිය ගැයීමෙන් අනතුරුව ජනාධිපතිනිය ජාතිය ඇමතුවාය.

**ජනාධිපතිනිය ජාතිය අමතා කළ සම්පූර්ණ කථාව මෙසේය.**

ඊයේ දෙසැම්බර් 05 වන උදෑසන ශ්‍රී ලංකා ආණ්ඩුව බෙදුම්වාදයට සහ ත්‍රස්තවාදයට එරෙහිව මෙහෙය වූ සාම සංග්‍රාමයේ දෙවන අදියර ජයග්‍රාහිව නිම කළ බව මා ඔබ සැමට සැළ කර සිටිනවා. මීට මොහොතකට පෙර හමුදාපතිවරයා ඇතුළු ත්‍රිවිධ හමුදාවේ හමුදාපතිවරුන් සහ පොලිස්පතිවරයා මට ඒ පුවත දැනුම් දුන්නා.

මේ ඓතිහාසික උතුම් පුවත ඉමහත් ආඩම්බරයෙන් මෙන්ම නිහතමානිව අපි බාර ගනිමු.

අද සිට එළඹෙන නව යුගයේදී අප රටේ ජීවත්වන සියලුම මිනිසුන්ට සමාන අයිතීන් ඇති නිදහස් සමාජයක ලාංකික පුරවැසියන් හැටියට සාමය සමෘද්ධිය කරා ගමන් කිරීමට අවශ්‍ය මාර්ගය අප එළිපෙහෙළි කර ඇත. සියලු ජන කොටස්වලට අයත් සියලු දෙනාට සහෝදර ලාංකිකයන් හැටියට එක්සත් රටක් තුළ ජීවත් වීමේ හැකියාව අප නැවත ජයගෙන ඇත.

අප - සටන එක් ජන කොටසක් විසින් තව් ජන කොටසකට එරෙහිව කළ සටනක් නොවේ. අප ජයග්‍රහණය එක් ජන කොටසක් විසින් තවත් ජන කොටසක් යටපත් කිරීමක්ද නොවේ.

අප සටන් කළේ අප රට බෙදීමට එරෙහිවයි. දෙමළ ජනතාවගේ අයිතිවාසිකම් ලබා දෙනවාය කියමින් ඔවුන්ගේ සියලු අයිතීන් උදුරාගෙන ඔවුන්ගේ මූලික නිදහස කෙළෙසූ බලකාමී ත්‍රස්තවාදයට එරෙහිවයි.

ඒ වගේම අප සියලු දෙනාගේම ජීවිත වසර 12 ක් තිස්සේ අන්ත පරිහානියට ඇද දැමූ එල්.ටී.ටී.ඊ ත්‍රස්තවාදයට විරුද්ධවයි.

අප සංග්‍රාමයේ පළමු අදියර වූයේ, බෙදී, වෙන්වී තිබූ දේශය එක් සේසත් කිරීමට අවශ්‍ය වන මූලික කරුණ ඉටු කිරීමයි. බෙදී තිබුණ රට එක්සත්, කිරීම පිණිස., භේද වී සිටි සියලු ජන කොටස් එක ජනතාවක් සේ එකතු කිරීම අපගේ පරම අභිලාෂය විය. ඒ සඳහා භේද කරමින් සිටි සියලු සංවිධාන සමග අප සාමකාමීව සංවාද ඇරඹුවා. ද්‍රවිඩ ජනතාව සමග ද්‍රවිඩ ජනතාව නියෝජනය කරන එල්.ටී.ටී.ඊ.ය මෙන්ම, අනික් ද්‍රවිඩ සංවිධාන සමග අප රජය

සාම මාවතට පිවිසෙන්නට විශාල පරිශ්‍රමයක් දැරුවා. දෙමළ ජනතාවගේ ප්‍රශ්න නිවැරදිව වටහා ගත්තා. ඔවුනට ඓතිහාසිකව ඇතිවූ යම් අසාධාරණයටද යුද්ධය නිසා ඇති වූ අපහසුතාවනටද ස්ථාවර විසඳුම් ලබා දීම සඳහා පියවර ගණනාවක් අප අවංකව යොදවා ඇත. එහි උච්චතම අවස්ථාව අප රජය විසින් ඉදිරිපත් කර තිබෙන බලය බෙදා හැරීමේ යෝජනාවලියයි.

අප සාම ක්‍රියාදාමය සෑම අතින්ම ජයග්‍රහණය කර එක අංශයකින් පමණක් පරාජය විය.

මගේ සහෝදර සිංහල ජනතාව සාම ක්‍රියාදාමය පිළිබඳ දක්වන අනුග්‍රහය සහ කැපවීම අපගේ විශාලතම ජයග්‍රහණය යැයි කියා මා නැවත, අදත් මතක් කළ යුතුයි.

දෙමළ ජනතාවගේ අති බහුතරයක්, ඔවුන්ගේ සියලු පක්ෂ සහ සංවිධානත්, අප සාම ක්‍රියාදාමයට දක්වන සහයෝගය අපගේ ඊළඟ ජයග්‍රහණයයි.

මුස්ලිම්, මැලේ, බර්ගර් ජනතාව සහ ඔවුන්ගේ පක්ෂ සහ සංවිධානවල එකඟතාව තවත් ජයග්‍රහණයකි.

ලංකාව කොන්කර අපගේ ජනතාව ම්ලේච්ඡයන් හැටියට සලකා විවේචනය කරමින් සිටි ජාත්‍යන්තර ප්‍රජාව, අද අපගේ සාම ක්‍රියාදාමයට පූර්ණ සහයෝගය දක්වා ඇත. ලොව සෑම තැනින්ම ගලා එන ප්‍රශංසාවද සියලු ප්‍රධාන ජාත්‍යන්තර සංවිධානවලින් අප රජයට ලබාදෙන ප්‍රමුඛස්ථානය ද තුළින් නැවත අප ලාංකිකයනට ප්‍රෞඪ ජාතියක් හැටියට ලොව ඉදිරියේ නැගී සිටින්නට හැකිවී ඇත.

සාම ක්‍රියා දාමයේ එකම පරාජය, එල්. ටී. ටී. ඊ. ය එයට එරෙහිව එල්ල කළ ප්‍රහාරයයි.

අප සාම ක්‍රියාදාමය, සාම සංග්‍රාමයක් බවට පත් කළේ ඒ ප්‍රහාරය පරාජය කිරීමට පමණයි. එහි පළමුවන අදියර අද අප ජයගෙන ඇත. එහෙත් යුද්ධය නිම කර, ස්ථාවර සාමයක් බිහිකර ගැනීමට තව දීර්ඝ ගමනක් අප යායුතුය.

ඒ සඳහා අවශ්‍ය වන දේශපාලන වැඩ පිළෙවෙළ අප රජය ඉදිරිපත් කර ඇත. එයට එකඟ නොවෙමින්, යුද්ධ කරන කොටස් තවමත් ඇත්නම්, ඒ අභියෝගයට මුහුණ දීමට සූදානම් පරිදි, අප හමුදාවන් සෑම ආකාරයෙන්ම අප රජය විසින් සන්නද්ධ කරනු ලැබ තිබේ.

යුද්ධමය ජයග්‍රහණ ලබා ඇති මේ අවස්ථාවේදී අප යුද්ධයෙන් උද්දාම නොවී මිනිස්කමින් අප හදවත් පුරවා ගනිමු. කොතරම් මිලේච්ඡ වුවත් සියලුම සටන් අවසානයේදී ජය ගන්නේ මිනිසත්භාවය තුළින් බව අපි මතක තබා ගනිමු.

මාගේ සිංහල ජනතාවගෙන් අප රජය වෙනුවෙන් මා අද ඉල්ලා සිටින්නේ ඔබ මෙතෙක් දෙපැත්තේම අන්තවාදීන් ඉදිරියේ දැක් වූ ශ්‍රේෂ්ඨ ඉවසීම සහ මිනිස්කම තවදුරටත් ආරක්ෂා කරන ලෙසයි.

මාගේ දෙමළ ජනතාවට සිදුවී ඇති අසාධාරණකම්වලට අවංකව විසඳුම් සෙවීමට අප රජය ඉදිරිපත් වී තිබෙන බව ඔබ ඉතා හොඳින් දන්නවා.

මෙතෙක් කල් එවැනි රජයක් නොතිබුණු නිසා, ඔබ සමහරුන්ගේ ත්‍රස්තවාදී ආධිපත්‍යයට ගොදුරු වන්නට යෙදුණත්, අද ඔබට එයින් මිදෙන්නට අවස්ථාව ලැබී ඇත. ඔබගේ අහිංසක දරුවන්ගේ ලේ ගංගාවල් තුළින් කළ ජීවිත පූජා තව දුරටත් පවත්වන්නට අවශ්‍ය නැත. ප්‍රෞඪ ජාතියක් ලෙස නැගී සිට, නිදහස් ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් ශ්‍රී ලංකාවක් තුළ ඔබටත්, ඔබ දරුවන්ටත් උතුම් මිනිසුන් හැටියට අප සියලුදෙනා සමගම සහෝදරත්වයෙන් ජීවත් විය හැකි රටක් ගොඩ නගා ගනිමු.

යාපාපටුන අත හැර ගිය සියලු පදිංචිකරුවනට නැවත යාපනය ප්‍රදේශයට පැමිණ, නිදහසේ ජීවත්වීමට අප ආරාධනය කරනවා. ඒ සඳහා අවශ්‍ය සියලු සිවිල් සේවාවන් අප සූදානම් කර ඇති අතර, ඔබේ ආරක්ෂාව ද සහතික කරනවා.

එල්.ටී.ටී.ඊ යේ සාමාජිකයනට මා ආරාධනය කරනවා, අප රජයට බාර වෙන ලෙස. ඔබගේ ආරක්ෂාව අප සහතික කරනවා

දෙමළ ජනතාව නියෝජනය කරන පක්ෂවලට සහ සංවිධානවලට මා අරාධනය කරනවා මෙතෙක් ලබාදුන් සහයෝගයට වැඩියෙන් පැහැදිලිව හා අභිනව අප රජයේ සාම ක්‍රියා දාමයට සහයෝගය දෙන ලෙස.

දැන් මා විශේෂයෙන් කිව යුතු දෙයක් තියෙනවා. ශ්‍රී ලාංකික ත්‍රිවිධ හමුදාවේ සහ පොලිස් හමුදාවේ සියලු සෙබළුන් නම් තමන්ගේ වටිනා තරුණ ජීවිත රට හා ජනතාව වෙනුවෙන් පූද කරමින්, ඉටු කළ සහ ඉටු කරන අභීත, අති උත්තම මෙහෙය පිළිබඳ

අප රජයත්, මුළු මහත් ලාංකීය ජනතාවත් සදා ණය ගැතිව, අප කෘතඥතාව හද පත්ලෙන් ඔබ සැමට පුද කරනවා.

හමුදාවනට ශ්‍රේෂ්ඨ වූත් අභීත වූත් නායකත්වය ලබා දුන් සන්නද්ධ හමුදා හතරේ නායකයනට මාගේත්, රජයේත්, ජනතාවගේත් ඉමහත් ගෞරවය හා කෘතඥතාව පුද කරනවා.

මේ සැම සටනකදීම විශාල කැපවීමකින් ක්‍රියා කරමින්, අභීත නායකත්වයක් ලබාදුන්, අනුරුද්ධ රත්වත්තේ අමාත්‍යතුමාට මා පෞද්ගලිකවත්, රජය හා ජනතාව වෙනුවෙනුත් මාගේ උපහාරය දක්වනවා.

## අමරණීය සේවයට සදා ණය ගැතියි

රටේ එක්සත්භාවය සාමය හා සාධාරණත්වය වෙනුවෙන් තම දරුවන් පූජා කරන මා ආදරණීය මවු පියවරුන්ගේ අමරණීය සේවයට අප සියල්ලන්ම සදා ණය ගැතියි.

එක්සත් ශ්‍රේෂ්ඨ ලංකාවක් බිහි කිරිමේ විරුවන් ඔබයි. කියන අවබෝධය තුළින් ඔබේ දුක් කඳුළු පිස දමා තවත් මවුපියවරුනට මෙවැනි ඉරණමක් අත් නොකරන, සාමකාමී, නිදහස් රටක් අපි බිහි කරමු. සිංහල, දෙමළ, මුස්ලිම්, ඇතුළු අප සියලූ මවුවරුන්, පියවරුන්, සහෝදර, සහෝදරියන් සහ දරුවන් එකට එකතුව ඒ ලස්සන සිහිනය උදා කර ගනිමු.

# චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ ජීවිතයේ සිහිවටන

☼ වර්ෂ 1945 ජූනි මස 29 වැනි දින කොළඹදී උපත ලැබුවාය.

✳ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ පියා - දිවංගත අගමැති එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක ශ්‍රීමතාය. එතුමා 1956 - 1959 දක්වා ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍ය ධූරයට පත් විය. 1959 සැප්: 25 දා ඝාතනයට ලක්ව අවසන් හුස්ම හෙළිය.

✳ මව සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය වූවාය. ලෝකයේ ප්‍රථම අග්‍රාමාත්‍යවරිය වීමේ ගෞරවය ඇයට හිමි විය. 1960 - 1965 දක්වාද, 1970 - 1977 දක්වාද, 1994 නොවැ: 13 වන දින සිට මේ දක්වාද වත්මන් අග්‍රාමාත්‍යවරිය ලෙස කටයුතු කරන්නීය.

✳ 1972 - 1976 දක්වා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂිකා තනතුර හෙබවූවාය.

✳ 1974 ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කාන්තා පෙරමුණේ විධායක කාරක සභික තනතුර ඉසුලූවාය.

✳ 1976 - 1977 ජනාවාස කොමිෂන් සභාවේ සභාපතිනිය ලෙස කටයුතු කළාය.

✳ 1976 - 1979 ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ උපදේශිකා තනතුර දැරුවාය.

✳ 1977 සිට 1985 දක්වා "දිනකර" සිංහල දිනපතා පුවත්පතේ සභාපතිණිය හා කලමනාකාර අධ්‍යක්ෂකවරිය වූවාය.

✳ 1978 පෙබරවාරි 20 වැනිදා විපක්ෂ දේශපාලන නායකයෙකු හා ජනප්‍රිය සිනමා නළුවකු වූ විජය කුමාරතුංග මහතා සමඟ විවාහය සිදුවිය.

* චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියට අවු: 15 ක් වයස යසෝදරා නම් දූවක් හා අවු: 13 ක් වයස විමුක්ති නම් පුතෙක් සිටීම.

* 1980 ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සමස්ථ ලංකා කාරක සභික හා විධායක කාරක සභාවේ කාරක සභිකයකු ලෙස කටයුතු කළාය.

* 1984 පිහිටුවාගත් ශ්‍රී ලංකා මහජන පක්ෂයේ උප සභාපතිනිය විය.

* 1986 ශ්‍රී ලංකා මහජන පක්ෂයේ සභාපතිනිය වූවාය.

* 1988 පෙබරවාරි 16 වැනිදා විජය කුමාරතුංග මහතා නාඳුනන තුවක්කු කරුවෙකුගේ වෙඩි පහරට ලක්වී ඝාතනයට ගොදුරු වීම.

* 1988 - 1989 ලංඩන් විශ්ව විද්‍යාලයේ පොදුරාජ්‍ය මංඩලීය අධ්‍යාපන ආයතනයේ පර්යේෂිකාවක ලෙසින්ද කටයුතු කළාය.

* 1991 "බහුජන නිදහස් පෙරමුණ" නම් දේශපාලන පක්ෂයක් බිහි කිරීම.

* 1992 අත්තනගල්ල ආසනයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රධාන සංවිධායක ලෙසද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මධ්‍යම කාරක සභික ධූරයටද පත් වූවාය.

* 1993 වසරේ බස්නාහිර පලාත් සභාවට ගම්පහ දිස්ත්‍රික්කයෙන් තරඟ කර වැඩිම මනාප සංඛ්‍යාවක් ලබා බස්නාහිර පලාත් සභාවේ මහ ඇමතිනිය ලෙස කටයුතු කළාය. ඊට අතිරේකව බස්නාහිර පලාත් සභාවේ නීතිය, සාමය, මුදල්, අධ්‍යාපන, රැකිරක්ෂා සහ සැලසුම් විෂයන් භාර අමාත්‍ය ධූරයද ඉසුලුවාය.

* 1994 පාර්ලිමේන්තු මහ මැතිවරණය මෙහෙයවූයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හා පොදු පෙරමුනේ නියෝජ්‍ය නායිකාව ලෙසය.

* 1994 - මහ මැතිවරණයට ගම්පහ දිස්ත්‍රික්කය තුළින් තරඟ කළේ අග්‍රාමාත්‍යධූර අපේක්ෂිකාව ලෙසිනි.

* 1994 අගෝස්තු 19 වැනිදා ශ්‍රී ලංකාවේ 11 වැනි අග්‍රාමාත්‍ය පදවියටත්, ලංකාවේ දෙවැනි කාන්තා අගමැතිනිය ලෙසත්, දස වැනි පාර්ලිමේන්තුවේ ශ්‍රී ලංකා අග්‍රාමාත්‍යවරිය වශයෙනුත් දිවුරුම් දී වැඩ භාර ගැනීම.

* 1994 නොවැම්බර් මස 09 වන දින පැවති ජනපතිවරණයෙන් විශිෂ්ට ජයක් අත්පත් කර ගනිමින් ශ්‍රී ලංකාවේ සිව්වැනි ජනාධිපති ධුරයට පත් වීම.

* වසර ගණනාවක් තිස්සේ භීෂණයේ අඳුරු පටලයෙන් වැසී තිබුන උතුරුකරයට සාමය උදා කිරීම සඳහා එඩිතර දේශපාලන නායකත්වයක් ලබාදි "රිවිරැස" මෙහෙයුමෙන් 1995 දෙසැම්බර් මස 05 වන දින එල්. ටී. ටී. ඊ. කොටි ත්‍රස්තවාදීන්ගේ බලකොටුව වූ යාපනය නගරය ශ්‍රී ලංකා ජනරජයට අත්පත් කර ගැනීම.

## අධ්‍යාපනය

* කොළඹ ශාන්ත බ්‍රිජට් කන්‍යාරාමයේ මූලික හා ද්විතීය අධ්‍යාපනය ලැබීය.

* පැරිසියේ සෝබෝන් විශ්ව විද්‍යාලයේ දේශපාලනය පිළිබඳ උපාධියක් ලැබීය.

* පැරිස් විශ්ව විද්‍යාලයේ කණ්ඩායම් නායකත්වය පිළිබඳ ඩිප්ලෝමා උපාධියක් ලබා ගෙන ඇත්තේය.

* එම විශ්ව විද්‍යාලයේ සංවර්ධන, ආර්ථික විද්‍යාව පිළිබඳව ආචාර්ය උපාධියක් සඳහා අධ්‍යාපන කටයුතු සපුරා ඇත.

* පැරිසියේ 'ලාමොන්ඩේ' පුවත් පතෙහි පුවත්පත් කලාව පිළිබඳව පුහුණුවක් ලබා තිබීම.

* නව දිල්ලියේ ශ්‍රී ජවහර්ලාල් නේරු විශ්ව විද්‍යාලයේ හා බ්‍රිතාන්‍යයේ 'බ්‍රැඩ්ෆෝර්ඩ්' විශ්ව විද්‍යාලයේ ආරාධිත දේශකයකු ලෙස කටයුතු කර ඇත.

* පාසැල් අවදියේ දී විද්‍යාලයේ විවාද කණ්ඩායමේ සාමාජිකාවක ලෙසින්ද ඉංග්‍රීසි නාට්‍ය කණ්ඩායමේ ලේකම්වරියක ලෙසින්ද කටයුතු කර ඇත්තේය.

* පෙරදිග නැටුම් හා චිත්‍ර ශිල්පය පිළිබඳව අධ්‍යාපනය ලබා ඇත්තේය.

* පාසලේ සිංහල පුවත්පතේ සංස්කාරක ලෙසද, කලා සංගමයේ හා සිංහල සාහිත්‍ය සංගමයේ ලේකම්වරිය ලෙසින්ද කටයුතු කර ඇත.

* සිංහල - ඉංග්‍රීසි - හා ප්‍රංශ භාෂාවන් පිළිබඳ මනා දැනීමක් ලබා තිබීම.

* රුසියානු - ජර්මන් හා හින්දි භාෂාවන් පිළිබඳ අවබෝධයක් ලබා තිබීම.

* ශ්‍රී ලංකාවේ දේශපාලන ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳව පර්යේෂණ කටයුතුවල නියැලී ප්‍රකාශන නිබන්ධනයක් නිමා කිරීම.

* ශ්‍රී ලංකාවේ සමූපකාර ව්‍යාපාරය, ශ්‍රී ලංකාවේ ඉඩම් හා කෘෂිකාර්මික ප්‍රතිසංස්කරණය, 1984 සිට ශ්‍රී ලංකාවේ ආහාර ප්‍රතිපත්ති හා ව්‍යුහය පිළිබඳව පර්යේෂණයන්හි නියැලෙමින්, වයිඩර් ආයතනයේ අනුග්‍රහයෙන් ප්‍රකාශන කිපයක් කිරීම.

192

REFERENCE

11 DEC 2006

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය



විවිධ ග්‍රන්ථ රැසක
කතුවරයකු වූ
සුනිල් මද්දුමගේ කලා ශිල්පියා
සංගීතය, නැටුම්, නාට්‍ය හා
ලේඛන කලාව පිළිබඳව
ප්‍රවීණ දැනුම් සම්භාරයක්
හිමිකර ගත් අයෙකි.
සංගීතය පිළිබඳව ද
කෘතහස්ත ගුරුවරයකු ලෙස
එකී විෂයය පිළිබඳව
ශාස්ත්‍රීය ග්‍රන්ථ කීපයක්ම එළි
දක්වා ඇත.
කවියෙකු, ගීත නිබන්ධකයකු,
නාට්‍ය ශිල්පියකු වශයෙන්
විවිධ කුශලතා රැසක්ම
හිමිකරගත් මෙම ශිල්පියා
ශ්‍රේෂ්ඨ ජන නායිකාවක වූ
ශ්‍රී ලංකා ජනාධිපතිනි, ගරු
චන්ද්‍රිකා බණ්ඩාරනායක
කුමාරතුංග මැතිණියගේ
ජීවන චරිතය අළලා "දිරිය
දියණිය" නම් ග්‍රන්ථය රචනා
කොට ඇත.
ලේඛකයෙකු සතු
ස්වාධීනත්වයට සම වැදෙමින්
නිදහසේ, ඉතා මැනවින්
සුපරීක්ෂාකාරීව කරුණු
ගොනුකර මෙම ගත රචනා
කිරීම පිළිබඳව මෙහි
කතුවරයාට කෘතවේදී
පුරවැසියන්ගේ නොමඳ
පැසසුම ලැබිය යුතුය.

ධර්මසිරි ගමගේ.
12.01.96



සොබා දහම හද බැඳගත්,
මනරම් කඳු යායකින් වටවුන,
බදුල්ල දිස්ත්‍රික්කයේ, වැලිමඩ,
දඹවින්න කෝරළයේ,
රත්කැරව්ව ගම් පියසේ
ජන්ම දයාදය ලබා
රත්කරව්ව මධ්‍යම මහ විදුහලෙන්
මූලික අධ්‍යාපනය ලැබූ
රත්නායක මුදියන්සේලාගේ
අබේරත්න මහතා,
පාසල් අවධියේ සිටම
කලා විෂයයන් කෙරෙහි
සමීපතාවයක් හා ඇල්මක්
දැක්වූ අයෙකි.
මේ මහතා විසින්,
ශ්‍රී ලංකා ජනාධිපතිනි
ගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග
මැතිණියගේ ජීවන චරිතය අළලා,
ලියැවුණු "දිරිය දියණිය" ගත
එළි දක්වන්නට අත්වැලක් විය.
යටමන් අගනුවරට පැමිණ
වෙළඳ ව්‍යාපාරිකයකු වශයෙන්
කොට්ටාව, කටුකුරුන්ද, ග්‍රාමය
තම නිවහන කොට ගනිමින්
ප්‍රදේශයේ ආගමික, අධ්‍යාපනික,
සමාජයීය, යුග මෙහෙවරට,
නිරතුරුවම ඇප
කැප වුන අධිෂ්ඨාන ශක්තියෙන්
තම ජීවන මං පෙත
විවර කර ගත් උදාරගති පැවතුම්
තුරුළු කර ගත්තෙකි.

බර්ටි ගලහිටියාව
24.1.96

ISBN - 955-95541-5-8